වසර 2500 පසු
මේ ගෞතම බුද්ධ ශාසනයේ නැවත පිබිදීමයි.

# සත්‍ය ධර්මය අවදි විය

(තෙවන වෙළුම)

# නිවැරදි නිවන් මඟ හමුවිය

## සියලුම හිමිකම් ඇවිරිණි

මුදලට විකිණීම සඳහා හෝ ලාභ ලැබීම පිණිස වන සියලුම ආකාරයේ උපුටා ගැනීම්, නැවත පළකිරීම් සපුරා තහනම් ය. මෙම දහම් පොත ධර්ම දානයක් ලෙස බෙදා හැරේ.

**නිවැරදි නිවන් මග හමුවිය**

බුද්ධොත්පාදෝ ධර්ම දේශනා ශ්‍රවණයට
https://youtube.com/channel/ucwms400m8EsZc9foKtEajg

අන්තර්ජාල ශ්‍රවණයට - website
buddhothpado.com

බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය - 2022 දෙසැම්බර්

ධර්ම ග්‍රන්ථය පිළිබඳ
විමසීම් Email: thanujafernando1975@gmail.com
Tel 077 2246430

පරිගණක මුද්‍රණ සැකසුම **වාක්‍යා රූ**
අංක 42/8, මකුළුදූව, පිළියන්දල.
දුරකථනය 011 2 708377

මුද්‍රණය **K.S.U. ග්‍රැෆික් (පුද්) සමාගම**
අංක 810, රාජගිරිය පාර, රාජගිරිය
දුරකථන 011 2884701



# පෙරවදන

මෙය ඇසෙන ඔබ මහා භාග්‍යවන්තයි. ඔබ කොහේද යන්නේ, මුලාව රැවටීම හරි භයානකයි. සත්‍ය කුමක්ද? ඔබ සංසාර චක්‍රයක අතරමං වෙලා. විටෙක ඔබ සතුටින්, විටෙක ඔබ දුකෙන්, සැපේ දුකේ දෝලනය වන මේ ජීවිතය හරි භයානකයි. ඔබ සත්‍ය දන්නේ නෑ.
ඒ සත්‍ය ඔබ අවබෝධ කළ යුතුයි. ඔබ සංසාර දුකින් මිදෙන කතාවයි මේ.

මෙම දේශන මාලාව මඟින් ඔබට සත්‍ය ධර්මය අවබෝධය සඳහා යම්කිසි උපකාරයක් ලැබෙනවා. සියලු දුකින් මිදෙන තැන හමුවන ඒ 'සදාතනික සුවය' මෙම දේශන මාලාව මඟින් අත්දකින්නට ඔබට ද හැකියාව ලැබේ. බාහිර ඇත්ත කරගෙන සිටින තාක් ඔබ ඉන්නේ මිත්‍යාදෘෂ්ටියේමයි. ඒතාක් ඔබට දුක උරුමයි. සිතද මායාවක් වන තැන සිතේ මායාවෙන් මිදුනු තැන,
බාහිර ඇත්තක් නොවන තැන
සිතද සත්‍යයක් නොවන තැන
ඒ සිතෙන් මිදෙන තැන
ඒ බාහිර ඇත්තක් නොවන තැන
'අජ්ජද්ධ බහිජ්ජා' කියන තැන
අන්ත දෙකම මිදුන තැන, එනම්,
ධර්මය තුළ සඳහන් වන නාම, රූප අන්ත 2න් මිදීමයි නිවන් මග වන්නේ.
මෙලොව උපදින සියලු සත්ත්වයෝ නිවනින්මයි සැනසීම ලබන්නේ.
ධර්මය නම් ධර්මතාවයයි. ඒ පටිච්චසමුප්පාද ධර්මයයි. එනම් ඉදප්පච්චතාවයයි. එනම් දෙයක් නැති බවයි. දෙයක් නැති බව බුද්ධ ස්භාවයයි. දෙයක් නැති තැන චෙතෝවිමුක්තියයි. එනම් අනිමිත්ත, ශුන්‍යත, අප්පුනිත චේතොවිමුක්තියයි. ඒ බුද්ධ

ස්වභාවයයි. මේ දහම අවබෝධ වේ නම් ඔබ අප සියලු
දෙනාම ඒ බුද්ධ ස්වභාවටයි අවදි වෙන්නේ. ඒ බුද්ධ යනු ශූන්‍යතාවයි.

“නිස්සත්වෝ නිස්ජීවෝ ශූන්‍යයෝ”

පහන නිවීගිය පසු ගිය තැනක් කොහින්ද? ඒ නිවීමමයි නිවන.
ඒ කෙලෙස් ගින්නේ නිවීයාමයි. ඒ සසර ඕඝයේ නිමාවයි.
ඒ විඤ්ඤාන නිරෝධයට ගිය තැන සියලු දුකෙන් මිදීමයි.

විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතෝ පහං
එත්ථ ආපෝච පඨවි ච - තේජෝ වායෝ න ගාධති
එත්ථ දීඝඤ්ච රස්සඤ්ච - අණුං ථූලං සුභාසුභං
එත්ථ නාමඤ්ච රූපංච - අසේසං උපරුජ්ජති
විඤ්ඤාස්ස නිරෝධෙන - එත්තෙ තං උපරුජ්ජන්ති

සිතෙන් මිදෙන මඟ
නිවන් දකින මඟ
දුකින් මිදෙන මඟ
එයයි නිස්සරණ මඟ

නිවැරදි නිවන් මඟ ඔබටත් හමුවේවි. ධර්මය සොයන්නාට
බුදුන් හමු වේ. බුද්ධ යනු සොබාදහමයි. ප්‍රායෝගික පුහුණු විය
යුතු ආකාරය හඳුනාගෙන අවබෝධ කළ යුතු ධර්මයකි.

**බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ**



# හැඳින්වීම

මේ ගෞතම බුද්ධ ශාසනය තුළ අපි හැමදෙනාටම අවශ්‍ය වන්නේ නිවීමක්, සැනසීමක්, දුකින් මිදීමක්. නිරන්තර පවත්නා රාග, ද්වේශ, මෝහ. නිවා ගැනීමයි නිවන කියන්නේ. කිසාගෝතමී, පටාචාරා, අම්බපාලි වැනි බොහෝ පිරිස් බුදුරජාණන් වහන්සේ අභියස ඒ ගිනි නිවා සදාකාලික සැනසීම ලැබුවා.

අද බෞද්ධ සමාජයට මේ නිවීම සැනසීම අහිමි වෙලා බොහෝ පිරිස් නොයෙකුත් රාමුවලට සිරවී, ග්‍රන්ථ ධූරයට පමණක් සීමාවෙලා සිටින්නෙ. ඒ තුළින් සත්‍ය දැකීම අපහසුයි. විදර්ශනා ධූරය සමාජයෙන් ඈත් වී ඇති මෙවන් යුගයක නැවතත් ඒ ගිලිහී ගිය බුද්ධ දර්ශනය, විදර්ශනා ධූරය තුළින් ම ඉස්මතු වෙනව. ඒ අති ගම්භීර, නිර්මල, පරම සත්‍යය අපට අහන්න ලැබෙනවා. මේ නිවැරදි බුද්ධ දර්ශනය පෙර නොඇසූ විරූ දහම, ධම්ම චක්ඛුෂය අපි අවබෝධ කරගත යුතු වෙනව. මේ සත්‍ය දර්ශනය බාහිරින් හමුවන දෙයක් නොවේ. බාහිර ඇත්ත වූ තැන පවතින්නෙ ආත්මීය ස්වභාවයක්.

මේ අනාත්ම ධර්මය උතුම් බුද්ධ දර්ශනය ‘බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ මාලාව’ තුළින් ඔබට කියවන්න ලැබෙනව. එය හොඳින් කියවන්න. ධාරණය කරගන්න. ඔබට සත්‍ය අවබෝධයට මෙය උපකාරී වේවි. මේ අප ගන්නා උත්සාහයේ එක් අවස්ථාවක් පමණි.

**අප කල්‍යාණ මිත්‍ර මෙහෙණින් වහන්සේ**

## පුණ්‍යානුමෝදනාව

මේ සත්කාර්යය සඳහා නන් අයුරින් උපකාර කළා වූ සියළුම දෙනාට ද උතුම් වූ ධර්ම දානමය කටයුත්තට මූලික වූ එංගලන්තයේ පදිංචි දිනූෂා මහත්මියගේ මෑණියන් වන එන්.ආර්. නෝරගල්ල සහ පියාණන් වන ඩබ්ලිව්.එම්.බී. කරුණාතිස්ස යන අයට ධර්ම දානය තුළින් ජනිත වන්නා වූ කුසලය නිදුක් නිරෝගී සුවපත් භාවය පිණිසත් මේ ජීවිතය තුළ දී ම චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධය පිණිසත් මෙම ධර්ම දානමය කුසලය හේතු වේවා.

“සබ්බදානං ධම්මදානං ජිනාති”



## පිදුම



සම්බුදු සසුන මේ ලක් පොළොවෙහි පවතින තාක් මේ දහම් අමා ගඟ ලෝ සතුන්ගේ සිත් සනහමින් නොසිඳී ගලා යේවා.

මේ ගෝර කටුක භයානක සංසාරයේ බිය දැක, මේ ආත්මභාවයේ දී ම සසර දුකින් එතෙර වීමට අධිෂ්ඨාන කරමින් වීර්ය වඩමින් නිවන් මඟ ගමන් කරන්නට සියලු ලෝක සත්වයාට මේ ධර්මය උපකාර වේවා. තම තමන්ට වැටහෙන ප්‍රමාණයට ජීවිතවලට ගලපා ගනිමින්, මෙහි සඳහන් ධර්ම කාරණා තුළින් නිවන් මාර්ගයට ම යොමු වේවා. දහම් ඇස පහළ කරගැනීමට උපකාර වේවා.

# පටුන


| | | |
|---|---|---|
| 01 | නිවැරදි නිවන්මග හමුවිය | 11 |
| 02 | නිවැරදි නිවන් මග හමුවිය | 24 |
| 03 | නිවැරදි නිවන් මග හමුවිය | 47 |
| 04 | නිවැරදි නිවන්මග හමුවිය | 54 |
| 05 | නිවැරදි නිවන් මග හමුවිය | 68 |

# 01

# නිවැරදි නිවන්මග හමුවිය

***උපාසිකාව:*** තෙරුවන් සරණයි ආර්යන් වහන්ස කතා කරන්න පුලුවන්ද?

***ආර්යන් වහන්සේ:*** කියන්න

***උපාසිකාව:*** ඔබ වහන්සේගේ දේශනා මම ගොඩක් අහනවා, මම අවුරුදු 70 ක අම්මා කෙනෙක්

කාලයක් මම වෙන වෙන දේශනා ඇහුවා. බණ ඇහුවා, භාවනා වලට ගියා, ඔබවහන්සේ කියන විදිහට හුස්මරැල්ලෙම ඉන්න බැලුවා. හැබැයි කවදාවත් මට හුස්මරැල්ලේ සමාධියක් නම් ආවේ නෑ. හැබැයි අර සතිය සති පාසල කියන එකට සම්බන්ධ වෙලා හිටියා නිතරම සතිය ගැන නම් අපි බැලුවා. කරන කරන වැඩේ දී කන බොන කොටද, නාන කොටද දත් මදින කොටද, සක්මනේදී ද, සක්මන හුඟක් මම එතකොට කළා. කකුලේ ආබාධයක් නිසා දැන් හුඟක් සක්මන් කරන්න අමාරුයි. සමහර වෙලාවට මම යන හැමතැනදීම වාහනයක සිටියත් ඒකේ අර වයිබ්රේෂන් එකද ඒ අවස්ථාවල මම සතිය පිහිටෙව්වා. ස්වාමීන්වහන්ස, ෆෑන් එකක හුළඟක් වැදුනත් වතුර රස්නයද, සීතලද, ශබ්දයද හැබැයි ඉතිං අර ගොඩක් අර අඹ ගහ කිව්වට අඹ ගහ නොවෙයි, පොත කිව්වට පොත නොවෙයි කියල ඔබ වහන්සේ කීවට ඒක අර අපි හිතට කාවද්ද ගන්න බලනවා උනාට ආර්යයන් වහන්ස, මෙතන මේ පොතක් තියෙනවා නේද කියලා හිතෙනවා. මම ඉස්සර ඉඳන්ම කරන්නේ ගහ දිහා බලාගෙන ගහ කුඩු කරනවා හිතෙන් ගහ කුඩුකරලා ගහ පුච්චනවා කියන්නේ දුම යනවා, කොළ ගොඩෙත් දුම යනවා. එතකොට ඒක මම අහල තියෙන විදියට සුද්ධාෂ්ඨකද කියලා එහෙම හිතුවා. එතකොට මෙයත් උඩට පිච්චිලා දුම්

වෙලා යන්නේ මේ තියෙන සුද්ධාෂ්ඨක වශයෙන් නේද?. එතකොට ගිණි ගොඩයි, ගහද, කොළ රොඩුද මිණිය පුච්චන එකද ඔක්කෝම එකක් නේද කියන එක මම එහෙම බැලුවා. ඒක හරිද දන්නේ නෑ ආර්යන් වහන්ස, මට ඔබ වහන්සේගෙන් මොන මොනව හරි උපදෙස් ටිකක් ලැබෙනවනම් හොදයි.

**ආර්යන් වහන්සේ:** මේ අම්මා දැන් ඔය කියපුවා කෙසේ වෙතත් අම්මා හිතන්න ඕනි සිතුවිලි කියලා.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන්වහන්සේ:** අපිට මේ සිතුවිලි වලින් එලියට යන්න බැරි වෙයි

**උපාසිකාව:** එහෙමයි

**ආර්යයන් වහන්සේ:** අපේ ඇහැ පේන්නේ නැත්නම් වර්ණ කථාවල් නෑ. අපිට කන්ඇහෙන්නේ නැත්නම් අපිට ශබ්ද කථාවකුත් නෑ. අපිට ඔය එලියෙන් කියන එකක්වත් හම්බවෙන්නේ නෑ. ඇස් පේන්නේ නැත්නම් තේරුනානේ?

**උපාසිකාව:** ඔව්. එහෙමයි එහෙමයි ඔබවහන්සේගේ දේශනාවල ආර්යන් වහන්ස මම එකම දේශනාව හතර පස් සැරේ අහනවා සමහර දේශනා හත් අට සැරේ අහනවා. පොතක් අරගෙන ලියනවා දේශනාව තව සැරයක් අහන වාර ගනන එතන ලියනවා. මේක තව සැරයක් අහන්න ඕනනම් තරු ලකුණ දානවා. එහෙම කර කර ආයේ අහනවා. මේ වෙලාවේ දී අහල ඒ ටික මට තේරුනේ නැත්නම් මම ආපස්සට අරගෙන ආයිත් ඒ කොටස අහනවා.

**ආර්යන්වහන්සේ:** ඒක හොදයි

**උපාසිකාව:** එහෙම තමයි මම කරන්නේ

**ආර්යන්වහන්සේ:** හැබැයි අම්මා ඉන්න දෘෂ්ඨියෙන් අම්මා අයිනට වෙලා ඉන්න ඕනි. ඒ කියන්නේ අම්මට තියෙනවා ඉබේම වැටුණු දෘෂ්ඨියක් මේ සිතුවිලි කියන එකට තාම අම්මා ගිහිල්ලා නෑ. ඔක්කොම තියෙන්නේ සිතුවිලි.පඨවි කියන්නේ සිතුවිල්ලක්, දැන් විඤ්ඤාණයෙන්නේ මේ හැමදේම දැන ගන්නේ.

**උපාසිකාව:** එහෙමයි



**ආර්යන්වහන්සේ:** එහෙනම් විඤ්ඤාණය කියන්නේ මේ ශබ්ද වර්ණ එකතු වෙච්ච එකක්නේ. එහෙම ඒවා බාහිර කොහේවත් නෑ. දැන් අපි දකින්නේ පොතක්, මේසයක්, ඇඳක්, පුටුවක් ඕනම දෙයක් තද ගතිය කිව්වත් උණුසුම කිව්වත් සීතල කිව්වත් මේ හැම දේකම රෑපයකුයි ශබ්දයකුයි තියෙනවා. ඇහැට එන්නේ වර්ණනේ, කනට එන්නේ ශබ්දනේ, එතකොට නාසෙට ගන්ධය, කයට උණුසුම, සීතල, තද ගතිය මුලු හන්කඩේටම තියෙන්නේ.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන්වහන්සේ:** දැන් මෙවයින් එන ඒවට හැර වෙන මොකුත් එන්නේ නෑනේ අපිට

**උපාසිකාව:** එහෙමයි ආර්යන්වහන්ස

**ආර්යන්වහන්සේ:** මේ ලෝකේ ඉපදුනාට පස්සේ පුංචි දරුවට ඔය ශබ්ද වර්ණ එකතුවෙන එකනේ ඔය ප්‍රකට වෙන්නේ. ඊට අමතරව උණුසුම, සීතල, තද ගතියත් එකතු වෙනවා. පටිච්චසමුප්පන්න වෙනවා කියන්නේ ඕවා එකතු වෙනවා කියන එක. ඒවා එකතු වෙලා තමයි අපි ඔය සංඛාර කියන්නේ සකස් වෙන එක. ඒ කියන්නේ මේ දැන් අම්මා කියන හැඩතලයට අම්මා කියන ශබ්දය එකතු වෙනවා. ඇමෙරිකාවේ ගිහින් තිබ්බොත් "මදර්" කියන ශබ්දය ඒ හැඩ තලයට එකතු වෙනවා. චීනෙට ගිහින් තිබ්බොත් ඒ හැඩතලයට ඒ ශබ්දය එකතු වෙනවා. එතකොට මේ ශබ්ද වර්ණ එකතු වෙන එකක් තමයි අපි මේ "චිත්තය" කියන්නේ. දැන් මේ පැත්තෙන් අන්නාසි කිව්වොත් ඔය පැත්තට අන්නාසි ගෙඩියක් මැවෙනවා. එතකොට රූපයක් හැදෙන්නේ කොහොමද? සිතේ මේ ශබ්දවලට රූප තියෙනවා. ඕක තමයි අපි මේ චිත්තය කියන්නේ ඒ කියන්නේ අපි චිත්තාරෝපණය කියන්නේ ඔය හුස්ම වැටෙනකම් ආශ්වාශ ප්‍රශ්වාශ වෙනකම් මේ ''ස්පාක්'' වෙවී තියෙනවා. හැබැයි මේ මොනවද "ස්පාක්" වෙන්නේ එතනම එකතුවෙනවා. එතනම එකතුවෙලා එතනම තියෙනවා කියලා පෙන්වනවා මවලා. එතකොට මේක ඉපදුණ දවසේ ඉදලා වේගයෙන් සිද්ධ වෙනවා. හැම මොහොතෙම "ස්පාක්" වෙනවා එතකොට මේවා ආයතන විදිහට ආවොත් ශබ්දය ශබ්දයක් විතරයි වර්ණය වර්ණයක් විතරයි. හැබැයි ඒවා එකතු උනොත් ඇඳක්, පුටුවක්, මේසයක්, වගේ දෙයක් කියන්නේ, එතකොට දැන් මේ වෙලා තියෙන්නේ

මනෝ විඤ්ඤාණය කියන්නේ එතනම මේ බලන තැනම අපිට ආලෝක හැඩතලයත් එක්කම ශබ්දයත් එතනම තියෙනවා. එතන ඒ ශබ්ද වර්ණ එකතු වෙන එක තමයි බිත්තිය කියන්නේ, මේසය කියන්නේ එතකොට එළියේ එහෙම ඒවා නෑ. එළියේ තියෙන්නේ එක්කෝ වර්ණයක්.

**උපාසිකාව:** එහෙමයි ආර්යන්වහන්ස

**ආර්යන්වහන්සේ:** අපි හැම තිස්සේම දකින්නේ මේසයක්, පුටුවක්, ගහක් මේ ඔක්කොම සිතුවිලි. “චිත්තේන නීයති ලෝකේ” තමයි. අපිට මේ සිතුවිලි වලින් එළියට යන්න බෑ. ලෝකේ ජනගහනය කෝටි 800 ක් නම් ඒ කෝටි 800 යම සිතෙන් එළියට ගිහිල්ලා නෑ. ඔක්කොම හිත ඇතුලෙම තමයි ලෝක හදාගෙන ජීවත් වෙන්නේ. මේ දරුවා කියලා හිතනවා, මේ අම්මා කියලා හිතනවා, වාහනය කියලා හිතනවා, රතුපාට, කහ පාට කියලා හිතනවා ඉර කියලා, ඇමරිකාව කියලා ජපානය කියලා හිතනවා. ලෝකේ කියලා හිතනවා ඔක්කොම සිතුවිලි. ඔක්කොම ශබ්ද වර්ණ එකතුවෙලා ශබ්ද වර්ණ වේගයෙන් “ස්පාක්“ වෙනවා “සෙන්සස්“ ටික ස්පාක් වෙනකොට ඒ වේගය තුළ එතනම මැවෙනවා, එතනම ඒක ආරෝපණයක් වෙනවා. ඒකම එකතු වෙලා ආත්මීය දැණීමක්, අර මිලිවොට් 5 ක කරන්ට් එකක් කියපු එක ස්නායු පද්ධතිය ඔස්සේ යන කරන්ට් එක එතන තමයි අපිට ආත්මීය දැනීමක් ඇතිවෙලා තියෙන්නේ. අන්න “රූපන්තිකෝ ආයුසෝ රූපං” කිව්වේ ඒකයි. රුප්පණය වෙනවා ඉද්දෙනවා වෙනවා, “ස්පාක්” වෙනවා, “රූපන්තිකෝ ආයුසෝ රුප්පං” කිව්ව එකම තමයි අපි “ස්පාක්” වෙනවා කියලා කිව්වේ ඔය ඔක්කොම එකම දේ. බුදුන්වහන්සේ කියනවා “උප්ජිත්තති රූපන්තිති” ඔය ඔක්කොම එකම දේ උප්පත්ති ඉද්දෙනවා රුප්පනය වෙනවා කියන්නේ ඔය “ස්පාක්” වෙන එක. අර මොකක් හරි ශබ්දයක් ආවත් ඒ මොහොතේ “ස්පාක්” වෙනවා ටක් ගාලා දෙයක් වගේ දැනෙනවා. වර්ණයක් ආවත් “ස්පාක්” වෙනවා එතනම අපට අර චුන් වෙන ගතියක් තියෙනවා. ආත්මීය දැනීමක් තියෙනවා අන්න ඒ ස්භාවය ආත්මීය දැනෙන ස්භාවය ඒක තමයි “චිත්තාරෝපණය” කියන්නේ චුම්බක ආරෝපණයටනේ අර ගල් කැටයක් උඩ දැම්මාම බිම වැටෙන්නේ එහෙම නැත්නම් අර චුම්භක වලට මොනවා හරි ඇලෙන්නේ. එහෙම නැත්නම් විද්‍යුත් ආරෝපණය විද්‍යුතය කියන්නේ ඔය ඇගේ මයිල් එහෙම කෙලින් වෙන්නේ ඔය සමහර විද්‍යුතය තියෙන තැන්වල ඒ වගේ. දැන් මේ චුම්භක ආරෝපණය



කියන්නේ අපි මේ චිත්තාරෝපණය කියන්නේ ශබ්ද වර්ණ එකට එකතු වෙන එක. ශබ්ද වර්ණ උණුසුම සීතල තද ගතිය ඒ කියන්නේ ගන්ධය රසය මේ සේරම එකම වේගයක් තුළ එකට එකතු වෙලා දැනෙන එක ඒකයි, අපි අර පෙන්නන්නේ මේස පුටු ඇඳන් ගෙවල් දොරවල් ඉර හඳ සේරම තියෙනවා වගේ දැනෙන්නේ ඒක තමයි ආත්මය භවයක් තියෙනවා මම ඉන්නවා වගේ දැනෙන එක “සක්කාය දෘෂ්ඨිය”.

**උපාසිකාව:** ඔබ වහන්සේ දේශනා කරනවනේ අර කොලේ පුටුවක් ඇදලා මම ඒ දේශනාව දැන් මම හිතන්නේ පස් සැරයක් විතර ඇහුවා ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සේ:** අම්මා ඒ කොලේ ඇන්දට පස්සේ අපි මේක කියන්න හේතුව මෙන්න මේකයි.

ඒ කියන්නේ වෙනද විදිහටම පේනව කවදාවත් අන්ධ වෙන්නේ නෑ. වෙනද විදිහටම ඇහෙනවා බීරි වෙන්නේ නෑ, හැබැයි වෙනද විදියටම පේනවා ඇහෙනවා දැනෙනවා ඒ විදියටම ඒවා වෙනස් වෙන්නේ නෑ. හැබැයි මේ ධර්මය ගැන දැනගන්නකොට අවබෝධයක් ඇතිවෙනවා ඒ අවබෝධය තමයි මේ සේරම සිතුවිලි කියන එක.සිතුවිලි කියලා අවබෝධයක් ඇතිවෙනකොට බාහිරින් ඒවා හම්බවෙන්නේ නෑ. බාහිරත් නැති බව දකිනවා දැන් මේ අඹ ගහ කියන්නේ නෑනේ අඹ ගහ කියලා. අපි කියනවා අඹ ගහ කියලා, දැන් සුද්දේක් ඇවිල්ලා කියනවා “මැංගෝ“ කියලා, චීන ජාතිකයෙක් ආවොත් තව එකක් කියනවා දෙමළ ජාතිකයෙක් ඇවොත් තව එකක් කියනවා. ඇත්තටම එතන අඹ ගහක් නෑ. අපි පොඩි කාලේ දාගත්ත ශබ්දේ අපි ගහ කියලා හිතාන ඉන්නේ. අපි ඒ වගේම හිතනවා වටිනවා කියලා 5000 වටිනවා 500 ට වඩා, අපි හිතනවා රත්රන් වටිනවා යකඩ වලට වඩා, ඔය වගේ අපි හැම තිස්සේම ශබ්දයක් දාලා ශබ්දවලට වටිනාකමකුත් අපි හිතාන ඉන්නේ. ඉතින් අපිට අර ශබ්දය එනකොට අර වටිනාකමක් එනවා. ඇත්තටම මේ එකක්වත් බාහිර නෑ. මේ ඔක්කොම සිතුවිලි, අම්මා කියලා හිතනවා මගේ දරුවා කියලා හිතනවා මේ මගේ දරුවා නොවෙයි කියලා හිතනවා. සිතුවිලි අපි මේ හිතන එක විතරයි මේ තියෙන්නේ. ඒ කියන්නේ “මනසංච පටිච්ච ධම්මේසු උප්පජ්ජති මනෝ විඤ්ඤාණං“ කියන්නේ අපි දෙයක් කියලා ගත්තොත් පොතක් කියලා ගත්තොත් එහෙම දෙයක්

කොහෙවත් නෑ, ඒක තමයි මනෝ විඤ්ඤාණය කියන්නේ, ආයතන කියන්නේ චක්ඛු විඤ්ඤාණය, සෝත විඤ්ඤාණය, ඝාණ විඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය ඒ ආයතන විඤ්ඤාණ මොනවද කියලා දන්නේ නෑ. කණට ශබ්ද විතරයි, ඇහැට වර්ණ විතරයි, කණට වර්ණය එන්නේ නෑනේ කණට ශබ්ද විතරයි. අන්න මේවා එකතු උනාම "පොත" පොත කියන ශබ්දයට අර ආලෝක හැඩ තලයත් වර්ණයත් එකතු වෙනවා ඒවා එකතු වුණාම කියනවා "චිත්තයක්" කියලා අන්න මනෝ විඤ්ඤාණය කිව්වේ ඒකයි. වේදනා සංඥා සංඛාර කිව්වේ මනෝ විඤ්ඤාණ " මනසංච පටිච්ච ධම්මේසු" ධම්ම කියන්නේ සංඥා. ශබ්ද සංඥා වර්ණ සංඥා එකතු වෙලා ශබ්ද තරංගයි වර්ණ තරංගයි එකතු වෙලා චිත්ත තරංගයක් හැදෙනවා. අන්න ශබ්ද වර්ණ එකට තියෙන එකක් නාමීය රූපයක්. නාම රූප වෙන්කරන්න බෑ වෙන් කරොත් නිවන් දකිනවා. නාම රූප එකට තියෙන එක තමයි විඤ්ඤාණය. පොත කියන්නේ මේසේ කියන්නේ ඇඳ කියන්නේ සංඛාර. සංඛාර තමයි අපි මේ පරිහරණය කරන්නේ සිතුවිලි.

**උපාසිකාව:** එහෙමයි ආර්වන්වහන්ස, දැන් අර දේශනා සිහි කර කර වැඩපළ කරත් මම දේශනාවක් අහගෙන කරන්නේ. දේශනාව නැතිව ඉද්දී ඔබ වහන්සේ කියන වාක්‍ය මගේ හිතින් කියවෙනවා. හිතින් දකිනවා ඔබ වහන්සේ මෙහෙම මෙහෙම කියනවා නේද කියලා. එතකොට මම දකින සියලු දේ මනසින් කුඩු කරනවා. ඒ කියන්නේ සියලු දේ කෑලිවලට කපල දැන් මෙතන මෙහෙම දෙයක් නෑ නේද? ඒකද මේ නෑ කියන්නේ කියලා.

**ආර්යන් වහන්සේ:** නෑ නෑ අම්මා පොඩි වැරැද්දක් කරනවා. අම්මා ඔක්කොම කුඩු කරන්නේ බාහිරින් අම්මා කුඩු කරන්න ඕනි සිතුවිලි වලින්. ඒ කියන්නේ අම්මා හිතන්න ඕනි මේ ඔක්කොම සිතුවිලි කියලා. ඒ කියන්නේ අම්මා ඔක්කොම බාහිරින් හිතන්නේ එහෙම නෙමෙයි. දැන් ඔක්කොම හිතන්න ඕනි සිතුවිලි කියලා බාහිරින් කුඩු කරලා වැඩක් නෑ. සිතුවිලි කියලා දැක්කාම ඔක්කොම කුඩුවෙනවානේ එතකොට සිතුවිල්ලෙත් නෑ බාහිරත් නෑ. "අජ්ජත්ත බහිජ්ජා" අන්න දෙකෙන් මිදුනොත් අන්න නිවන් දකිනවා අපි මේ හිතන ඒවා බාහිර නෑ කියලා කුඩු කරන්න.

**උපාසිකාව:** එහෙමයි ආර්යන් වහන්ස, අර ඔබ වහන්සේගේ දේශනාවල පුටුවක් දැක්කා චක්ඛු විඤ්ඤ ාණ සිතක් කියලා හිතන්න,



ශබ්දයක් ඇසුණා ඒක සෝත විඤ්ඤාණ සිතක් කියලා හිතන්න. එතකොට මම හිතට ඒක දෙනවා මේක මට පුහුණුවක්නේ.

**ආර්යන් වහන්සේ:** සිතුවිල්ලක් කියලා හිතන්න ඕනි එතකොට සෝත විඤ්ඤාණ සිතක් කියන්නේ ශබ්දය හරහා එන සිතුවිල්ල, කණ හරහා එන සිතුවිල්ල එතකොට ශබ්ද සිතක් වර්ණ සිතක් ගන්ධ සිතක් උණුසුම සීතල පොට්ඨබ්බ සිතක්නේ, එළියේ තියෙන්න බෑ හොඳයි දැන් මේ කියපු ටික මතකයි නේද?

**උපාසිකාව:** සිතක් කියලා හොදට නිදහසක් තියෙනවා මට. මම මේ ගෙදර තනියමයි ඉන්නේ දරුවොත් නෑ ලංකාවේ නම් මගෙ ඥාතියොත් නෑ තනියම ඉන්නවා පුදුම සහනයක් ඔබ වහන්සේගේ මේ දේශනා ඇහුණට පස්සේ.

**ආර්යන් වහන්සේ:** එතකොට ඔබතුමිය ලංකාවේ නොවේද?

**උපාසිකාව:** ආර්යන් වහන්ස මම ලංකාවේ ඉන්නේ කාලෙකට රට යනවා ළමයි රට ඉන්නේ දුව ළඟට එක්කන් යනවා එහෙ හිටියත් මම ඉතිං ධර්මතාවයේ තමයි හිටියේ හැබැයි ඔබවහන්සේගේ ධර්මය එතකොට මට අහන්න ලැබුණේ නෑ. මට මේ ජනවාරි ඉදල තමයි ඔබ වහන්සේගේ දේශනා අහම්බෙන් ඇහුණේ. මම අන්තිමට මම දන්න අම්මා කෙනෙකුට කීවා මේ දේශනා අහන්න කියලා අපි දෙන්නා කෝල් කරකර දේශනා ගැන සාකච්ජා කරනවා.

**ආර්යන් වහන්සේ:** මේ අම්මගේ ගම් පළාත කොහෙද?

**උපාසිකාව:** ආර්යන් වහන්ස මගේ ගම් පළාත නම් නුවර ඒ උනාට මම පදිංචි වෙලා ඉන්නේ මොරටුව

**ආර්යන් වහන්සේ:** ආ එහෙමයි

**උපාසිකාව:** හැබැයි මම ලංකාවට ආවාම අම්මා බලන්න ඕනි නිසා, අම්මට අවු 98ක් අම්මට සාත්තු කරන්න පොඩ්ඩක් යනවා

**ආර්යන් වහන්සේ:** මේ අම්මගේ අම්මත් තාම ඉන්නවද?

**උපාසිකාව:** එහෙමයි අම්මට දැන් වයස 98ක්

**ආර්යන් වහන්සේ:** අම්මට හොඳට තේරෙනවද කථා කරන ඒවා

**උපාසිකාවඃ** දැන් බෑ. ඒ කියන්නේ ගිය අවුරුද්දේ වෙනකම් අම්මට හොඳට මතක තිබ්බා. තාම ඉඳගෙන එහෙම කෑම කනවා. දැන් අක්කලා මතකයි මාව ඉඳහිට දකින නිසා මතක නෑ.

**ආර්යන් වහන්සේඃ** හොඳයි දැන් මේ කියපු ටික මතකයි නේද?

**උපාසිකාවඃ** එහෙමයි ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේඃ** දැන් සියල්ලම සිතුවිලි බව සිතම බව දකින්න. මේ විදිහට ටික දවසක් මෙනෙහි කරන්න ඔක්කොම සිතුවිලි. ශබ්දයක් ආවාම ශබ්ද සිතක්, අපිට කන්දෙක ඇහෙන්නේ නැත්නම් ශබ්ද සිතක් නෑනේ ඇස් පේන්නේ නැත්නම් වර්ණ සිතක් නෑනේ, එහෙනම් ඉතින් ආයතන ඇතුලෙනේ ඉන්නේ ආයතන වලින් එළියට ගිහිල්ලම නෑනේ තේරුණාද?.

**උපාසිකාවඃ** එහෙමයි

**ආර්යන් වහන්සේඃ** ඔව් ඒ කියන්නේ සමහර අයට රතුපාට පේන්නේ නෑ, සමයර අයට  කොළ පාට අඩුවෙන් පේනවා සමහර අයට වෛද්‍යවරු කියනවා පොඩිවටලු පේන්නේ, සමහර අයට කාව ලොකුයිලු. ඒක නිසා කලු ඉංගිරියාව ලොකු නිසා ලොකුවටලු පේන්නේ, සමහර අයට පොඩිවටලු පේන්නේ ඇත්තටම එක්කෙනෙකුට එක්කෙනෙක් සමාන නෑ. ඔය, අපි ඒ උනාට පොඩිකාලේ ඉදලා රතු පාට කිව්වාට සමහර අයට රතුපාට පේන්නේ නෑ. රතු කියලා තියන්නේ හැමදාම වෙනත් වර්ණයකට තද දුබුරු පාට වර්ණයකට. ඒ ගොල්ලෝ රතුපාට කියලා කියනවා නමුත් ඒ ගොල්ලන්ට රතුපාට පේන්නේ නෑ. සමහර අයට එහෙම තියෙනවා ඇස්වල එක සමාන නෑ. අපි මේ ඉන්ද්‍රිය ගෝචරයි කියන්නේ ඒකයි. ඉන්ද්‍රිය පටිබද්ධයි කියන්නේ ඒකයි. මේ එළියේ තියෙන එකක් දකිනවා නොමෙයි. අපේ සිතුවිලි මේ තියෙන්නේ. අපි මේ ශබ්ද වර්ණ එකතු වෙච්ච එකක් මේසේ කියන්නේ. මේසේ කියන කොට මේසෙට රූපයක් තියෙනවානේ. අපි රූපයක් කියනවා මේසය කියන ශබ්දයට. දැන් ඇමරිකාවේ ඉන්න කෙනෙක් මෙහෙට ආවාට අපි කියන ශබ්ද එයා දන්නේ නෑ.එයා "ටේබල්" කියලා කියන්නේ ඒ කියන්නේ "ටේබල්" කියලා කියන්නේ ඒ කියන්නේ ටේබල් කියලා දෙයක් එළියේ නෑ. ශබ්ද වෙනස්නේ



**උපාසිකාවඃ** එහෙමයි

**ආර්යන් වහන්සේඃ** ශබ්ද වර්ණ පොඩිකාලේ ඉදල දාගත්ත ඒවා තියෙන්නේ. ශබ්ද වර්ණ විතරයි මෙතන වෙන මොකුත් නෑ. ආත්ම කතාවක් නෑ. මේක දකින්න ටිකක් අමාරුයි. මේක ටිකක් ගැඹුරට යනවනේ. දැන් මුලින්ම දකින්න ඕන, මේක සිත කියලා පේනවා නෙමෙයි හිතනවා හැම එකම හිතනවා සිතුවිලි.

**උපාසිකාවඃ** එහෙම තමයි ආර්යන් වහන්ස මම හැම එකම එහෙම කළා.

**ආර්යන් වහන්සේඃ** නමුත් දැන් බාහිරින් කුඩු කරන්න යන්න එපා. බාහිරින් කුඩු කිරීමෙන් පලක් නෑ. මේ ධර්මය තුළ මේ "රෝහිතත්ත" ලෝකේ බාහිරින් හොයන්න යන්න එපා කිව්වේ ඒකයි. බාහිරින් නිවන් දකින්න බෑ. බාහිර ඇත්ත කරගෙන ඕවා කුඩු කලා කියලා නිවන් දකින්නේ නෑ. කවදාවත්. මොකද හේතුව ඒ සියල්ලේ ඒහෙම දෙයක් නෑ. පොත කියලා දෙයක් තියෙනවාද නෑ. ශබ්දයනේ පොත කියන්නේ ශබ්දයයි වර්ණයයි එකතු වෙච්ච එකක් බාහිර කවදාවත් අපිට හම්බ වෙන්නෙ නෑ. අපි ඒ උනාට ගැට ගහගෙන ඉන්නවානේ, මේ තියෙන්නේ පොත මේසය කියලා නමුත් එහෙම එකක් නෑ.

**උපාසිකාවඃ** ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේඃ** කියන්න

**උපාසිකාවඃ** එතකොට ඔබ වහන්සේ කියනවනේ දෙයක් නෑ කියලා එතකොට මම තර්ක කරනවා දෙයක්

**ආර්යන් වහන්සේඃ** නෑ නෑ නෑ වැරදියට අරගෙන අපි හිතන දෙයක් බාහිර නෑ ඒකයි කියන්නේ. අපි හිතන දේවල් කොහෙවත් නෑ කියලයි කියන්නේ. අපි හිතන්නේ මේසයක් පුටුවක් ඇදක් නමුත් දැන් මෙතන සුද්දෙක් ආවොත් ටේබල් චෙයාර් ඒවා වෙනස් අපි හිතන්නෙ ශබ්දයක් ඒ ශබ්දය කොහෙවත් නෑ කියලයි කියන්නේ, දැන් අපි කියනවා ඇපල්, ඇපල් කියන්නේ ශබ්දයක් දැන් අපි කියනවා අන්නාසි. අන්නාසි කියන්නේ ශබ්දයක්. දැන් සුද්දෙක් කියන්නේ "පයිනැපල්" චීන ජාතිකයෙක් තව සද්දයක් දානවා දෙමළ එක්කෙනෙක් තවත් සද්දයක් දානවා. දැන් ඒ

ශබ්ද කියන ඒවා බාහිර කොහෙවත් හම්බවෙන්නේ නෑනේ. ඒකයි අපි ඇසුරු කරන්නේ ශබ්දයකුයි වර්ණයකුයි. එහෙම ඒවා බාහිර නෑ. ශබ්ද වර්ණ එකට එකතු වෙච්ච එකක් චිත්තය කියන්නේ, අපි ඒකයි කිව්වේ ඇසින් එන වර්ණත් කණින් එන ශබ්දත් එකතුවෙන එක තමයි චිත්තය කියන්නේ සංඛාරා කියන්නේ. ඒකම තමයි "සම්පටිච්චණ" වෙන්නේ. ඒකම තමයි පටිච්චසමුප්පාදය කියන්නේ. මේක මේ සිතුවිලි ඇතුලේ කතාවක් බාහිර එකක් නෙවෙයි. සිත හැදෙන හැටි මේ කතාවේ තියෙන්නේ එතකොට අපි බාහිර කියල හිතන් ඉන්නවා. අන්න එතන තමයි අපේ රැවටීම. අපි ඔක්කොම හිතනවා අපි හිතන ඒවා බාහිර තියෙනවා කියලා. මේසයක් පුටුවක් ඇදක් අඹ ගහ නුග ගහ මේවා බාහිර තියෙනවා කියලා හිතෙනවා. නමුත් ඒවා ශබ්ද, ශබ්ද අපිට දාපුවා. පොඩි කාලේ අපිට "යෙලෝ රෙඩ් බ්ලූ" අර මොන්ටිසෝරියේ දී කියල දෙනවනේ අර පිංතූර දාලා ශබ්දෙ දානවා. "ඕවල් ට්‍රැන්ගල්" නේද? එතකොට ඇපල් අන්නාසි එහෙම කියනවනේ දැන් අපි ශබ්දනේ පරිහරණය කරන්නේ අපි ඒ ශබ්ද දාපුවනේ කියන්නේ. දැන් ඇමරිකාවේ හිටියනම් ශබ්ද වෙනස්නෙ. චීනේ හිටියනම් ශබ්ද වෙනස්නේ ශබ්දයක් කවදාවත් ඇත්තක් වෙන්නේ නෑ. තේරුණා නේද?. මේ ශබ්දයකුයි වර්ණයකුයි අපි පරිහරණය කරන්නේ.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** චිත්තයක් කියන්නේ ශබ්ද වර්ණ ඔය දැන් අපේ වෙන මොකුත් එකතුවෙන්නේ නෑනේ ඇහෙන් එන වර්ණ කණට එන ශබ්දයි නාසයට එන ගන්ධයයි දිවේ රසයි ඔය උණුසුම සීතල තද ගතිය ඔය ටික නේ එකතු වෙන්නේ. මේවා එකතුවෙලා තමයි අපි දෙයක් කියලා ගන්නේ. ඔය දෙකේ ප්‍රකට වෙන්නේ දිට්ඨි සුත මුත කියලා බුදුන් වහන්සේ අනිත් ඔක්කොම එකතු කරල පෙන්නන්නේ ඒකයි. "දිට්ඨේ දිට්ඨ මත්තං" උනොත් ඒක ආලෝකයක් විතරයි අර සුත එකතු උනොත් එතන මේසයක් පුටුවක් ඇදක් තියෙනවා. ශබ්දය එකතු වෙන්න ඕන වර්ණයට එතකොට චිත්තයක්. හැබැයි ශබ්ද වර්ණ වෙන් උනොත් දුටුවා නම් දුටුවා පමණි. දුටු දෙයක් නෑ. දෙයක් නෑ කියන්නේ පොත මේසය ඇද කියලා දෙයක් නෑ තේරුණාද?.

**උපාසිකාව:** එහෙමයි



**ආර්යන් වහන්සේ:** මේසේ කියල බාහිර මොකුත් නැති වෙලා නෙමෙයි. අපි හිතෙන දේවල් බාහිර නෑ. අපි  හිතනවා මේසයක් පුටුවක් ඇඳක් කියලා. ශබ්දය වර්ණය එකතු වුන එකක් තමයි චිත්තයක් කියන්නේ. එහෙම එකක් අපිට බාහිරින් කවදාවත් හම්බවෙන්නේ නෑ. අපිට මහ භූත පේන්නේ නෑ. අපි කොහොමද මේසේ කියන්නේ. එහෙනම් සුද්දෙක් ආවත් මෙසේ කියන්න එපායැ සුද්ද කියන්නේ "ටේබල්" කියලනේ. චීන ජාතිකයෙක් ආවොත් තව එකක්නේ කියන්නේ. ඉන්දියන් ජාතිකයෙක් ආවොත් තව එකක්නේ කියන්නේ. හැමෝම මේසේ කියන්න එපැයැ. ශබ්ද වර්ණ කියන්නේ අපි හදාගත්ත එකක් අපි දැන් මේ ශබ්ද දාගෙන තියෙන්නේ පොඩි කාලේ ඉදන් හදාගත්තු ශබ්ද. අපි දැන් කියනවා ඒවා ඇත්ත නොමෙයි බොරු ඇත්තම කිව්වොත් ඇත්ත අපිට කවදාවත් හම්බවෙලා නෑ.අපි කවදාවත් බාහිර තියෙන ඒවා ඇසුරු කරන්නේ නෑ අපි ඇසුරු කරන්නේ සිතුවිලි අපි හිතනවා මේ රත්තරං වටිනවා, රත්තරං කියලා දෙයක් එළියෙ තියෙනවා, මේ යකඩ වටින් නෑ යකඩ කියන එකක් එලියේ තියෙනවා මේ අපි හිතනවා මිසක් එළියේ එහෙම නෑ. එහෙම අපි හිතනවා දැන් කොරෝනා  හැදුණානේ. චීනෙන් කිව්වා කොරෝනා කියලා ඊට පස්සේ ඇමෙරිකාව පැත්තට යුරෝපයට ඒක ගෙනිච්ච කීවා කෝවිඩ් නයින්ටීන් කීවා ඒ ගොල්ලන්ට කෝරෝනා කියන එක කියා ගන්න බෑ ඊට පස්සේ ඒක ඇල්ෆා කීවා, බීටා කීවා, දැන් කියනවා ගැමා කියලා, ඊට පස්සේ ඕමික්‍රෝන් කියලා, දැන් මේ ඇත්තක් නෙමෙනේ. මේක වෙනස් කරන්න පුලුවන්නේ, භාෂාව ඇත්තක් නෙමෙයි වචන ඇත්තක් නෙමෙයි, අපි කියන එකක්වත් ඇත්තක් නෙවෙයි ඒවා ඔක්කොම අපි හදාගත්ත එවා.

**උපාසිකාව:** එතකොට ආර්යන් වහන්ස ඔය අර ඔබ වහන්සේ කියන්නේ නිඝණ්ඨ භාවනා කියලා. සමථයේම ඉන්න කියලා මම කාලයක් භාවනා කළා. අර ඥාණ මෙහෙමයි පහල වෙන්නේ ඇස් දෙක වහගෙන හුස්මෙම ඉන්න ඊට පස්සේ උදය වැය භංග භයතු පට්ඨාන ඔහොම කියනවා මෙලෝ දෙයක් තේරුනේ නෑ. ආර්යන් වහන්ස දැන් ඔබ වහන්සේ කියලා දෙන ඒවා බැලුවොත් හිතෙනවානේ ඒකම ප්‍රගුණ කරගෙන ගියොතින් අපිට අර පැත්තෙන් මහන්සි වුනේ හරි අපරාදේ නේද?.

**ආර්යන් වහන්සේ:** නෑ අපිත් කාලයක් භාවනා කරපු අයනේ, අපි ඔය ධ්‍යානවල හිටපු අයනේ. අපි හොඳට දන්නවා අපි අරූප ධ්‍යාන වල හොඳට කටයුතු කරලා තියෙනවා. ආකාසඤ්ඤායතන විඤ්ඤායතන ගැන හොඳට අත්දැකීම් තියෙනවා. ඔතන පාවෙන තැනකට යනවා. ඊට පස්සේ නොදැනෙන ස්වභාවයට යනවා ඇත්තටම කවදාවත් නිවන් දකින්නෙ නෑ. එතන ආත්මය කියන එක නැති වෙන්නේ නෑ. ඒකට හේතුව තමයි එතන තමන් ඉන්නවා හැම තිස්සේම ආකාසඤ්ඤායතනයේ තමන් ඉන්නවා හැම තිස්සේම, විඤ්ඤායතනයේ තමන් ඉන්නවා සමාධියේ තමන් ඉන්නවා. තමන් නැති වෙන්නේ නෑ. ඒවා කළේ පස්වග තව්සෝ රූප ධ්‍යාන වල හිටියා හැබැයි සමථයේ තමයි හුස්ම දිහා බලලා හුස්ම ඒකාග්‍ර කරලා උග්ගහ නිමිත්ත පටිභා නිමිත්ත සබ්බ සංඛාර පටිසංවේදී කියන තැනින් පස්සේ අර "පච්චේ පරිග්ගහ ඤාණෙට" වෙලා හිටියා එතෙන්නට වෙලා හිටියා. නොදැනෙන ස්භාවයට වෙලා එතනින් ඊට පස්සේ "විමෝචයං චිත්තං නිරෝධානු චිත්තං විරාගානු චිත්තං" ඔහොම කිය කියා හිටියා. නමුත් කව්රුවත් කවදාවත් ඔහොම නිවන් දකින්නේ නෑ. ඒකට හේතුව ඇත්තටම පස්වග තව්සෝ නිඝණ්ඨයෝනේ. බාහිර ඇත්ත කරගෙන කරපුවා නිඝණ්ඨ. ඒ කියන්නේ ලෝකේ ඇත්ත කරගෙන. ඒ කියන්නේ ආශ්වාස ප්‍රාශ්වාස හුස්ම රැල්ල දිහා බලන් හිටියේ රූපේ බාහිරින් ඇත්ත කරගෙන. මේ රූපය ඇත්ත කරගෙන කරපු භාවනා කියන්නේ තමන් කරන ඒවා. කෙනා ඉන්නවා කෙනා නැති වෙන්නේ නෑ. ඒවා නිඝණ්ඨ භාවනා කවදාවත් මේ භාවනා පංති ගිහින් කවුරුත් නිවන් දකින්නේ නෑ. ලංකාවේ භාවනා මධ්‍යස්ථාන සේරගේම තියෙන්නේ බුදුන් වහන්සේට වැරදිච්ච එක කරන්නේ. අර පස්වග තව්සෝ කරපුවා ඒ කව්රුවත් නිවන් දකින්නේ නෑ. විදර්ශණාවකට කවදාවත් එතනින් එන්න බෑ. ඒකනේ බුදුන් වහන්සේ පටිච්චසමුප්පාදය මෙනෙහි කරන්නේ සිත හැදෙන හැටි දැකලයි සිතෙන් මිදෙන්නේ. මේ අවබෝධ කරගන්න ධර්මයක්නේ මේක භාවනා කරල ලබන්න බෑ. කවදාවත් නිවන් දකින්නේ නෑ.

**උපාසිකාව:** එහෙමයි ආර්යන් වහන්ස ඔබ වහන්සේගේ ධර්මය මට ඇත්තටම ජනවාරිවල ඉදලනේ හම්බවුනේ. ඒක ඊට ඉස්සර වෙලත් මට හිතුනා බොරු වැඩක් නේද අපි කරන්නේ කියල.

**ආර්යන් වහන්සේ:** ඒකනම් ඇත්තම තමයි



**උපාසිකාව:** ඇත්තටම බොරු වැඩක් භාවනා කියලා ගියා. ගිහි මහත්මයෙක් කරන්නේ. ඔබ වහන්සේගේ දේශනාව ගැනත් තියෙනවා. කකුලුවෝ දන් දෙන මොකක්ද කථාවක් ගැන ඒ පංතියෙන් තමයි කරන්නේ මට එතකොට හිතුණා මෙතන මේ පිස්සුවක් නේද නටන්නේ කියලා.

**ආරියන් වහන්සේ:** ඔව් ඇත්ත මේ සාකච්ඡාවලත් ගොඩක් තියෙනවා නිගණ්ඨ භාවනා කියලා  සාකච්ඡා මාලාවක් ඒකට හේතුව ගොඩක් අය රැවටිලා අමාරුවේ වැටිලා. ඒ ගොල්ලන්ට එතන පාවෙන කොට යන්න එතනින් එහාට දෙයක් නැති වෙන කොට ඒ ගොල්ලෝ අතර මං වෙලා අපිට කතා කරපුවාම අපි පහදලා දෙන සාකච්ඡා ගොඩක් තියෙනවා.

**උපාසිකාව:** ඒ සාකච්ඡා මම ගොඩක් අහනවා ආර්යන් වහන්ස.

මම දේශනාවේ ඉතිරි කොටස මතු දේශනාවකින් ඉදිරිපත් කරමි.

# 02

# නිවැරදි නිවන් මග හමුවිය

**උපාසිකාව:** තෙරුවන් සරණයි ආර්යන් වහන්ස

**ආර්යන් වහන්ස:** තෙරුවන් සරණයි

**උපාසිකාව:** මේ වෙලාවේ කතා කරන්න පුලුවන් ද ආර්යන් වහන්ස

**ආර්යන් වහන්ස:** ඔව් පුලුවන් කියන්න

**උපාසිකාව:** ආර්යන් වහන්ස මම මේ කතා කරන්නේ ටිකක් අසනීප කෙනෙක්. මම ඔබ වහන්සේගේ ධර්ම දේශනා අහනවා අහල මට අර අවබෝධය කියන්නේ අර බාහිර දෙයක් නෑ කියලා අවබෝධයට එනවා සැරෙන් සැරේ. පවතින් නෑ. එක වෙලාවකට හොදට ඒ අවබෝධය තියෙනවා. ආයෙ තව වෙලාවකට ඒක නෑ. තව ආර්යන් වහන්ස මට තියෙනවා පොඩි භයක් මම අසනීපෙන් ඉන්න නිසා, අර හුස්ම ටික යයිදෝ කියලා මේ ධර්මය අවබෝධ කරන්ට කලින්. ඉතින් ඒක නිසා තමයි ඔබ වහන්සේට ගත්තේ. කරුණාවෙන් අනුකම්පා කරල ධර්ම අවවාදයක් දෙන්ට, මම ඉස්සරහට හිත දියුණු කරගෙන මේ ධර්මය අවබෝධය කරා යන්නේ කොහොමද කියලා දැන ගන්ට තමයි. ඉතිං ඔබ වහන්සේට ගත්තේ.

**ආර්යන් වහන්සේ:** ඔව් ඇත්තට ම දැන් වයස කීයද?

**උපාසිකාව:** මට දැන් අවුරුදු 52 ක් වෙනවා ආර්යන් වහන්ස. අවුරුදු 18ක විතර ඉදන් මම ස්නායු රෝගයකින් ඉන්නේ. දැනටත් බෙහෙත් බොනවා ඔබ වහන්සේගේ දේශනා අහල තමා ශරීරයේ තියෙන වේදනා හුඟක් සමථයකට පත්කර ගන්නේ. අර ඔබ වහන්සේගේ දේශනාවක



තිබුණා පා දෙකම අහිමි කෙනෙක් සිරිපාදේ ගියා කියලා. එ වගේ ඒවා අහලා මගේ පංචස්කන්ධයේ තියෙන වේදනාව ගොඩක් මට ඔබ වහන්සේගේ දේශනා තුළින්ම මට සමථයකට පත් වුණා. අනිත් එක ආර්යන් වහන්ස මට මතක ශක්තිය ගොඩක් අඩුයි. අර ඔබ වහන්සේගේ එක දේශනාවක් දෙතුන් පාරක් වගේ අහනවා ඒ ඇහුවට මතක ශක්තිය අඩුයි මට. අර මේ රෝගය නිසා වෙන්න ඇති. ඒ උනාට මට අවබෝධය එනවා යනවා වගේ තියෙන්නේ ආර්යන් වහන්ස. බාහිර දෙයක් නෑ කියලා අවබෝධය තියෙනවා එක වෙලාවකට, ආයේ ඒක නැතුව යන එකක් තියෙන්නේ ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්ස:** ඔබ තුමිය මීට කලින් කතා කරල තියෙනවානේද?

**උපාසිකාව:** නෑ ආර්යන් වහන්ස අද තමා මම ගත්තේ

**ආර්යන් වහන්සේ:** ඔය විදිහටම කෙනෙක් අපිට පෙරේදා රෑ කතා කලා එයාට ගොඩක් වයසයි. එයාට වයස අවුරුදු 85 විතර ඇති.

**උපාසිකාය:** එහෙමයි ආර්යන් වහන්ස

**ආර්යන් වහන්ස:** අපි ඒක උපමා කරන්නේ මුවහත් තියෙන පිහියකට. දැන් පිහිය මුවහත් තිබ්බද කියලා මතක තියා ගත්තට වැඩක් නෑ. පිහිය හොදට මුවහත්නම් කැපෙනවනේ, පිහිය මුවහත් තිබ්බද නැද්ද කියලා අපිට අමතක වෙන්න පුලුවන්. හැබැයි පිහිය හොදට මුවහත් වෙලානම් කැපෙනවා කියල තේරෙනවා. එතකොට මේ මුවහත මතක තියා ගන්න එකක් නෙමෙයි. අවබෝධය කියන්නේ අන්න ඒ වගේ දෙයක් අවබෝධ උනාද නැද්ද කියලා ඇත්තටම අපිට හිතල ගන්න බෑ. අපිට අවබෝධ වුණාට පස්සේ අපිට තියෙන්නේ මිදීමක්

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** එතකොට මිදීම තමයි අර මුවහත වගේ ඔක්කොම කැපිල යනවා. එකක්වත් ආපිට ඇත්ත වෙන්නේ නෑ

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** එතකොට එකක්වත් අපිට ඇත්ත වෙන්නෑ කියන්නේ අර පිහිය මුවහත් වුණා වගේ කැපිලා යනවා එකක්වත් පිහිටන්නේ නෑ සිතේ.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** එතකොට එතන තමයි අවබෝධය තුළ සිද්ධ වෙන්නේ අර මිදීම. නිස්සරණය නිස්සරණ වනය කපා දානව කියන්නේ කෙළෙස් පිහිටන්න තැනක් නෑ. ඒ කියන්නේ විඤ්ඤාණය පිහිටන්න පතිත වෙන්නේ නෑ කොහෙවත් අර දෙයක් නැති බව දකින කොට කොතනවත් විඤ්ඤාණය බැස ගන්නේ නෑ. ඇත්ත කරගන්නේ නෑ මේ පොළොව තියෙනවා. මම ඉන්නවා දරුවො ඉන්නවා ඔන්න ඔය පතිත වෙන් නැහැ කියන එක තමයි අවබෝධය කියන්නේ.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** අවබෝධය දියුණු නම් අධ්‍යාත්මිකව දියුණු අවබෝධයක ස්වාභාවය තුළ ඇත්තටම අර ලෝකෙන් මිදීමක් තමයි මුවහත වගේ පේන්නේ.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** ඔන්න ඔය ඔතන තමයි අපි උපමා කරන්නේ ඔය පිහිය මුවහත් තියන එකට. ධර්ම ශ්‍රවණය තුළ පිහිය මුවහත් කරන එක තමයි සිද්ධ වෙන්නේ. මේ උපමාව පෙන්නන්න පුලුවන් හොදටම ගැලපෙනවා මොකද අපිටත් තේරෙනවා මෙතනදී නිස්සරණ වනය කැපිල යනවා වගේ. ඒ කියන්නේ දෙයක් කෙනෙක් අපිට අල්ලගන්න, අසුවෙන්නැතිව යනවා. ඉතාම තියුණු මුවහතක් ආපු පිහියක් වගේ සියුම්ව කැපිල යනවා කෙලෙස් එකක්වත් පිහිටන්නේ නෑ.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** ඔව් එතන ඉතාම දියුණු තැනක් එතකොට අපිට දැන් තේරෙනවා මතක තියාගන්න දෙයක් නෙවෙයි මේක.

**උපාසිකාව:** එහෙමයි ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේ:** ඔව් මේකේ මෙතන මෙහෙම දෙයක් නොවෙයි. මොකද මේ මොහොත දැන් අහණ බණ ඇතුළාන්තෙට දැනෙන ස්භාවයක් තියෙනවා.

**උපාසිකාව:** එහෙමයි



**ආර්යන් වහන්සේ:** ඒ ස්වභාවය අපිට මතක තියා ගන්න එකක් නෙමෙයි. මතක තියා ගන්නවා කියන්නේ ඔය ශබ්දයි වර්ණයි තමයි. ඒ කියන්නේ මේ ආපු ශබ්ද ටික ඒ විදිහටම ප්‍රතිකම්පණය වෙවී තියා ගන්නවා. ඒකට කියනවා මතක තියා ගන්නවා කියලා. හැබැයි ඉතිං මේ ශබ්ද ටිකම ආයේ ශබ්ද දැම්මයි කියල වැඩක් නෑ. අර අධ්‍යාත්මිකව අවබෝධය තුළයි මිදීම තියෙන්නේ.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** ඔව් ගිරව් වගේ කියෙව්වා කියලා පොත් කට පාඩම් කරගෙන කියෙව්වට වැඩක් නෑ. ඒ කියවන දැන් ඔය අපි ගථා කියනවනේ සමහර අපේ අම්මල අවුරුදු 30ක් 40ක් ගථා කිව්වට ඇතුලේ තියෙන්නේ මොනවද කියලවත් දන්නේ නෑ. දැන් ගාථා මතක තිබ්බට වැඩක් නෑ අර ගාථාවේ තේරුම හොදින් මෙනෙහි කරලා අවබෝධ කරගත්තොත් අන්න එතනයි දියණුව තියෙන්නේ.මෙන්න මේ වගේ බුදු සමයෙත් අපිට අහන්න ලැබෙනවානේ "චුල්ලපන්ථකට" ගාථා මතක හිටින්නේ නෑ කියනවනේ. එතකොට බුදුන්වහන්සේ කියනවනේ ගාථා මතක හිටින් නැති වුණාට ඔබට මේ දේ කරන්න පුලුවන් නම් නිවන් දකින්න පුලුවන් කියලා සුදු රෙදිකඩ දෙනවනෙ.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** ඒක අතගගා ඉන්නකොට මෙනෙහි වෙනවානෙ මේක වගේම සිතත් කිළිටු වෙච්ච ස්වභාවය. ඒක දැකලා චුල්ලපන්ථක රහත් වෙන්නේ.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** මේක මෙනෙහි කරන එකක්

**උපාසිකාව:** එතකොට ආර්යන් වහන්ස අවසරයි මට දැන් අර

**ආර්යන් වහන්සේ:** නෑ ඔබ තුමියගේ ඊළග ප්‍රශ්ණෙත් අපි දන්නවා. ඒ කියන්නේ ඔබ තුමිය දැන් කිව්වා මේ මෙතන සිතත් කියලා දෙයක් නෑ. මෙතන ක්ෂණය විතරයි තියෙන්නේ.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** ඇත්තටම පවතින සිතක් නෑ කොහෙවත්

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** අපි දේශනා දැම්මා ගොඩක් සිත කියලා දෙයක් නෑ කියලා දේශනා දැම්මා ගොඩක් අයට සමහර වෙලාවට ඒක දානකොට එක පාරටම හිතක් නෑ කියලා හිතා ගන්න බැරි වෙනවා. හිත කියලා දෙයක් නැත්නම් කව්ද හිතන්නේ කියලා අපිට කමෙන්ට්ස් දාලා තිබුණා. හිතක් නැත්නම් කොහොමද හිතන්නේ කියලා. ඇත්තට ම මේක බොළඳ මනසකට තේරෙන්නේ නෑ, මේක බොළඳ දෙයක් නෙවෙයි. ඇත්තටම මේක හඳුනා ගත්තොත් සිත කියලා දෙයක් නෑ.

**උපාසිකාව:** එහෙමයි ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේ:** මේක ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිවන නැතිවන වේගයක් තුළ "ස්පාක්" වෙන සිද්ධියක් විතරයි සිද්ධ වෙන්නේ. ඒ වේගේ වැඩි කමට අපිට දෙයක් තියෙනවා වගේ දැනෙනවා. දැන් ගඟ ගලනවා. ඒ උනාට ගඟ කියල දෙයක් කොහෙවත් නෑනේ.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** ගඟ කියන්නේ ගලනවාට අපි ඒ වුණාට කියනවා ගඟ දිහා බලන් ඉන්නවා කියලා. දැන් ගඟ දිහා බලන් ඉන්නවා කියලා දැන් ගඟ දිහා කොහොමද බලන් ඉන්නේ. දැන් වතුර ගලනවා, දැන් අපි මේ මොහොතේ බලන් ඉන්න කොට ඒ වතුර ටික ගිහින් ඉවරයි. තව වතුර ටිකක් යනවා ඒකත් ගිහින් ඉවරයි. අපි ඔහේ බලාගෙන ඉන්නවා අපි බලාගෙන ඉන්නේ ඡායාවක්. නමුත් අර ගලනවාට තමයි ගඟ කියන්නේ.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** බලන්නකෝ හරි පුදුම උපමාවක් ඒ කියන්නේ ගඟ ගලනවා කියන කොට ගඟක් කොහෙද තියෙන්නේ ගලනවටනේ ගඟ කියන්නේ. මේක තනිකරම මනෝ විකාරයක්නේ දැන් අපි ගඟ දිහා බලන් ඉන්නවනේ ඇත්තටම. ඒ උනාට ඔය වතුර ගලනවානේ ඒ උනාට අපිට පේන්නේ නිශ්චලව තියෙන ගඟක් වගේනේ. ඒ උණාට එහෙම එකක් නෑනේ, ඔන්න ඔය වගේ වැස්ස වහිනවා. වැස්ස කියන්නේ



වතුර බිංදු වැටෙනවටනේ අපි වැස්ස කියලනේ කියන්නේ. දැන් අපි මේ වචනය පනවනවා දෙයක් කරලා හැම තිස්සේම.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** මේ දෙයක් වැස්සත් දෙයක්. දෙයක් වුණේ කොහොමද? වතුර බිංදු වැටෙනවනේ, දෙයක් නෑනේ, ඒක කියන්න බැනේ කාටවත් නේද?

**උපාසිකාව:** එහෙමයි ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේ:** ඒක හරි පුදුම කථාවක් දැන් හුළඟත් අපි දෙයක් කියනවා. හුළඟ කියන්නේ හමනවට කොහොමද දෙයක් වෙන්නේ. ඒක හරි පුදුමයි. මෙන්න මේ වගේ දැන් අපි කියනවනේ සංඛාර කියලා සංඛාර කියන්නේ දෙයක්නේ. දැන් අපි ගත්තොත් වචී සංඛාර කාය සංඛාර මනෝ සංඛාර නේ

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** වචී සංඛාර එතකොට දෙයක් නේ දැන් සිංහල භාෂාවෙන් කියනවා පොත. පොත කියන්නේ ශබ්දයක්.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** එහෙම ශබ්දයක් කොහොම ද දෙයක් වෙන්නේ, අන්න වචී සංඛාර හරි ගැඹුරුයි. දැන් බලන්න කාය සංඛාර දැන් ඇවිදිනවා. ඇවිදින එක කොහොමද දෙයක් වෙන්නේ? ඇවිදිනව කියනනේ චලනයක්නේ, අපි කියනවා දෙයක් වගේ. ස්ථිරයි වගේ. හැම තිස්සේම තියෙනවා තියෙනවා. වැස්ස කියල දෙයක් ගඟ කියල දෙයක් තියෙනවා හුළඟ කියලා දෙයක් තියෙනවා නේද? ඇවිදිනවා කියල දෙයක් තියෙනවා. දැන් අපි ඔක්කොම හැම ක්‍රියාවලියකටම තියෙනවා කියලා පනවනවා. ඒක තමයි අපි මේ සිත කියන්නේ බලනකොට, හිත කියන්නේ අපි මේ වේගෙට අහුවෙලා ඉන්නේ අපිට ඒ වේගෙ පේන්නේ නෑ. අපි ඒ වේගය තුළ මැවෙන මැවීමට ස්ථිරත්වයක් පනවගෙන ඉන්නවා. කව්රුවත් පිළිගන් නෑ පැයට කිලෝමීටර් 187 ක වේගෙන් කැරකි කැරකී ඔය ඉන්නේ කියල කිව්වොත්, මේ පෘථිවිය කැරකෙනවා අපිට කවදාවත්

තේරිලා නෑනේ කැරකෙනවා. අපි නිකන් බඹරයක් ඇතුළේ ඉන්නව වගේ නේ. බඹරයක් උඩින් ඉන්නව වගේනේ.

**උපාසිකාවඃ** එහෙමයි

**ආර්යන් වහන්සේඃ** ඇත්තටම පෘථිවිය කැරකෙනවනේ.

**උපාසිකාවඃ** එහෙමයි

**ආර්යන් වහන්සේඃ** ඉතිං අපි බඹරයක් උඩ තියලනේ ඉන්නේ අපිට කවදාවත් ඒක හිතෙන් නෑනේ. මේ ගේ තියෙනවානේ හෙල්ලෙන්නේවත් නෑනේ මේ ඔක්කොම තියෙනවනේ මේක තමයි මායාව. වේගයක් තුළයි මේ සේරම අපි ඉන්නේ වේගෙට අහුවෙලා.

**උපාසිකාවඃ** එහෙමයි ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේඃ** බලනකොට අපි කතා කරන දේවලුත් වේගයක් ඇතුළේ. බලනකොට අපි හිතන දේවලුත් වේගය ඇතුළේ. බලනකොට මේ සිත කියල හිතන කොට හැම දේම වේගයක් ඇතුළේ. පුදුම ගැඹුරක් දැනෙනවානේ.

**උපාසිකාවඃ** එහෙමයි ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේඃ** හිතා ගන්න බෑ නේ

**උපාසිකාවඃ** මට වැටහුණා ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේඃ** හිතා ගන්න බෑ මොකක්ද මේ වෙන්නේ කියල නේද?

**උපාසිකාවඃ** එහෙමයි ආර්යන් වහන්ස. මම ගොඩක් අසරණ වෙලා ගොඩක් කල් හෙව්වා ආර්යන් වහන්ස ධර්මය.

**ආර්යන් වහන්සේඃ** දැන් මේ සිත කියන්නේ "ස්පාක්" වෙන වේගයක්. අපි "ස්පාක්" එක දකින්න ඕනි නම් කණ්ණාඩියක් අල්ලන්නකෝ අව්වට අන්න දිළිසෙනවා. අන්න "ස්පාක්" වෙනවා.

**උපාසිකාවඃ** එහෙමයි

**ආර්යන් වහන්සේඃ** ඔන්න ඔය වගේ ස්පාක් එක වේගයෙන් එන නිසා තමයි දිළිසි දිළිසි තියෙන්නේ නැත්තං ඔය "ස්පාක්" කියන්නේ. එක පාරක්



ගැස්සෙන එකටයි. නමුත් ඕක අපිට දැන් හොඳට තේරෙනවා කරන්ට් එක ෂෝට් වෙන කොට අර කට කට කට ගාලා ෂෝට් වෙනවානේ. ඒක තමයි "ස්පාක්" වෙනවා කියන්නේ.

**උපාසිකාවඃ** එහෙමයි

**ආර්යන් වහන්සේඃ** අර "ස්පාක්" වෙනව කියන්නේ වේගයක් එතනත් තියෙනනේ බලනකොට මේ සිත කියන්නේ වේගෙට මැව්ච්ච එකක්. මේ හැම ක්ෂණයේම අපි මැරෙනවා ඉපදෙනවා. මේ පැත්ත බලන කොට බිත්තිය පේනවා. දැන් බිත්තිය පේන කොට පොත දකින හිත මැරිල ඉවරයි. ඒ සිත ආයේ ගන්න බෑ ඒ සිත දැන් ගිහින් ඉවරයි.

**උපාසිකාවඃ** එහෙමයි

**ආර්යන් වහන්සේඃ** දැන් ඊයේ තිබ්ච්ච හිත ආයේ ගන්න බෑ ඒක දැන් ගිහින් ඉවරයි. ඒක අතීතෙට ගියා එතකොට මේ තියෙන හිත හැම මොහෙතේම ඒ තියෙන සිත විතරයි ඒකත් නෑ බලනකොට. ඒකත් බොරුවක්නේ ඒ අර "ස්පාක්" එකෙන් හැදෙන එකක්. ඒකත් පුදුම කතාවක් දැන් ගඟකින් වතුර ටිකක් ගත්තා කියනවා දැන් කෝ ඒ ගඟ කියලා ඇහුවොත් ගඟ ගිහිල්ලානේ.

**උපාසිකාවඃ** එහෙමයි ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේඃ** ආයි ඒ ගඟ ගන්න බෑ එතකොට වතුර මේක හරි පුදුම කතාවක්

**උපාසිකාවඃ** හොඳට වැට හෙනවා ආර්යන් වහන්ස ඔබ වහන්සේ දේශනා කරන කොට

**ආර්යන් වහන්සේඃ** හරි පුදුමයි නේ මේ කතාව දැන් අපි ඉන්නේ කොහෙද? අපි කියල කෙනෙක් නෑ. අපි පෙන්නුවා කයත් මම නෙමෙයි කියලා නේ ඇඟිළි කපනවා, කකුල් කපනවා, අත පය කපනවා නේ. කැපුවයි කියලා හිතන් ඉන්නවා අන්තිමට හිතයි මැරෙන්නෙ. අපි කිව්වා හිත මැරෙනකම් "ස්පාක්" වෙනවා කියලා. හුස්ම වැටෙනකම් ස්පාක් වෙනවා අර ස්පාක් වෙන වේගෙට අපි කියනවා හිත කියලා. හුස්ම වැටෙන එක නැවතුනාම සිත නෑ.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** සිතක් නැත්නම් කයෙන් වැඩක් නෑ වළලලා දානවා. එතකොට සිත නෙවෙයි මමයා කියන්නේ අපි පුද්ගලයෙක් කියල හිතාන ඉන්නේ හිතට නේ. හිත හැම වෙලේම ඇති වන නැති වන ස්භාවයට මැවෙන එකක් නේ. වේගෙට මැවෙන එකක්නේ, ස්පාක් වෙනවා විතරයිනේ, මෙතන හැම ක්ෂණයෙම ස්පාක් වෙවී තියෙනවා. හරියට නිකං අර අර ස්පාක් වෙවී තියෙන අර නිකං බෝලයක් වගේ.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** අපි කොහෙද ඉන්නේ? අපි හිතන් ඉන්නවා කණ්ණාඩියෙන් දැකපු කෙනා මමය කියලා. අපි හිතන් ඉන්නවා මම ඉන්නවා කියලා. අපි හිතං ඉන්නවා මගේ මේ කකුල් පණ නෑ අපි හිතන් ඉන්නවා මගේ අත් දෙක නෑ. අපි හිතන් ඉන්නවා මේ මම හරි ලස්සනයි. අපි හිතාන ඉන්නවා බලන්න මේ මගේ දරුවා මගේ ගෙදර මහ විකාරක් මේ ඔක්කොම.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** මේක මෙනෙහි කලොත් ආයේ කිසිම කම්පාවක් කම්පනයක් මොකක්වත් දැනෙන්න විදිහක් නෑ. හැබැයි මේ ක්ෂණයක්වත් පවතින් නෑ කියන එක දැනේන ඕනි. එතකොට පාවෙනවා වගේ සෘද්ධි ස්වාභාවයක් දැනෙනවා.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** පුලුවන් නම් ඒක මෙනෙහි කරන්න හොඳින් ආයේ උප්පත්තියක් නම් මොකක්වත් නෑ. අනාගාමී ඒ කියන්නේ ලෝකයක්වත් නෑ. ඉරක්වත් හඳක් වත් නෑ මොකක්වත් නෑ. කිසිම දෙයක් හම්බවෙන් නෑ.

**උපාසිකාව:** එයෙමයි ආර්යන් වහන්ස මට දැනටත් හිතට මොකක්දෝ ලොකු දෙයක් දැණුනා. ආර්යන් වහන්ස මට ඇත්තටම වේදනාවල් නැතිව ගියා ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සේ:** ඒක තමයි දැන් අපි මේ වේගෙට මැවුණ චුම්භක ශක්තියක් අතුලේ පෘථිවිය කියල මේ ගුරුත්වාකර්ෂණය ඇතුළේ අපි හිර වෙලා ඉන්නවා. බලනකොට හදිසියේවත් මේ පෘථිවිය කැරකුනේ නැත්නම් ගුරුත්වාකර්ෂණය නැති වෙනවා කෙළින්ම අභ්‍යවකාශයේ ඔය වේගෙ නිසයි තියෙන්නේ.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** පුදුම කතාවක්නේ

**උපාසිකාව**: එහෙමයි ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේ:** ඒක හිතා ගන්න බෑ නේද?

**උපාසිකාව:** ආර්යන් වහන්ස මම කතා කරන්න ද?

**ආර්යන් වහන්සේ:** ඔව් කියන්න

**උපාසිකාව:** ආර්යන් වහන්ස දැන් මට ඔබ වහන්සේගේ දේශනා අහනකොට අර ඔබ වහන්සේගේ දේශනාවක් ඇහුවා අර පොතක ඇඳපු පුටුවක් රත්තරං මාලයක් අන්න ඒ දේශනා මම දෙසැරයක් ඇහුවා. ඒ දේශනාව අහනකොට තමා මට ගොඩක් අවබෝධයක් හිතට දැණුනේ. මම ගොඩක් දේශනා අහලා තියෙනවා. ක්‍රියා සිත කියන ඒවා ප්‍රතිපදා දේශනා දෙපාරක් තුන් පාරක් වගේ එක දේශනාව මම අහනවා. මගේ මතක ශක්තිය අඩු නිසා මම නැවත නැවත නැවත වැටෙහෙන කල්ම අහනවා. මට අර දැන් ඔබ වහන්සේ දේශනා

**ආර්යන් වහන්සේ:** එකක් තියෙනවා දැන් ඔබතුමිය ඔය මතක නෑ කියන එක පැත්තක දාලා ඔබතුමියට අවබෝධයක් තියෙනවා ධර්මය ගැන.

**උපාසිකාව:** එහෙමයි ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේ:** ඔය අවබෝධය කොහෙන්ද ආවේ එතකොට?

**උපාසිකාව:** ඔබ වහන්සේගේ දේශනා අහන්නට පටන් ගත්තට පස්සේ තමයි මට මේ

**ආර්යන් වහන්සේ:** ඔව් ඒක හරි. අපි ඒක දන්නවා දැන් අපි අහන්නේ ඒක නෙමෙයි. දැන් ඔය අවබෝධය මතකයක්ද කියන එක.

**උපාසිකාව:** මතකයක් නෙමෙයි නේද ආර්යන් වහන්ස?

**ආර්යන් වහන්සේ:** මතකයක් නෙවෙයි ඔබ තුමිය අවබෝධයට පත් වෙලා ඉන්නේ යම්කිසි මට්ටමකට.

**උපාසිකාව:** එහෙමයි ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සේ:** ඒක ආය නැති කරන්න බෑ කාටවත් ආධ්‍යාත්මික දියුණුව හොරකම් කරන්න බෑ කාටවත්. දැනගත්තට පස්සේ මෙතන මෙහෙම දෙයක් නෑ. ලෝකයක් නෑ කියල ඒක කාටවත් හොරකම් කරන්න පුලුවන් ද? මොනව හරි අතේ දාලා තියෙන බ්රේස්ලට් එකක් හරි චේන් එකක් හරි හොරකම් කලත් මේක හොරකම් කරන්න පුලුවන් ද? කවදාවත් මේ අවබෝධය තව කෙනෙකුට හොරකම් කරන්න බෑ ඒක තමන්ගේ අවබෝධයට පත් වීමක් නේ.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** කණ්නාඩියේ දෙයක් නෑ කියල අපිට මේ කාව හරි බොරු කියලා රවට්ටන්න පුලුවන් ද නෑ නෑ මේ කණ්නාඩියේ මොනව හරි තියෙනවා කියලා.

**ආර්යන් වහන්සේ:** ඒ වගේ අපිට අවබෝධ වුණාට පස්සේ මේ ලෝකේ දෙයක් නෑ කියල කාටවත් බොරු කියල අපිට ආය දාන්න බෑ.

**උපාසිකාව:** එහෙමයි ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේ:** අපි දන්නවා මේ ලෝකේ දෙයක් නෑ. හිත කියල දෙයක් නෑ. මම කියල කෙනෙක් නෑ මේ මොකක්වත් නෑ ඔක්කොම බොරු ගොඩක් කියලා ආගම් ඔක්කොම බොරුවක්. මේ මිනිස්සු ඔක්කොම පොත් ලියාගෙන මරා ගන්නේ අපරාධයක් කියලා අපි දන්නවා.

**උපාසිකාව:** එහෙමයි ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේ:** මහ විකාරයක් කියල අපි දන්නවා ඕක මුලු ලෝකෙම මිනිස්සු දැන ගත්තොත් එහෙම පුදුමාකාර සාමයක් ඇති වෙනවා. ඒ සාමේ  මේ ලෝකෙට අයිති නැද්ද මන්ද. මේ ලෝකේ කිසිම මිනිහෙක් මරා ගන්නේ නෑ මේ ධර්මය අවබෝධ වුනොත්.

**උපාසිකාව:** එහෙමයි ආර්යන් වහන්ස



**ආර්යන් වහන්සේ:** මිනිස්සු ගොඩක් මරා ගන්න ඕනි නම් ආගම් ගොඩක් තියෙන්න ඕනි එතකොට ආගම් ටික බෙදාගෙන මරා ගන්නවා.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** ඕක තමයි ලෝක විනාශෙ කියන්නේ.

**උපාසිකාව:** ආර්යන් වහන්ස මම දැන් මෙච්චර දුරට ආවේ ගොඩක් මට ඉන්න පරිසරෙත් එච්චර හොද නෑ. ඒ වුණාට අර ධර්මය මෙච්චර වටිනා ධර්මය අපේ දැන් ඉන්න අයට එහෙම අවබෝධ කරල දෙන්ට බෑ. රෑට එහෙම වුණාත් මට දේශනා අහන්ට කරදරයි. මොකද ඒ ළමයි එහෙම සද්දෙට කැමති නෑ ඉතිං මම දවල්ට තනියම ගස් යට තමා හුඟක් ඉන්නේ. ඉදල ඔබ වහන්සේගේ දේශනා අහනවා මට බයක් තිබුණා ආර්යන් වහන්ස මේ හුස්ම ඩිංග යන්න කලින් මෙතෙන්ට එන්න බැරි වෙයි කියන බය මොකද මම.

**ආර්යන් වහන්සේ:** දැන් ඔබතුමිය හුස්ම ඩිංග කොයි වෙලාවේ හරි ගියාවෙ කියලා හිතා ගන්න. මේ මොහොතෙත් මැරෙනවා වගේනේ.

**උපාසිකාව:** එහෙමයි ආර්යන් වහන්ස දැන් ඒ තිබුණ බයත් නැතිව ගියා.

**ආර්යන් වහන්සේ:** මේ මොහොතේ මරණය දකින කොට මරණයක් කොහෙද තියෙන්නේ? දැන් අර ප්‍රංසේ අම්මා කෙනෙක් ඔපරේෂන් එකක් කරන්න යනවා ඒ අම්මත් ඔය වගේ තමයි කතා කළේ. ඒ අම්ම දැන් ඇත්තටම ගොඩක් අය අන්තිම මොහොතේ අන්තිම හුස්ම යයි කියලා දැනෙන ස්වභාවයකයි අපිත් එක්ක කතා කරන්නේ එතකොට අපි පෙන්නල දෙනවා ඇත්තටම මේ මොහොතේ විතරයි මේකෙ තියෙන්නේ. මේකේ මරණයක් නෑ. මේ කතාව අති සුන්දර කතාවක්. මේක දකින්න ඇත්තටම මේ අවබෝධයට එනකෙට බාහිරට තියෙන ඇල්ම නැති වෙනවා පළවෙනි එක.

**උපාසිකාව:** එහෙමයි ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේ:** හදා ගත්තු ලෝකය බිද වැටෙනවා. අර සිහින ලෝකයක් හදා ගත්තනේ අර හීනෙනුත් දකින එක ඒවා කුඩුවෙලා යනවා ඊට පස්සේ තනිකර සුන්දර අර හුළං වගේ සිසිලසක් දැනෙනවා ශාන්ත සුවයක් දැනෙනවා.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** ඊට පස්සේ ඒ කෙනා මහා ලොවිතුරු සුවයක ඒ කියන්නේ සදා අමරණීයයි.

**උපාසිකාව:** සාධු සාධු සාධු

**ආර්යන් වහන්සේ:** එයාට මරණයක් නෑ එයා ස්වභාදහමට එකතු වෙලා ඉන්නේ එයා අනුත්තර ස්භාවයක ඉන්නේ.

**උපාසිකාව:** එහෙමයි ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේ:** ඒ අනුත්තර වූ උත්තරීතර ස්වභාවයකට පත්වෙන්න බැරි වෙලා තමයි හැමෝම උත්සාහ කරන්නේ.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** හැබැයි අපිට අවදිවෙන්න තියෙන්නෙම මේ මොහොතට විතරයි. මේ ක්ෂණයමයි දකින්න තියෙන්නේ.

**උපාසිකාව:** ආර්යන් වහන්ස අපි ඊකට ලොකු වීර්යයක් ගන් නැතුව සමාන්‍ය විදිහට පවත්වාගෙන ගියාම දැන් බාහිර දෙයක් නෑ.

**ආර්යන් වහන්සේ:** එතන තමයි ක්‍රමය ඔබතුමිය කියපු ක්‍රමය හරියටම හරි. ලොකු වීර්යයක් ගත්තොත් ඔතන උපාදානය වෙනවා. එතකොට තමන් බැස ගත්තා වෙනවා. තමනුත් ඉන්නවා එතකොට ඔක්කොම අල්ලා ගත්තා වෙනවා. මේක හරි සියුම් ගමනක්, මේක අතිශය සියුම් කතාවක් බුදුන් වහන්සේ කියනවා උදෑසන හිමිදිරි පාන්දර තණ අග පිණි බිඳක් දකීද තණ අග දිය බිදක යමෙක් දේදුන්නක් දකීද, ඊට වඩා ලොකු කෝණයකින් දැකිය යුතුයි මහණෙනි කියනවා. මේ වගේ තමයි මෙතන දකින්න තියෙන කෝණය අති සියුම් කෝණයක්. ඇත්තම කිව්වොත් බොහොම සැහැල්ලු ස්වභාවයකටයි මේක හසු වෙන්නේ.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** මේක වැඩිය බලහත්කාරයෙන් සිතට පෙන්නන්න බෑ මොකද සිතමයි මේ මායාව සිතේ මායාව සිතට අවබෝධ වෙන්නේ සිත මොකකටවත් චංචල නොවන ස්වාභාවයක.

**උපාසිකාව:** එහෙමයි



**ආර්යන් වහන්සේ:** එහෙනම් සිත චංචල නොවන ස්වභාවය කියන්නේ සුකුම ස්වභාවයක්.

**උපාසිකාව:** හොදයි

**ආර්යන් වහන්සේ**: ඒ කියන්නේ සිතට යම්කිසි අපි වීර්යයක් ගත්තත් එතන චංචලයක් තියෙනවා.

**උපාසිකාව:** එහෙමයි, ආර්යන් වහන්සේ

**ආර්යන් වහන්සේ:** ඒකයි, මේක පේන්නනවා නොවෙයි, බලනවා නෙවෙයි, හිතනවත් නෙවෙයි, දැනෙනවා.

**උපාසිකාව:** එහෙමයි, ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේ:** එකම කතාව "දැනෙනවා"

**උපාසිකාව:** එතකොට, ආර්යන් වහන්ස මට අවසරයි, අර අපි දැන් මොනව හරි ක්‍රියාවක් කරනවනේ දැන් අපි බාහිර, බාහිර නොවෙයි. දැන් අපි එදිනෙදා ජීවිතයේ ගෙදර තියෙන වැඩ පල කරනවා යනවා එනවා. ඒ වෙලාවට ආර්යන් වහන්ස මට ඒ හැම වෙලේම අර සිහිය සතිය කියන එක තියෙනවා. දැන් යම්කිසි වැඩක් කරනවා නම් ඒක ගැන දැනීමක් තියෙනවා.කව්රු හරි කතා කරපුවාම ඒ ගැන හොදට දැනීමක් තියෙනවා. අනිත් එක ආර්යන් වහන්ස මට තියෙනවා පොඩි පසු තැවීමක්. ඒකත් දැන් නැතිව ගියා ඔබ වහන්සේ කතා කලාට පස්සේ. ඒ පසුතැවීම එන්නේ දැන් කාට හරි කව්රු හරි මොනවා හරි කිව්වාම. උත්තරයක් දුන්නොත් අනේ මගෙන් වැරැද්දක් උනාද කියල අන්න ඒ පසු තැවීම තමයි මට පොඩ්ඩක් තියෙනවා.

**ආර්යන් වහන්සේ:** ඔය පසු තැවීමේ හේතුව දැන් නැති වුණා වගේ දැනෙන්න හේතුවත් මෙන්න මේකයි. දැන් මේ පැහැදිලි කරපු තැන කෙනෙක් නෑ පසු තැවෙන්න කෙනෙක් ඉන්න ඕනි.

**උපාසිකාව:** කෙනෙක් ඉන්න ඕනි එහෙමයි.

**ආර්යන් වහන්සේ:** කෙනෙක් හිටියොත් තමයි ඒ කෙනා පසු තැවෙන්නේ මෙතන ආත්ම කතාවක් නෑ ඇත්තටම

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** අපිට දකින්න බැරි වෙලා තියෙන්නේ ඔය අනාත්ම

ධර්මය. ඒ කියන්නේ ශබ්ද වර්ණ එකතු වෙනවා, පෙන්නුවොත් ඔය අනාත්ම ධර්මය පේනවා.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** ශබ්දයක ආත්මයක් නෑ වර්ණයක ආත්මයක් නෑ ඔය ශබ්ද වර්ණ එකතු කරල හදා ගත්ත එකක් අපි මේ පොත, මේසේ, ගහ, හුළඟ, වැස්ස ඔක්කොම ශබ්ද වර්ණ තියෙනවා.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** එහෙම දේවල් කොහෙවත් නෑ. ඒ ශබ්දය පවා වේගෙට එන ශබ්දයක් තියෙන්නේ. වර්ණය පවා වේගෙනිසා මැවෙන වර්ණයක් තියෙන්නේ. ඒවා පවා නෑ තරංග කියලත් පෙන්නන්නේ ඒකයි. ශබ්ද තරංග වර්ණ තරංග එකතු වෙලා හැදෙන චිත්ත තරංග කියන්නේ ඒකයි. ඒකත් වේගෙට හැදිල තියෙන්නේ බලනකොට. අපි ඔය කියන ගුරුත්වාකර්ෂණය පවා සේරම තරංග ශක්තියක් කියල පෙන්නන්න පුලුවන්. සිරස, දෙරණ, හිරු කියන නාලිකා ඔය ඔක්කොම තරංගනේ. ඒවත් අර මෙතන හැම තැනම තියෙන්න එපැයි. එහෙමනම් අපි ටී. වී. ඒකේ දකින්නේ කොහොමද? දැන් අපි මේ පැත්තෙන් කතා කරන එක ඔතෙන්ට ඇහෙන්නේ වයරයකින් නෙමෙයිනේ තරංග.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** තරංග කියන්නේ ඒක තමයි මේක ඇතිවන නැතිවන ප්‍රවාහයක්. මේ සිද්ධිය ඇතුළේ මේ අපි කතා කරන අවකාශයේම ඔය ස්වභාවය තියෙනවා. ඒ කියන්නේ අපි අර ඒකයි පෙන්නුවේ පරණ ටී. වී. එකේ තියෙන ඩොට් ගොඩ වගේ දකින්න අංශුමය ස්වභාවයක් තියෙන්නේ. සම්පූර්ණයෙන්ම ඒවා සකස් කරල ඕන දෙයක් හදන්න පුලුවන් වගේ. එතකොට එතන සිරස හදන්නත් පුලුවන් දෙරණ හදන්නත් පුලුවන් හිරු හදන්නත් පුලුවන්, ඒරියල් එක විතරයි තියෙන්න ඕනි හදන සිස්ටම් එකයි.

**උපාසිකාව:** එහෙමයි, ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේ:** අන්න ඒ වගේ මේ කතා කරන එකත් ඒ සංඛ්‍යාත ඔතන තියෙන සංඛ්‍යාත සමාන නම් ඔතන ඒක තියෙනවා, මෙතනින් මොකුත් යනවා නොවෙයි. ඔතන සංඛ්‍යාත සමාන වීමක් තියෙන්නේ.



ඔතන තියෙන අංශුම ඔතන හැදෙනවා. මෙතන තියෙන අංශු මෙතන හැදෙනවා. ඒකයි කිව්වේ කෙනෙක් "ස්විමිං පූල්" එකට පනිනකොට මැද්දේ තියෙන ජල අංශු ඉස්සිලා වදිනවා. අහසේ විදුලි කොටන කොට, මෙහෙ ජනෙල් හෙල්ලෙනවා, කිව්වේ සංඛ්‍යාත සමානයි කිව්වේ.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** ඒකම තමයි අපි කතා කරනවා කියන්නේ එළියේ තියෙන අංශු කම්පණයට කර්ණ සංඛ පටලය සෙලවෙනවා. කර්ණ සංඛ පටලය සෙලවීම නිසා නෙ ශබ්දයක් ඇහෙන්නේ. මෙතෙන්දි ස්වරාලයෙන් වෙන්නේ අර සංඛ්‍යාතයට සමානව අර විස්ල් එක වගේ වායුව පිටවෙන කොට ප්‍රතිකම්පණය වෙනවා. ජිව්හා ඉන්ද්‍රිය ප්‍රතිකම්පණය වෙනවා. එතකොට මොකද සිද්ධ වෙන්නේ එතකොට අපි ඒ ශබ්දයම පිටකරනවා. අපිට ඇහිච්ච ශබ්දෙම අපි මෙහෙන් පිට කරනවා 'අම්මා' කියන කොට අම්මා කියනවා 'තාත්තා' කියන කොට තාත්තා කියනවා ඊට පස්සේ අපි කියනවා මෙන්න මම ජීවත් වෙනවා, අන්න දරුවා කතා කරනවා, ඔය ඔක්කොම බලන කොට ස්වභාව දහමක් විතරයි.

**උපාසිකාව:** එහෙමයි, ආර්යන් වහන්ස මට හොදට වැටහුණා, හොදට අවබෝධ වුණා ආර්යන් වහන්ස. ඔබ වහන්සේගේ දේශනාව මට ඇත්තටම ප්‍රශ්න නැති තරම් වුණා ඒ ප්‍රශ්න ටික තමයි මට තිබුණේ ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සේ:** මෙතන ආත්ම කතාවක් කොහෙවත් නෑ. ඒක අවබෝධ කරගන්නයි අපිට අමාරු.

**උපාසිකාව:** කෙනෙක් නෑ ඒකනේ අපි මේ ඇඟ ඇතුළේ මොකෙක්වත් නෑ කියන්නේ. හෘදය වස්තුව පවා ඩොනේට් කරනවා. හෘදය වස්තුව තමා හැමෝම අදින්නේ මගේ හදවත කියලා. ඔය ආදරේ කරන ළමයි එහෙම "හාට්" එකනේ අදින්නේ හිත තියෙන්නේ "හාට්" එකේ කියල හිතාගෙන ඉන්නවානේ.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** එයාගේ "හාට්" එක ගලවල මෙයාට දාලා මෙයාගේ "හාට්" එක ගලවල එයාට දැම්මම මොකද වෙන්නේ. හිත් දෙක මාරු වෙනවනේ පිස්සුවක් නේද මේක, තමන්ගේ දුෂ්ඨයාගේ

“හාට්” එක තමන්ට දැම්මම මොකද වෙන්නේ, එතකොට තමන් දුෂ්ඨයා වෙනවා අයියෝ මහ විකාරයක් මේක.

උපාසිකාව: එහෙමයි

ආර්යන් වහන්සේ: මේක හරි පුදුම කතාවක් තමයි, ඇත්තටම කිව්වොත් දැන් ආලෝකය නිසානේ අපිට පේන්නේ. පේනවා කියන එක තියෙන්නේ ඇත්තටම ඇඟ ඇතුළේ සිතක් තියෙනවා නම් කලුවරෙත් පේන්න ඕනනේ. දැන් මස් ඇහැට නොවෙයිනේ පේන්නේ, එහෙනම් මැරුණ කෙනාටත් පේන්න ඕනිනේ. එහෙම නෙමේ අර ස්පාක් වෙන එක තමයි පේනවා කියන්නේ. ආලෝකයක් නැතිව පේන්නේ නෑ. ආලෝකය තියෙනකොට ස්පාක් වෙනවා. අර ආලෝකය තිබ්බොත් තමයි කණ්ණාඩියට දෙයක් වැටෙන්නේ. අර ආලෝකය නැත්නම් කණ්ණාඩියට මොකුත් වැටෙන් නෑ කලුවරේ හරි නේද?

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** ඒ වගේ තමයි දැන් කණ්ණාඩිය ඇතුළේ මොකුත් නෑනේ. අන්න ඒ වගේ ආලෝකය තියෙන කොට වැටෙන්නේ, මේ අක්ෂි කාචය තමයි මේ මෙතන ඔපය හැදෙන්නේ. “නයිදං අත්ත කථං බිම්බං නහිදං පර කථං අගං” මේ ප්‍රතිබිම්භය තමා හැදුවෙත් නෑ. වෙන කෙනෙක් හැදුවෙත් නෑ “හේතුං පටිච්ච සම්භූතං හේතු භංගා නිරුජ්ජති” ඒකනේ බුදුන් වහන්සේ දේශනා කරන්නේ හේතු ඵල දහමනේ “යේ ධම්මා හේතුප්පභවා තේසං හේතුං තථාගතෝ” තථාගතයන් වහන්සේ හේතු ඵල දහමක් දේශනා කරයි කිව්වේ ඕක.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** ඒ කියන්නේ ආලෝකය තියෙන කොට පේනවා කියන එක. මේක එළියේ තියෙන සිතක් ඇඟ ඇතුලේ එකක් නෙමෙයි, මේ අපි ඇඟ ඇතුලේ කොහෙවත් නෑ. මේ සිත “ස්පාක්” එකක් එක්ක තියෙන්නේ. “ස්පාක්” වෙනවා කියන්නේ අර චිත්ත තරංගයක් තියෙන්නේ, ඒකයි මෙතන හුස්ම යනකොට තව තැනක සකස් වෙනවා, ලෝකේ තියෙනවා කියලා හිතුවොත් විතරයි දෘෂ්ඨිය ඇතුලේ විතරයි උපදින්නෙ.

**උපාසිකාව:** එහෙමයි, ආර්යන් වහන්ස



**ආර්යන් වහන්සේ:** ලෝකයක් නැති බව දැක්කොත් කව්රුත් ආයේ උපදින්නේ නෑ, සදා අමරණීයයි කීවේ ඒකයි.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** ඒක මේ මොහොතෙම අවබෝධ උනොත් මේ මොහොතෙම ලොව්තුරු සුවයට එන්නේ පුදුම කථාවක් ඒක.

**උපාසිකාව:** එහෙමයි ආර්යන් වහන්ස, මට හොදට වැටහෙනවා ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සේ:** ඇත්තටම ඔතෙන්ට බොහොම ටික දෙනයි, මේ ටික ඇහෙන්නෙත් දැනෙන්නෙත් අවබෝධ වෙන්නෙත්. ඉතිං ඔබ තුමිය මහා භාග්‍ය වන්තයි ඔබ තුමියට මේ ටික අවබෝධ වෙනකොට එළියත් එක්ක කිසිම කම්පනයක් නොදැනෙන ස්භාවයක් දැනෙනවා නම් ඔබ තුමිය කිසිදා දුගතියක වැටෙන්නේ නෑ.

**උපාසකාව:** එහෙමයි

**ආර්යන් වහන්ස:** ඒකට හේතුව තමයි අර රලු ස්වභාවවල තමයි රලු සතුන්ගේ චිත්ත ස්වභාවය රලුයි. ඒ ස්වභාවයට දැන් ඔබ තුමියගේ සිතුවිලි නෑ, ඔබතුමියට එවැනි චිත්ත ස්වභාවයක් නෑ, සංඥාවක් නෑ, ඔබ තුමිය එවැනි ස්වභාවයක උපදින්නේ නෑ. කොහොමත් ඔබතුමිය සුගති පරායනයි.

**උපාසිකාව:** එහෙමයි, සාධු සාධු සාධු ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සේ:** ඔබතුමියට තියෙන්නේ සත්‍ය අවබෝධ කරගන්නම පමණයි.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** මේ සත්‍ය අවබෝධයෙන්ම පමණයි සුගති පරායන වෙන්නේ.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** ගසක් යම්සේ ගඟට ඇල වී තිබේද ඒ ගස ගඟටම වටෙන්නා සේ, යමෙක් මේ සත්‍යට යොමු වී තිබේද නිවනින් ම සැනසීම ලබයි කියන්නේ ඒකයි. නිවන කියන්නේ මේ සිතේ හැම විටම

දෙයක් නැති බව දැනෙන කොට ඇති වන මිදීම. දෙයක් තිබ්බොත් ගිණි ගන්නවා ඇලෙනවා ගැටෙනවා. ඇලීමත් ගින්නක් ගැටීමත් ගින්නක්.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** ඇලෙනවා කියන්නෙත් ලෝකයක්, බැස ගෙන තිබීමක්, කොයි වෙලාවේ හරි සකස් වෙනවා සිත් පරම්පරාව එතකම් හැබැයි එතන මිදීම කියන්නේ සුවයක්.

**උපාසිකාව:** සාධු සාධු සාධු

**ආර්යන් වහන්සේ:** ඉතින් ඔබතුමිය මේක දකිනවා කියන්නේ, මේ ධර්මය අහනවා කියන්නේ ඇත්තට ම භාග්‍යක් හිතා ගන්නවත් බෑ නේද?

**උපාසිකාව:** එහෙමයි, ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේ:** ඔබ තුමියගේම සසරේ ඕඝයට ඔබ තුමිය විසින්ම අවසාන තිත තියනවා.

**උපාසිකාව:** සාධු සාධු සාධු අර්යන් වහන්ස

**ආර්යන් වහන්සේ:** නැත්නම් ඔය සිරස දෙරණ වගේ සතෙක්ගේ කළලයක හරි සකස් වෙනවා.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** අර කොයි තරම් ද බැස ගෙන තියෙන්නේ, මේ පිච්චි පිච්චි නම් ඉන්නේ, දරුවෝ ඉන්නවා, ගෙවල් තියෙනවා, අරවා තියෙනවා, මේවා තියෙනවා, කියලා දැනෙනවානේ ඒ දැනෙන තරමට බැඳීමක් තියෙනවානේ, තණ්හාවක්, ආශාවක්, ඒ තරමට ම බැස ගන්නවා සතෙක්ගේ කළලයක. සමහර වෙලාවට ඔය ටොයිලට් වල පනුවෝ වෙලා ඉන්නේ ඒ ගෙදරම අයිති අය. මොකද ඒ තරම්ම අරවට බැස ගෙන ඉන්නේ. එයාගේ ස්වභාවය අනුව සකස් වෙන්න නෑ මනුෂ්‍ය ආත්මයකට.

**උපාසිකාව:** එයෙමයි

**ආර්යන් වහන්සේ:** ප්‍රේර්ත ස්වභාවවල සකස් වෙන්නේ ප්‍රේර්ත සත්ව ස්වභාව ඒක හරි භයානකයි.

**උපාසිකාව:** එහෙමයි



**ආර්යන් වහන්සේ:** ඒකට හේතුව ආත්ම කථාවක් නෙමෙයි, මේ ශක්ති ස්වභාවය සකස් වෙන්නේ, "ප්‍රිකුවන්ස්" කරනවා. දෙරණ "ප්‍රිකුවන්ස්" කරොත් දෙරණනෙ අහුවෙන්නේ. ඒ වගේ දැන් මෙතන මේ අපේ රාග ද්වේශ මෝහ කියන්නේ අපේ ගින්න. ඕක තමයි "ප්‍රිකුවන්ස්" වෙන්නේ. ඔය තණ්හාව ආශාව ඔතන තමයි අපි කතා කරන්නේ, මේ ඒක තමයි කම්පණය වෙනවා කියන්නේ, ඒක තමයි පිච්චෙනවා කියන්නේ, ඒක තමයි දැවෙනවා කියන්නේ, ඒක තමයි දුක කියන්නේ, එතකොට ඒක නිවෙනවා කියන්නේ, අන්න සංඥා සුකුම වෙනවා කියන එකයි ලෝකයක් නැති බව දකිනතාක් ඒක වෙන්නේ නෑ. තේරෙනවද?

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** ලෝකය මුදවන්න තමයි බුදුන් වහන්සේ ධර්මය දේශනා කරන්නේ. මහණෙනි ඇත කිව්වත් වැරදි නැත කිව්වත් වැරදි. තියෙන ලෝකයක් නෑ කියල බුදුන් වහන්සේ කියන්නේ ඔන්න ඕකටයි. ලොකේ බැසගෙන හිටියොත් මේ අය දුගතියේ වැටෙනවා, හැබැයි ලෝකයක් නැති බව දැක්කොත් මේ අයගේ හිත මිදෙනවා ලෝකෙන්, අන්න සුගති පරායනයි.

**උපාසිකාව:** එහෙමයි, ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේ:** ඒ කියන්නේ, මෙතන කෙනෙක් පුද්ගලයෙක් නෙවෙයි, මේ සකස් වෙන ශක්ති ස්වභාවය, සැකැස්ම, නැති වෙනවා. අර ඝණ ශක්ති ස්වභාවයක් අවශ්‍යයි. අර සත්ව ස්වභාව තුළ සකස් වෙන්න.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** ඝණ ශක්ති ස්වභාවය හට ගන්නේ නෑ බැඳීම නෑ සුකුමයි. ඝණ සංඥා සුකුම වෙනවා කිව්වේ ඕකයි. අර දිව්‍ය ස්වභාව කියලා පෙන්නන්නේ ඇත්තටම මේ ශරීරවත් නෑ, අර කියන්නේ සිත මිස කය නැති බඹලොව, කයක් නෑ, රූපයක් නෑ, ඇඟක් කියලා දෙයක් නෑ, ශක්ති ස්වභාවයක් පමණක් පාවෙන්නේ සිත මිස කය නැති බඹලොව. ඔච්චර ඕවා අවශ්‍ය නෑ මේ ක්ෂණයවත් නෑ කියලා දකින කෙනාට අන්න අනාඝාමී. නැවත උත්පත්තියක් නෑ, බුදුන්වහන්සේ මේ ධර්මය දකින කෙනා සුද්ධාවාස කියලා කියන්නේ ඇත්තටම තැනක් නෑ. ඒ කියන්නේ

කළලෙක සකස් වෙන්නේ නෑ "නහි ජාති ගබ්බසෙය්‍යයියං පුණරේති" කිව්වේ ඒකයි. ගර්භයක සකස් වෙන්න නම් මේ දෙයක් තියෙනවා කියලා දකින්න ඕනි.

**උපාසිකාවඃ** එහෙමයි

**ආර්යන් වහන්සේඃ** දෙයක් තියෙනවා කියල දකින් නැත්නම් දෙයක් නැති බව දකිනවා නම් ගර්භාෂයක සකස් වෙන්නෑ. "නහිජාති ගබ්බ සෙය්‍යියං දිට්ඨිංච, මේ දිට්ඨිය කියන්නේ සත්‍ය දකිනවා කියන එක, දෙයක් නැති බව. "දිට්ඨිංච අනුපගම්ම සීලවා" අන්න එන එන සිත දකිමින් එයා දෙයක් නැති බව දකින සීලයක් එයාගේ ඒ කියන්නේ දිගටම එයා ඒකම දකිමින් දෙයක් නැති ම බවට පත්වෙනවා. "දිට්ඨිංච අනුපගම්ම සීලවා දස්සනේන සම්පන්නෝ' කියන්නේ මෙන්න මේ දර්ශණය, දෙයක් නැති බව දකින දර්ශණය "ධම්ම චක්ඛුෂය විද්‍යා උදපාදී""ආලෝකෝ උදපාදී" "චක්ඛුං උදපාදි" කියන තැන. අන්න දෙයක් නැති බව දර්ශණය දකිනවා. සත්ත්ව පුද්ගල කතාව බොරුවක් බව දකිනවා. එතනින් මිදෙනවා. අන්න "දිට්ඨිංච අනුපගම්ම සීලවා දස්සනේන සම්පන්නෝ කාමේසු විනෙය්‍යය ගේදං නහි ජාතු ගබ්බ සෙය්‍යං පුනරේතිති" ඒ කියන්නේ කම් සැප පිනවන්න කියල නැවත උපදින්න නම් කම් සැප පිනවන්න ඕන කියල සිතක් තියෙන්න ඕනි, කාම භූමිය තියෙන්න ඕනි. එහෙම උනොත් තමයි ගර්භාෂයක සකස් වෙන්නේ. "නහි ජාතු ගබ්බ සෙය්‍යං පුණ රේතිති" ඒ කියන්නේ කිසිම සත්ව කලලෙක සකස් වෙන්නේ නෑ.

**උපාසිකාවඃ** එහෙමයි, ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේඃ** එතනම මිදීමක්, ඒකයි බුදුන්වහන්සේ ශූද්ධාවාසේ කියන්නේ කිසිම කළලෙක සකස් වෙන්නේ නෑ. "න ආගාමී අනාගාමී" ඒ කියන්නේ එතනින් ම නිවීමට පත් වෙනවා ඇත්තටම ඔය සැකැස්ම තමයි ශූන්‍යයි කියල කියන්නේ, ඒකයි "බුද්ධ" කියල කියන්නේ, ඒකයි "අනිමිත්තයි ශූන්‍යයි අප්‍රණිහිතයි ශූන්‍යත චිත්ත විමුක්තියක්" කියන්නේ නැවත සිතක් කොහොමත් සකස් වෙන්නේ නෑ.

**උපාසිකාවඃ** එහෙමයි

**ආර්යන් වහන්සේඃ** සිතක් තියෙනවා කියන්නේ දෙයක් තියෙනවා කියන එකයි. දෙයක් නැත්නම් සිතක් නෑ.



**උපාසිකාවඃ** එහෙමයි

**ආර්යන් වහන්සේඃ** දැන් තේරෙනවානේ?

**උපාසිකාවඃ** එහෙමයි ආර්යන් වහන්ස මට වැටහෙනවා. හොඳටම ඇත්තටම ආර්යන් වහන්ස මම ඔබ වහන්සේට කතා කළේ මට මේ අවබෝධය කරා යන්ට තියෙන අමාරුව

**ආර්යන් වහන්සේඃ** ඕවා මොනවත් බලන් නැතිව ඕවා සේරම අත් හැරල මේ කියපු ධර්මයට ම අවධි වෙන්න. මේ මොහොත විතරයි මේ ක්ෂණය විතරයි. මේකේ දෙයක් නෑ. මේක වේගයක් තුළ සකස් වෙන්නේ ඕක මෙනෙහි කරන්න.

**උපාසිකාවඃ** එහෙමයි, ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේඃ** එතකොට ශබ්ද වර්ණ මේවා නේද මේ එකතු වෙලා තියෙන්නේ කියල දකින්න. ඒවාගේ එතකොට කොහෙද ආත්ම කතාවක් කියෙන්නේ කියල බලන්න. මේ ඇඟ ඇතුළේ සිතක් නෑ, "ස්පාක්" වෙන එකයි සිත කියන්නේ. සිතක් නැති බව මෙනෙහි කළොත් අන්න පටිසෝතය ගඟ ගලන අතට ගලන් නෑ, අන්න මිදීම අර විමුක්ති සුවයට එනවා අන්න එතනින් තමයි චිත්ත විමුක්තිය තියෙන්නේ. සිත නිදහස් වෙනවා හැම දේකින්ම සිත බැස ගන්නේ නෑ. කිසිම දේකට අන්න සිතින් මිදෙනවා, චිත්ත විමුක්තියට පත් වෙනවා. "අප්‍රමාණ චේතො විමුක්තිය" තියෙන්නේ අනුත්තර ඒ උත්තරීතර ස්වභාවයයි මෙතන සත්ව පුද්ගල මනුෂ්‍ය කතාවකුත් නෑ හරි පුදුමයි.

**උපාසිකාවඃ** එහෙමයි, මට හොඳට වැටහෙනවා ආර්යන් වහන්ස. අපි මෙච්චර කල් හොයපු ධර්මය ඔබ වහන්සේගේ දේශනාවලින් තමයි මට ඇහුණේ මට ඇත්තටම කියන්න ඕනි. මම මහණ වෙන්ට අවුරුදු 18 ක කාලේ ඉඳන් ගොඩක් ආශාවෙන් හිටියේ. ඒ හිටියට ටික කාලයක් එහෙම යන්ට බැරි වුණා. ඊට පස්සේ අසනීප නිසා අර සාසනයට ගන්නෑ කිව්වා. හුඟක් බයෙන් හිටියේ මට මේ ධර්මය කරා යන්ට බැරි වෙයි කියලා ඔබ වහන්සේගේ දේශනා අහන කොට ඔබ වහන්සේ දානවනේ "ගිහිවතේ වැඩ සිටින ආර්යන් වහන්සේලා" කියලා එතකොට මට තේරුණා අනේ අපි ගිහියෝ උනාට අපිට පුලුවන්නේ, කියන ශක්තිය මට ආවා ආර්යන් වහන්ස. දැන් මට මහණ වීමේ ඕන කමක් මොකුත් ම නෑ. ඉස්සර මට

මහණ වීමට තියෙන බලවත් කැමැත්ත නිසාම ධර්මය අවබෝධ කර ගන්නට බැරි වුණා. ඔබ වහන්සේගේ දේශනා මුණ ගැහුණාට පස්සේ ඒ සේරම නැත්තටම නැති වෙලා ගිහින් මම දැන් හුඟක් සතුටෙන් ඉන්නේ. මට දැන් බාහිර ප්‍රශ්න මොකුත් නෑ. මම තනියම ඉන්න කෙනෙක් ඔබ වහන්සේගේ දේශනා මම තව අහනවා. මට තව වැඩි දියුණුවට තමයි ඔබ වහන්සේට මම කතා කළේ. කොහොම හරි ධර්මය අවබෝධ කරගන්ට ඕන කියන තැන තමයි මම ඉන්නේ.

**ආර්යන් වහන්සේ:** ඇත්තටම භාග්‍ය වන්තයි ඔබ තුමිය, ඔබතුමියට පසුතැවෙන්න මොනවත් නෑ ඔය තියෙන ඒවා සේරම එවා නිකන් සිතුවිලි විතරයි. මේ අපි හිතනවා අපිට ගොඩක් අසනීප තියෙනවා නම් ඒ හැම දෙයක්ම සිතුවිල්ලක් විදිහටම දකින්න.

**උපාසිකාව:** එහෙමයි ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේ:** හොදයි එහෙනම් ඔබ තුමියට මේ දහම බොහොම විවේකීව මනසට හසුවේවි. බොහොම තැන්පත්ව මෙනෙහි කරන්න.

**උපාසිකාව:** එහෙමයි, ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේ:** හොදමයි, එහෙමනම් තෙරුවන් සරණයි

**උපාසිකාව:** ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා,



# 3

# නිවැරදි නිවන් මග හමුවිය

**උපාසක තුමා:** තෙරුවන් සරණයි ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේ:** තෙරුවන් සරණයි, මොකක්ද ඔබ තුමා අහන ප්‍රශ්නය

**උපාසක තුමා:** ආර්ය උපවාදය

**ආර්යන් වහන්සේ:** ඔව් ඒක වෙන්නේ මෙහෙමයි. හොඳින් ඒක ආකාර කීපයකට දකින්න පුලුවන් එකක් තමයි සම්මුතිය තුළ කතා කරන, සම්මුතියේ තියෙනවනේ අපි සාමාන්‍යයෙන් බුද්ධාගම කියලා අපි විනය පිටකයක් එහෙම හදාගෙන තියෙනවා. එතකොට එතනදී අපි සම්මුතිය විදිහට බුදුන් වදිනවා, සංස්කෘතියක් තුළ අපි ඉන්නවනේ, කටයුතු කරනවනේ. හොඳ කියල අන්තයක් තියෙනවා නරක කියලා අන්තයක් තියෙනවානේ.

**උපාසක තුමා:** ඔව්

**ආර්යන් වහන්සේ:** හොඳ දේවල් කළොත් හොඳ තැනක උපදිනවා නරක දේවල් කළොත් නරක තැනක උපදිනවා කියලා පෘථග්ජන භූමිය තුළ දෘෂ්ඨියක් තියෙනවනේ.

**උපාසක තුමා:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** ඒක ඇවිල්ල දෘෂ්ඨියක් තියෙන්නේ ඒ කියන්නේ අපි ඉන්නවා කියල හිතාගෙන එතකොට සත්තවයෙක් පුද්ගලයෙක් ඉන්නව කියල ගත්තු තැන තමයි කර්ම ඵලය තියෙන්නේ. ඒ කර්ම භූමිය බුදුන් වහන්සේ දේශනා කරන එකක් නොවෙයි. කර්ම භූමිය අබුද්ධොත්පාද කාලෙත් තියෙනවා. ඒ කියන්නේ, මහාමයා දේවිය පන්සිල් රැක්කේ,

මහාමයා දේවිය ආර්ය උපෝසථ සීලය රැක්කනේ. පංච සීලය කියන්නේ, ව්‍රත සමාදමක්නේ ඒ කියන්නේ, මම සත්තු මරන් නෑ, බොරු කියන්නේ නෑ, හොරකම් කරන්නේ නෑ, කාමය වරදවා හැසිරෙන්නේ නෑ, සුරා පානය කරන්නේ නෑ, කියල ව්‍රත සමාදනයක් වෙනව නේද?.

**උපාසක තුමා:** ඔව්

**ආර්යන් වහන්සේ:** එතකොට එතතින් වෙන්නේ අර, පන්සිල් රකිනවා කියපු එක. ඒ කියන්නේ පංච සීලය, ඒවා මහාමයා දේවිය වගේම රාවණා රජ්ජුරුවන්ගේ කාලෙත් තියෙනවා. බුදුන් වහනසේටත් ඒ කියන්නේ තව අවුරුදු 2500 කටත් එහාත් දක්නට ලැබෙනවා. ඒවා සාමාන්‍ය සමාජ සංස්කෘතිය පසුබිම තුළ අර සමාජයේ පැවැත්මට වැදගත් සමාජයක් විදිහට වැරදි කරන කොට සමාජයක් යහපත් වෙන්නැනේ.

**උපාසකතුමා:** ඔව්

**ආර්යන් වහන්සේ:** අන්න ඒ හොද නරක කියන අන්තයක් තියෙන තැනක සමාජයේ සුභසාදනය සදහා ඒ පංච සීලය, ආර්ය උපෝසථ සීලය, ඒ වගේම ඔය කර්ම පථය කියන එක හදාගත්ත එකක්. ඒක සංස්කාර අපි විසින් ම හදා ගත්ත දෘෂ්ඨිය තුළ කෙනෙක් ඉන්නවා ආත්මයක් තියෙනවා ඒ කෙනාට හොදක් වෙනවා නරකක් වෙනවා කියන තැන තමයි ඒක තියෙන්නේ.

**උපාසකතුමා:** ඔව්

ආර්යන් වහන්සේ: අපි මේ ධර්මය පැහැදිලි කරන්නේ, ඒ කියන්නේ මේකේ සත්‍ය පැහැදිලි කරන්නේ සත්‍ය කතාව, ආර්ය උපවාදය කියන එක ඔන්න ඔතන තියෙනවා. ඇයි එතන හොද නරක කියල අන්ත දෙකක් තියෙනවා.

**උපාසකතුමා:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** එතකොට දැන් අපි ඒ සංස්කෘතිය තුළ හදාගත්ත තැන අපි කියනවනේ එතකොට අපි පෙන්නනවනේ තිරිසන් සතාට දෙන දානය උතුම්, ඊට වැඩිය උතුම් දුස්සිලයට දෙන දානය, ඊට උතුම් බුදුන්ට දෙන දානය කියල. හැබැයි බුදුන් වහන්සේ ඔය සේරම කියන්නේ නිගණ්ඨයන්ටනේ, හැබැයි බුදුන් වහන්සේ දේශනා කරනවා මහණෙනි,



දාන දාහක් දෙනවට වැඩිය ධර්ම දානය උතුම් කියල නේද? ඒ කියන්නේ, මේ සිත එක මොහොතක් සත්‍ය දැකල මිදෙන එක උතුම් කියල කියන්නේ ඔය ධර්ම දානය කියන්නේ, දෙයක් නැති බව. ශුන්‍යතාවය දකින එක. ඒකයි උතුම් කියලා කියන්නේ ඒ ධර්ම දානය, දැන් බුදුන් වහන්සේට ඕන වෙන්නේ නිගණ්ඨයෝ, බ්‍රාහ්මණයෝ, ජටිලයෝ, ඒ කියන්නේ මහා බ්‍රහ්මයා ලෝකේ මැව්වා කියන තැනින්නේ එදා බුදු සමය තුළ ඔය බ්‍රාහ්මණ සංකල්පනේ තිබුණේ. දෙයියෝ ලෝකේ මැව්වා කියන තැනනේ මහා බ්‍රහ්මයා ලෝකෙ මැව්වයි කියන තැනනේ.

**උපාසකතුමා:** ඔව්

**ආර්යන් වහන්සේ:** එතකොට ඒ ගොල්ලොනේ මේ බණ අහන්නේ දැන් වගේ බෞද්ධයෝ හිටියේ නෑනේ

**උපාසකතුමා:** නෑනේ එහෙමයි

**ආර්යන් වහන්සේ:** ඒ ගොල්ලෝ දේව ලෝක ඔලුවෙ තියාගෙනනේ ඉන්නේ ඒ ගොල්ලො දැන් හිටියේ ව්‍රත සමාදන් වලනේ. සත්තු මරන් නැති එක, බොරු කියන් නැති එක, කාමය වරදවා හැසිරෙන් නැති එක, සුරා මේරය මේවානේ ඒ ගොල්ලෝ උතුම් කියල ව්‍රතයක් විදිහට හිතුවේ. ඉහළින් තියාගෙන එතකොට ඒක එක අන්තයක්නේ. හොදයි කියන දේවල්නෙ අන්ත දෙකක්නේ හොද නරක කියල. හොද අන්තය තමයි ඉහළින් පෙන්නුවේ. එතකොට එතන ඒකෙම තමයි බුදුන් වහන්සේ මේ ගොල්ලන්ට ධර්මය ගේන කොට හේතුඵල දහමට එන්න එපෑයි. හේතුඵල දහම තුළ දෙයක් නෑනේ සත්වයෙක් පුද්ගලයෙක් නෑනේ. එතකොට මේ සිතනෙ මේ ඔක්කොම කියන්නේ. එතකොට සිත කියල දෙයක් නැති බව දකිනව නම් ධර්මය දකින්න එපැයි. අන්න එතෙන්ට ගේනකොට තමයි දාන දාහක් දෙනවට වැඩිය ධර්ම දානය උතුම් කියන්නේ මේ අයව ගේන්න යනව. අර සිත එක මොහොතක් ඇති වන නැති වන සිත දකින්න කියලා.

**උපාසකතුමා:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** අර ක්ෂණ සම්පත්තියටනේ ගන්නේ ධර්ම දානය කියලා. එතකොට මෙතන ආත්ම කතාවක් නැති වෙනවනේ හේතුඵල දහමට එනවනේ "යේ ධම්මා හේතු පභවා තේසං හේතුං තථාගතෝ" ඒ

තථාගතයන් වහන්සේ හේතු ඵල දහමක්නේ දේශනා කරන්නේ. අස්සජී මහරහතන් වහන්සේ සැරියුත් හිමියන්ට ගිහිකල ධර්මය දන්නවා නේද?

**උපාසකතුමා:** නෑ

**ආර්යන් වහන්සේ:** සැරියුත් හිමියෝ ගිහිකල උපතිස්ස විදිහට ධර්මය සොයාගන යනවානේ. එතකොට අස්සජී මහරහතන් වහන්සේ මුණ ගැහෙනවානේ සැරියුත් හිමියන්ට එතකොට සත්‍ය දේශනා කරන්න කියල ඉල්ලනවනේ සැරියුත් හිමියෝ අස්සජී මහ රහතන් වහන්සේගෙන්. එතකොට අස්සජී මහරහතන් වහන්සේ කියනවනේ මම දන්න දෙයක් නෑ ඒ තථාගතයන් වහන්සේ සියල්ල දත් සේක. ඊට පස්සේ කියනවනේ "යේ ධම්මා හේතු පභවා තේසං හේතුං තථාගතෝ" කියන වාක්‍ය තියෙන්නේ එතනනේ. ඒ තථාගතයන් වහන්සේ හේතුඵල දහමක් දේශනා කරයි කියලා. බුදුන් වහන්සේ මුණ ගැහෙන්න සැරියුත් හිමියෝ යනවනේ එතනින් කියවෙනවනේ කෙළින්ම බුදුන් වහන්සේ දේශනා කරන්නේ හේතුඵල දහමයි කියලා.

**උපාසක තුමා:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** එතකොට මේ හැමෝම ඉන්නේ කර්ම ඵලයේ තමයි. අදත් මේ සංස්කෘතිය තුළ කර්මඵලය ම තමයි තියෙන්නේ. දේව සංකල්පයම තමයි ගොඩක් අයගේ ඔලුවේ තියෙන්නේ දිව්‍ය ලෝකේ යන එකයි නිරයේ යන එකයි තමයි තියෙන්නේ. බුදුකෙනෙක් පෙර නොඇසූ විරූ දහමක් දේශනා කරනවා කියන කොට "පුබ්බෙ අනනුස්සති ධම්මේසු" හේතුං පටිච්ච සම්භූතං හේතු භංගා නිරුජ්ජති" කියල එතකොට හේතුඵල දහම තුළ කර්ම පථය නෑ තේරුණාද?

**උපාසක තුමා:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** හේතුඵල දහම තුළ කෙළින්ම සත්ත්වයෙක් පුද්ගලයෙක් නෑ මේ දැන් හේතු තියෙන කොට, ආලෝකය තියෙන කොට පේනවා අලෝකය නැත්තන් නෑ. කියන කොට සත්ත්ව පුද්ගල කියල කථාවක් නෑ.

**උපාසක තුමා:** "ප්‍රොසෙස්" එකක් විතරමයි.



**ආර්යන් වහන්සේ:** ඔව් එතකොට ආයතන තමයි දකින්නේ, එතකොට ආයතනවලට එනකොට මෙතන සත්ත්ව පුද්ගල දෙයක් නැති බව දකින කොට සේරම තමන්ගේම සිත බව දකින කොට බාහිරින් මිදීමක් "සංවරත්ථෙන සීලානං" කියන තැනට එනවා. ව්‍රතයක් නොවෙයි අර ව්‍රත සමාදානයේ නේ අපි හිටියේ භයටනේ හිටියේ නරක තැනකට යයි කියලා භයටනේ හොඳ කරන්නේ එතකොට එතනත් දෘෂ්ඨියක්නේ තියෙන්නේ.

**උපාසක තුමා:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** දැන් නරක තැනකට යයි කියන භය තියෙනවානේ. දෘෂ්ඨියක්නේ ඒක. එතකොට හොඳ තැනකට යන්න හිතාගෙන හොඳ වැඩ කරන්නේ දැන් මෙතන එහෙම නොවෙයි. බුදුන් වහන්සේ සොබාදහමක්නේ දේශනා කරන්නේ, මෙතනදී කියන්නේ මේ හැමදේම තමන්ගෙම සිත කියලනේ බාහිර තියෙන දෙයක් නෙමෙයි මේ සිතනවා කියලනේ කියන්නේ. එතකොට සිත හැදෙන හැටිනේ මේ තියෙන්නේ. මේ ආයතනවලින් හැදෙනවා කියන එකනේ නේද?

**උපාසක තුමා:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** එතකොට මේ ධර්මය දකින කොට කර්ම පථයත් බිඳ වැටෙනවා. හැබැයි "සංවරත්ථෙන සීලානං" කියන තැනට එනවා. සංවරයෙන් සිල්වත් වෙනවා. ඒකට හේතුව තමන්ගෙම සිත සේරම බාහිර නෙවෙයි, දැන් බාහිර හොරකම් කරන්න සිතක් හම්බවෙන්නේ නෑ. මරන්න බාහිරින් සතෙක් හම්බවෙන්නේ නෑ එයාගේම සිතේ තියෙන සිතුවිලි තමයි එයා පරිහරණය කරන්නේ. එතකොට එයා නිකම්ම සංවර වෙනවා එයාට මරණවා කියන චේතනාවක් එන්නේ නෑ. එයාට මරන්න සතෙක් නෑ හරි පුදුම තැනකට එනවා. හැබැයි මේක අර අතර මැද ඉන්න කෙනාට, කකුල් දෙක දෙපැත්තේ ඉන්න කෙනාට තේරෙන්නේ නෑ, දෙපැත්තෙන් කොයි පැත්තට හරි පනින්න වෙනවා. අතර මැද ඉන්නකම්ම කර්ම පථයට වැටෙනවා හේතුඵල දහමම අවබෝධ කරගන්න වෙනවා. එතකොට අතර මැද තැනක් නෑ ඉන්න. මේ කර්ම පථයෙන් භාගයයි හේතු පථයෙන් භාගයයි කියලා නෑ. ඒ කියන්නේ පෘතග්ජන භූමියේ ඉන්න කෙනාට රහතන් වහන්සේ කියලා පුද්ගලයෙක් ඉන්නවනේ. හැබැයි ආර්ය භූමියේ රහතන් වහන්සේට රහතන් වහන්සේ

කියලා කෙනෙක් නැනේ අනාත්ම ධර්මයක්නේ. එතකොට ආර්ය භූමියේ ආර්යන් වහන්සේ කියන්නේ රහත් වෙනවා කියන්නේ කෙනෙක් නෑ කියන එකනේ නේද?

**උපාසක තුමා:** ඔව්

**ආර්යන් වහන්සේ:** එතකොට කෙනෙක් නැත්නම් මරන්නත් කෙනෙක් නැනේ. රහතන් වහන්සේට ගස් නැනේ, කොළ කඩන්න කොළත් නෑ, ගසුත් නෑ, රහතන් වහන්සේට තියෙන්නේ තමන්ගේම සිතමයි සේරම හරි නේද? රහතන් වහන්සේට පොළවත් නෑ, පසුත් නෑ හාරන්න. හැබැයි ඒ රහතන් වහන්සේට. දැන් ඕක දිහා බලන පෘතග්ජනයා හිතන්නේ ඔහොම නෙමෙයි. රහතන් වහන්සේ ගස්වල කොළ කඩන්නේ නෑ. රහතන් වහන්සේ පොළව හාරන්නේ නෑ, එයා දකින්නේ පොත්වලින් ධර්මය. ධර්මය පොතේ තියෙන්නේ එහෙමයි ලියලා.

**උපාසක තුමා:** ඇයි ඉතින පේන දේනේ ලියන්නේ

**ආර්යන් වහන්සේ:** ඔව් එහෙමයි ලියන්නේ. ඇත්තටම රහතන් වහන්සේ ට කොළත් නෑ ගසුත් නෑ කඩන්න ඒවා සේරම සිතුවිලිමයි. රහතන් වහන්සේට පොළවත් නෑ පසුත් නෑ එකත් සිතුවිලිමයි. රහතන් වහන්සේ කියලා කෙනෙකුත් නෑ. ඉතිං මුගලන් හාමුදුරුවෝ අර ගහල මැරුවයි කියල කියනවනේ පෘථග්ජන භූමියේ ඕක කියනවනේ රහතන් වහන්සේටත් විපාක දෙනවයි කියලා කියනවනේ. දැන් බලන්නකො රහතන් වහන්සේ කියල රහතන් වහන්සේට කෙනෙක් නැනේ. ආර්ය භූමියේ ගහල මරන්න කව්ද ඉන්නේ ආර්ය භූමියේ රහතන් වහන්සේට. කෙනෙක් නෑ පෘථග්ජන භූමියේ අය කියනවා අන්න ගහල මැරුවයි කියල හැබැයි ආර්යන් වහන්සේට එහෙම ප්‍රශ්නයක් නෑ. තේරෙනව නේද මේ කියන එක?

**උපාසක තුමා:** තේරුනා හාමුදුරුවනේ

**ආර්යන් වහන්සේ:** "අන්තෝ ජඩා බහි ජඩා" නේද? දැන් මේක පෘථග්ජනයෙක්ගෙන් ඔය ප්‍රශ්නේ ඇහුවොත් එහෙම කියයි ඔව් තියෙනවා කියයි. ආර්යන් වහන්සේ නමකගෙන් ඇහුවොත් කියයි රහතන් වහන්සේ කියල කෙනෙක් නෑ කියයි. එහෙම ඉතිං එයාට කොහොමද විපාක දෙන්නේ සිත තුළින් පනවන එක දන්නේ රහතන් වහන්සේම



තමයි. රහතන් වහන්සේ පනවන් නෑ සත්ත්වයෙක් පුද්ගලයෙක් රහතන් වහන්සේ මේ කය මමය කියල දකින්නේ නෑ. නමුත් පෘථග්ජන කෙනා දකිනවා මෙතන කෙනෙක් ඉන්නවා කියල. එයා දෘෂ්ඨියෙන් ඉන්නේ ඒක තමයි ඔය ප්‍රශ්නේ දැන් ඔය ආර්ය උපවාදයට අහුවුවෙනවා කියල කියන්නේ, දැන් ආර්යන් වහන්සේ නමක් නේ, දැන් ආර්යන් වහන්සේ නමකටනේ මේ කියන්නේ ආර්යන් වහන්සේට ගැරහුවොත් හරි ආර්යන් වයන්සේට අකටයුක්තක් කළොත්හරි ඒක ආර්ය උපවාදයට අහුවෙනවා කියලනේ හිතන්නේ නේද?

මෙම දේශනාවේ ඉතිරි කොටස මතු දේශනාවකින් ඉදිරිපත් කරමි.

# 4

# නිවැරදි නිවන්මග හමුවිය

**ආර්යන් වහන්සේ:** තෙරුවන් සරණයි

**උපාසිකාව:** බුද්ධෝත්පාද ආර්යන් වහන්සේ නේද?

**ආර්යන් වහන්සේ:** ඔව් කතා කරන්න

**උපාසිකාව:** බුද්ධෝත්පාද නාලිකාවේ ධර්ම දේශනා මම අහනවා. මහා නිධාන සූත්‍රය සම්බන්ධ ඔක්කොම විස්තර කරල ඉවරයි ද? ආර්යන් වහන්ස දැන්.

**ආර්යන් වහන්සේ:** මහා නිධාන සූත්‍රය කොටස් හතරකට අවශ්‍ය ටික ඉදිරිපත් කළා නමුත් ඒකේ තව තියෙනවා. ඒක ඉස්සරහට බලලා තමයි කරන්න ඕනි. අවශ්‍යම ටික ඉදිරිපත් කළේ එතන නාම රූප විඤ්ඤාණ මේ සිතට එන අරමුණෝ සත්‍ය දකින නිවන්මගයි. බුදුන් වහන්සේ පෙන්නන්නේ කියන එක. විඤ්ඤාණය බැස ගන්නේ නැත්නම් නාම රූප නෑ. ඒ කියන්නේ අපි මේ හිතනදේ බාහිර තියෙනවා කියලා ගත්ත එක තමයි මේ විඤ්ඤාණය කියන්නේ. මේවා වෙන් කරන්න බෑ සිතට එන අරමුණ දකින එකයි ඔතන තියෙන්නේ ඔන්න ඕක පෙන්නන්න තමයි ගත්තේ.

**උපාසිකාව:** එහෙමයි ආර්යන් වහන්ස එතකොට විඤ්ඤාණය බැස ගන්නේ නෑ කියල අර ඔබ වහන්සේ කියනවනේ. අර දෙරණ අයි ටී එන් අල්ලනවා වගේ

**ආර්යන් වහන්සේ:** නෑ ඒ අපි කියන එක නෙවෙයි ඔය අරගන්නේ ගොඩක් අය ආත්ම සංඥාවකින් තමයි ඔය දිහා බලන්නේ. ආත්ම දෘෂ්ටියකින් තමා බලන්නේ. නමුත් එහෙම නැතුව බැලුවොත් මෙන්න



මෙහෙමයි කතාව. ඒ කියන්නේ දැන් ඔතන යුක්තානුව තුළ ශෛල වර්ධනය සිද්ධ වෙනකොට එතනම දැනෙන ස්වභාවය එතනම සකස් වෙන එකක්. දැන් හොදට බලන්න ඕකේ තියෙන සියුම් බව. දැන් අර සෛල වර්ධනයේ ස්වභාවයත් එක්කම දැනෙන ස්වභාවය තමයි නාම රූප කියන්නේ. ඒ කියන්නේ මෙතන අපි අර ස්කන්ධ මට්ටම නෙමෙයි මේ කියන්නේ. ඇසේ උපතයි මහණෙනි උපත කියන අර "සබ්බේ සංඛාරා" කියන මට්ටම නෙමෙයි. මේ එහෙම කතාවක් නෙමෙයි, එතන තමයි ඔය ආත්ම කතාව හැදෙන්නේ. දැන් ඔය ජාති ධම්ම සූත්‍රයේ පෙන්නන්නේ එතනනේ ජාතිය පනවන්නේ බුදුන් වහන්සේ එතන තමයි ඔය කතා කරන දෘෂ්ටිගත ඔය ආත්මය හැදෙන තැන. ජාති ධම්ම සූත්‍රය පනවන තැන ජාති ධම්ම සූත්‍රයේ පනවනවා "ස්කන්ධානං පාතුභාවෝ ආයතනං පටිලාභෝ අයං උච්චති ජාති" මහණෙනි ඇසින් දෙයක් බලලා දෙයක් කියල ගත්තොත් එතනයි ජාතිය. "සබ්බේ සංඛාරා" එතනයි පනවන්නේ මව් කුසෙන් එළියට ඇවිල්ලා දෙයක් කියල දැන් පුංචි දරුවා දන්නේ නැනේ. මුලින් ප්‍රභාෂ්වර චිත්තයනේ, හැබැයි එතන අවිද්‍යා පච්චයා සංඛාරා කියන්නේ දෙයක් කියල අන්න හඳුනාගන්නවා. බිත්තිය, මේසය, අම්මා, තාත්තා අන්න එතනයි උපත. ඇසේ උපතයි මහණෙනි උපත ජාති ධම්ම සූත්‍රයේ අන්න එතනයි ආත්මය පනවන්නේ. එතන තමයි අර ආත්ම දෘෂ්ටිය ගැළපෙන්නේ, මොකද එතන ඉදන් මම ඉන්නවා කියන සංඥාව එනවා දරුවට.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** නමුත් මෙතන මව්කුසේ එහෙම සංඥාවක් නෑ. සබ්බේ සංඛාරා පනවන්න බෑ එතකොට එතන ඒ ජාතියේ හටගන්න උපත පනවන්න බෑ. සබ්බ සංඛාරා පනවන්න බෑ. දැන් මව් කුස ඇතුලේ සිද්ධිය ඇවිල්ල ගහක මලක් පිපෙන කොට එතන ඩිම්බ කෝෂයක් තියෙනවනේ. එතනත් එතකොට රේණුවලින් ඩිම්බ පරාගනයක් සිද්ධ වෙනවනේ.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** එතනත් දැනීමක් සිද්ධ වෙනවනේ, එතන ඊළඟ බීජය සකස් වෙනවනේ. එතකොට ඒ හා සමාන ස්වභාදහමේ සිද්ධියක් මෙතන සිද්ධ වෙනවා. දැන් හොඳටම තේරෙනවා ඒ වගේම සිද්ධියක්

එතන ඩිම්බකෝෂයෙත් තියෙනවා පරාගනයක් තියෙනවා එතනත් බීජයක් හටගන්නවනේ මේකත් ඒකමයි.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** ඒක එතකොට ස්කන්ධ මට්ටමක් හරිද දැන්? ස්කන්ධ මට්ටමක් කියන එක උපාදාන මට්ටමක් නෙවෙයි. දැන් මෙන්න මෙහෙම දෙයක්, ඔයිටත් සියුම් පැත්තක් ඔය සූත්‍රයේ අපි පෙන්නල තියෙන්නේ ඕක නෙමෙයි. ඇත්තම කිව්වොත් තවත් ගැඹුරට ඕනිම විදිහට මේවා පැහැදිලි කරන්න පුලුවන්. එතකොට කෙනෙක් දෘෂ්ඨිගත වෙලා මේකයි මේකයි කියන එකක් අපි ගාව නෑ, දෘෂ්ඨි නෑ. මේක පැහැදිලි කරනවා ස්වභාදහම වගේ හරියට හුළඟ වගේ ඒ කියන්නේ, ඔන්න ඔතන බැලුවොත් ඔතන දැනෙන ස්වභාවයක් අපි කතාකරන්නේ, අපි කතා කළොත් එහෙම, මේ දැනෙන ස්වාභාවයට තමයි විඤ්ඤාණය කියන්නේ. අපි කතා කරන කම්ම විඤ්ඤාණ ගති විඤ්ඤාණ එතකොට අපි කතා කරනවා පටිත්තිත විඤ්ඤාණ, අප්පටිත්තිත විඤ්ඤාණ, අපි කතා කරනවා අනිදස්සන විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ, ඝාණ විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ. එතකොට චක්ඛු විඤ්ඤාණ එතකොට මොනවද මේ විඤ්ඤාණ? මේ එකක්ම නෙමෙයි.

**උපාසිකාව:** ඔව්

**ආර්යන් වහන්සේ:** ධර්මය ගවේෂණය කරන අය පොත්වලට ම සීමා වුණාම විඤ්ඤාණය පනවා ගන්නවා තැනකට එහෙම එකක් නෑ කියලයි අපි කියන්නේ.

**උපාසිකාව:** හොදමයි ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේ:** ඒ කියන්නේ දැනෙනව නම් ඒ දැනීමට පාවිච්චි කරන වචනෙ දැනීමනේ. ඒ වගේම වචනයක් විතරයි යම්කිසි දැනීමකට විඤ්ඤාණය කියල භාවිතා කරන එක. එතකොට ඒක අපිට සමාන්‍යයෙන් මේ දැනෙන්නේ මොකක්ද? කරුණාවක්ද? මෛත්‍රියක් ද? එහෙම නැත්නම් මේ දැනෙන්නේ සීතලක්ද? රස්ණයක්ද? මේ දැනෙන්නේ එහෙම නැත්නම් ඔය මොකක් හරි දැනෙන දේත් එක වචනෙ කිව්වට සමාන නෑනේ.

**උපාසිකාව:** එහෙමයි ආර්යන් වහන්ස



**ආර්යන් වහන්සේ:** අන්න ඒ වගේ මේ විඤ්ඤාණෙත් සමාන නෑ. තැනේ හැටියට ඒක අවබෝධ කර ගන්න ඕනි. මේ භාෂාව කියන එක අපි භාවිතා කරනවා විතරයි. භාෂාව කියන්නේ පරම සත්‍යක් නොවෙයි ඒවා වචන ඒවා වෙනස් කරන්න පුලුවන්. වෙනස් වෙනවා ඒ වගේම ඒක භාවිතා කරනවා විතරයි. ඒ කියන්නේ යමක් අවබෝධ කරගන්න භාෂාව උපකාරයක් විදිහට භාවිතා කරනවා විතරයි. එතකොට මේ ප්‍රශ්න ඔක්කොම ලිහිලා යනවා. එතකොට අපිට තේරෙනවා මෙතන යුක්තානුවක් සෛල විභේදනයක් තුළ අපි දන්නවා මව් කුස තුළ දරුවෙක් හම්බවෙන්න ඉන්න අම්මා කෙනෙක් වෛද්‍යවරයෙකුට පෙන්නුවාම "ස්කෑන්" කරල බලනවා මේ දරුවා හොඳින් ඉන්නවද කියලා. එතකොට අපිට පේනවා ඒ කළලල යුක්තානු අවස්ථාවක් ඒ වගේම සෛල වර්ධනය සිද්ධ වෙන අවස්ථා ඒ වගේම අපිට "ස්කෑන්" මැෂින් එකෙන් අපිට පේනවා මේ දරුවා දඟලන ස්වභාවය.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** එතකොට අපිට තේරෙනවා මෙතන තියෙන නලියන ස්වාභාවය. අර මස් ගුලිය වගේ නලියන ස්වභාවයක් තියෙනවා ඒ නලියන ස්වභාවය තුළ අපිට තේරෙනවා එහෙනම් දැනෙන ස්වභාවයක් මෙතන තියෙනවා. අන්න ඒ දැනෙන ස්වභාවය ඉස්මතු වෙලා තමයි මේ ටික විශාල විද්‍යාවක් වෙනවා. පැහැදිලි කරන්න ගියොත් ලොකු කතාවක් තියෙනවා මේ ඇස, කණ, දිව, නාසය හැදෙන හැටි. අපි කිව්වොත් සෘතු නියාම, කම්ම නියාම, බීජ නියාම වගේ ම, ඒ කියන්නේ ජානවල ඒ ස්වභාව ගැන වෙනම ම පර්යායක් තියෙනවා මේකේ. පැහැදිලි කරන්න විද්‍යාත්මක පැත්තෙන්, ඒ විදිහට කළලය සකස් වෙන ආකාරය. අපි බිත්තරයක් ගත්තත් එහෙමයි අපි ගත්තොත් හැම දෙයක්ම, ඒ කියන්නේ පොළොවෙන් බුබුළක් ඇවිල්ල හත්තක් පිපුණත් එහෙම නැත්නම් වතුර බිංදුවක්, පෙණ පිඩක් උණත් මේ හැම එකකම සොබාදහමක් තියෙනවා. කොටින්ම කියනවානම් පෘථිවියේ තියෙන සාරය මුලක් ඔස්සේ උඩට එන එකෙත් ස්වභාදහමක් තියෙනවා වැඩි දෙයක් ඕනි නෑ කටට දාන කෑම ටික ආමාශය හරහා යන කොටත් එතන ස්වභාදහමක් තියෙනවා. චුෂණ පොම්පයක් විදිහට ඒක ක්‍රියාත්මක වෙන ආකාරය රස්ණය වැඩිවෙන කොට උණු වෙන එක මේක විශාල විද්‍යාවක් වෙනවා පැහැදිලි කරන්න.

ගියොත් ලොකු කතාවක් තියෙනවා මේ ඇස කණ දිව නාසය හැදෙන හැටි අපි කිව්වොත් සෘතු නියාම කම්ම නියාම බීජ නියාම වගේම ඒ කියන්නේ ජානවල ස්වභාව ගැන වෙනම ම පර්යායක් තියෙනවා මේකේ පැහැදිලි කරන්න. විද්‍යාත්මක පැත්තෙන් ඒ විදිහට කලලය සකස් වෙන ආකාරය. අපි බිත්තරයක් ගත්තත් එහෙමයි. අපි ගත්තොත් හැම දෙයකම ඒ කියන්නේ පොළවෙන් බබුලක් ඇවිල්ල හත්තක් පිපුණත් එහෙම නැත්තම් වතුර බිංදුවක් පෙණ පිඩක් උනත් මේ හැම එකකම සෙබාදහමක් තියෙනවා. කොටින්ම කියනවා නම් පෘථිවියේ තියෙන සාරය මුලක් ඔස්සේ උඩට එන එකෙත් ස්වභාවදහමක් තියෙනවා. වැඩි දෙයක් ඕන නෑ කටට ගන්න කෑම ටික ආමාශය හරහා යන කොටත් එතන ස්වභාදහමක් තියෙනවා. වුසන ලොම්පයක් විදිහට ඒක ක්‍රියාත්මක වෙන ආකාරය රස්ණය වැඩි වෙනකොට උණු වෙන එක  මේක විශාල විද්‍යපාඩමක් වගේ. නිවන් මගට වෙච්චර දේවල් අවශ්‍ය නෑ කියල අපිට තේරෙනවා.

**උපාසිකාවः** ආර්යන් වහන්ස ඉස්සර අපි අහල තිබුණේ විඤ්ඤාණයක් බැස ගන්නවා කියලානේ එහෙම දෙයක් නෙමේ ද?

**ආර්යන් වහන්සේः** බුදුන් වහන්සේ එහෙම දෙයක් කියලා නෑ බුදුන් වහන්සේ ප්‍රති සන්ධි සිත් ගැන කතා කරන්නේ නෑ. බුදුන් වහන්සේ "චුති" සිත් ගැන කියලත් නෑ, ප්‍රතිසන්ධි සිත් ගැන කියලත් නෑ. බුද්ධ දේශනයක් නෙවෙයි ඔය කියන්නේ. ඔය කියන්නේ. රේණුකානේ ඡන්දවිමල හාමුදුරුවෝ ලියපු එක, ඒ හැමුදුරුවන්ට ඔය ආභාෂය එන්නේ බුරුමය පැත්තෙන්.

**උපාසිකාවः** එහෙමයි ආර්යන් වහන්ස ඔබ වහන්සේ කියනවනේ අර ගලක් වතුරට දැම්මම ඒ වතුර ටික ගිහිල්ලා බිත්තියේ හැප්පෙනවා වගේ මෙතනින් අයින් වෙන කොට ඒ අනුව ශක්තියක් යනවා කියලා. ඒ වගේ දෙයක් ද මෙතන සිද්ධ වෙන්නේ.

**ආර්යන් වහන්සේः** ඒක වෙනමම මාතෘකාවක් තාම පැහැදිලි කරල නෑ ඒක අපි. වෙනමම සිද්ධියක් මෙතන තියෙනවා ඒක. ඔය එකක්වත් නෙවෙයි බුදුන් වහන්සේ මනාකොට පැහැදිලි කරනවා විඤ්ඤාණය කියන්නේ එහෙම යන එකක්වත් තියෙන එකක්වත් නෙමෙයි. විඤ්ඤාණය කියන්නේ එතන සකස් වෙන එකක්. ස්පාක් වෙනවා වගේ



ඇතිවෙන නැති වෙන ස්වභාවයක්. ඒක තමයි මුලු පෘථිවියේම අපි කතා කරන හැම දේකම තියෙන්නේ ඕක. ඇත්තටම දෙයක් කියල දෙයක් නෑ මේ භාෂාවේ මේකෙ තියෙන්නේ මෙන්න මේකයි අවබෝධ කරන්න තියෙන්නේ.

**උපාසිකාවः** එහෙමයි

**ආර්යන් වහන්සේः** පෘථිවිය හැදිල තියෙන්නේ වේගයක් නිසයි. එතකොට මේ වේග රූපයකට සියල්ල යටයි අපි ඒක පැහැදිලි කරනවනේ පැයට කි මී 187 වේගයෙන් පෘථිවිය කැරකෙනවා විද්‍යාඥයෝ කියන විදිහටම  අපි පැහැදිලි කරනවනේ ක්ෂීර පථයක් හැදෙන හැටි පෘථිවිය ඇයි සූර්යා වටා කැරකෙන්නේ. අපිට තේරෙනවා අර වේගයකට දූවිලි අංශු කැරකීම, ස්පඨිකයක්, ඝනයක්, පෘථිවියක් හැදෙන හැටි. බ්‍රහස්පති ග්‍රහය වුණත් තාම තියෙන්නේ වායුමය අවස්ථාවේ. ඒක කැරකෙනවා අපිට තේරෙනවා, ඒක ඝන වෙනවා ටික ටික අර අංශුමය ස්වභාවය ඝන වීම තුළයි පෘථිවි පෘෂ්ඨය හැදිල තියෙන්නේ. එතකොට කැරකීම තුළ. මෙතන ගුරුත්වයක් බලපාල තියෙනවා, මේ එකට කැරකෙන්නේ මේ අංශු ටික, පිට යන්නේ නෑ. දැන් අපිට තේරෙනවා වායුගෝලය කොහොමද හැදිල තියෙන්නේ කියල. දැන් ශක්තියක් ගැන කතා කරන කොට ශක්තිය අන්ත දෙකක්ව කැරකීම තුළයි සිද්ධ වෙන්නේ, ඒ කියන්නේ අපි ගල් දෙකක් ගැට ගහලා ලණුවක දෙපැත්තේ එක ගලක් හයියෙන් විසි කලාම අනිත් ගලත් වේගෙට ඇවිල්ලා දෙපැත්තට වැටෙනවා ඊට පස්සේ බඹරයක් වගේ කැරකෙනවා. ඒක අපි අත් හදා බලලා තියෙනවා ඒක බුමරංගේ වගේ කැරකෙන්න ගන්නව. එක ගලක් විසි කරපුවාම අනිත් ගලත් ඇවිල්ලා දෙක දෙපැත්තට දෝලනය වෙනවා. දෝලනය වෙලා ඒක විසින් බල ගැන්විලා කැරකෙන්න ගන්නවා. අපි මේ කතා කරන ධර්මය ඇත්තටම පොතක තියෙන දෙයක් නෙමෙයි. ඇත්තටම මේ ධර්මය ප්‍රායෝගික දෙයක් ප්‍රායෝගික දේවල් වලින්මයි ඒ දේ දකින්න හැකියාව තියෙන්නේ. ප්‍රායෝගිකව හැමදාම ධර්මය දකින කෙනාට මේ විඤ්ඤාණය හැදෙන හැටි අපි මේ කියන්නේ.

**උපාසිකාවः** එහෙමයි

**ආර්යන් වහන්සේः** විඤ්ඤාණය කියන්නේ ශක්ති ස්වභාවයක් ම තමයි. එතකොට පෘථිවියේ තියෙන ගුරුත්වාකර්ෂණය කියන්නෙත්

ශක්තියක්මයි. ඒක ඇතිවෙලා තියෙන්නෙත් අපිට හොදට තේරෙනවා මේ නොගැලපෙන අන්ත දෙකක් තියෙනවා නම් මැද්දේ තියෙන්නේ ශක්තියක්. අපි දැන් කොලේක ලියනවා ධන සෘණ කියලා අපි දන්නවා අපි ඉගෙන ගත්ත දත්ත අනුව ධන හා සෘණ කියන්නේ අන්ත දෙකක්.

**උපාසිකාව:** එහෙමයි, ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේ:** සාමාන්‍යයෙන් ඒක බැටරියක උණත් ගහනවා ධන සෘණ කියලා. මේ දෙක මැද්ද අනිවාර්යෙන්ම දෙකටම සම්බන්ධයක් නෑ. මැද්ද ධනත් නෙවෙයි සෘණත් නෙවෙයි. මැද්දේ අනිවාර්‍ය්‍යයෙන්ම "ෂෝට්" එකක් තියෙනවා ඕක තමයි ඔය දෙපැත්තෙන් ගන්න බැටරියේ වයර් එක වුණත් දෙපැත්තේ ධන සෘණ දෙකේ කම්බි දෙකක් ගෙනල්ල ස්පාක් කරපු ගමන් ෂටස් ගාලා ෂෝට් වෙනවා. ඕකම තමයි විද්‍යුතයත් බලන කොට. ඒ ෂෝට් වෙන එක තමයි, බලන කොට හැම උපකරණයක්ම වැඩ කරන්න බලපාන්නේ. වයර් දෙකක් එකට "ෂෝට්" කරල නෙමෙයි ද මේ "ප්ලග්" වල තියෙන්නේ "ෆ්රීජ්" එක "ඒ සී මැෂින්" එකක් ගත්තත් මේවාට එනජි එක ඇවිල්ල තියෙන්නේ කොහෙන්ද "ෂෝට්" කරලනේ.

**උපාසකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** එතකොට මේක ස්වභාදහමක තියෙන එකක් ඒ කියන්නේ මුලු පෘථිවියම තියෙන්නේ ධන සෘණ උත්තරධ්‍රැවය දක්ෂිණ ධ්‍රැවය කියල අපි දන්නවනේ. ඒතකොට පෘථිවිය කරකැවීම තුළ අන්ත දෙකක් හැදිල "ෂෝට්" එකක් ඇතුලේනේ, දැන් ගුරුත්වාකර්ෂණ ශක්තිය හැදිල තියෙන්නේ අපි ආරෝපණය වෙලා ඉන්නවා කිව්වේ ඒකනේ. අපි ධන සෘණ ආරෝපනයකට කොටුවෙලානේ ඉන්නේ, අපි ඉන්නේ බඹරයක් උඩනේ. පෘථිවිය පැයට කිලෝ මීටර් 187 ක වේගයෙන් කැරකෙනවා කියන්නේ අපි ඉන්නේ බඹරයක් උඩ. අපි මේ නිශ්චල වස්තුවක ඉන්නවා නෙමෙයි. වේගය වැඩි කමට අපිට මේක පේන්නේ නෑ අපිට ඉන්ද්‍රිය ගෝචර නෑ ඇත්තම කතාව.

**උපාසිකාව:** එහෙමයි, ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේ:** දැන් අපි අභ්‍යවකාසේම ගත්තොත් අර විද්‍යාඥයෝ පෙන්නන විදිහටම "ඩාක් මැටර්ස්" ඩාක් එනර්ජි" කියල කියන විදිහටම එකම අංශු ස්වභාවයම කියල ගත්තොත් පේනවා මේ කතාව, එතකොට



ඒ අංශු ටිකමනේද මේ කැරකිල තියෙන්නේ කියලත් පේනවා. එතකොට ඒකෙන්ම තේරෙනවා හැදිල තියෙන පෘථිවි ශක්තිය විශ්ව ශක්තියට සමාන නෑ, පෘථිවි ශක්තිය ඒක චුම්භක ශක්තිය ඇතුළත කොටුවෙලා තියෙන එකක් එතකොට ඒ ශක්තිය අරකෙන් "කන්වර්ට්" වෙලා හැදුණු එක ඇත්ත කරකැවීම තුළ. නමුත් මේ චුම්භක ශක්තියත් එක්ක හැදුණ පෘථිවි ශක්තිය වෙනස්. ඒක නිසා තමයි ඒකේ පදාර්ථ හැදිල පටක හැදිල ජලය හැදිල ජීවින් හැදිල එතකොට මේ සේරම තියෙන්නේ චුම්භක ශක්තියක් ඇතුලේ. මේක ඇවිල්ලා මේක ඒ ටී පී ශක්තිය ඒ කියන්නෙ හිරු එළිය ආලෝකය හැමදේම මේකට බලපාලා තියෙනවා. මේ භ්‍රමණය ඇතුලේ ඇතිවෙල තියෙන ශක්තිය ඇතුලේ "කන්වර්ට්" වීමට සියල්ල බලපානවා. ඒ කියන්නේ වේගය බලපානවා බන්ධන ශක්ති ස්වභාව බලපානවා. අපි කියනවානේ ඕජා රූප මේවට වෙනින් වෙනින් නම් තියෙනවා. පඨවි, ආපෝ, තෙජෝ, වායෝ, වර්ණ, ගන්ධ රස, ඕජා කියලා මේ "කන්සෙප්ට්" එක මේක ඇතුළෙයි තියෙන්නේ එතකොට මේක ඇතුලෙම තවත් ශක්තියක් හැදිච්චි එකක් තමයි විඤ්ඤාණ ශක්තිය කියන්නේ විශ්ව ශක්තියේ තියෙන ''ඩාර්ක් මැටර්ස්" "ඩාර්ක් එනර්ජි" කියන ස්වභාවයත් පෘථිවිය ඇතුලේ තියෙන ගුරුත්වය ඇතුලට කොටුවුණු පෘථිවි ශක්ති ස්වභාවයක් නෙමෙයි මේ විඤ්ඤාණ ශක්තිය කියන්නේ වෙනමම එකක්.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** ඒක හැදිල තියෙන්නේ මේකේ පටක හැදිල මේකෙ තියෙන වතුර හැදිල මේ අංශු ස්වභාවයම තමයි මේ සේරම "ස්පාක්" වෙන වේගයක් තුළයි තියෙන්නේ. වේගෙටයි මේ ඔක්කොම තියෙන්නේ. මේ මේකේ නැත්තම් ඔක්කොම ඉවරයි. පෘථිවිය නැවතුනොත් ඒ කියන්නේ පෘථිවියේ වේගය නැවතුනොත් ගුරුත්වයත් ඉවරයිනේ, ඔක්කොම අභ්‍යවකාශෙට ගියානේ.

**උපාසිකාව:** එහෙමයි, ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේ:** ඔබ තුමියට වෙන ප්‍රශ්නයක් තියෙනවද?

**උපාසිකාව:** ඕජා, වර්ණ, ගන්ධ රස කියන එක පැහැදිලි නෑ

**ආර්යන් වහන්සේ:** ඕජා කියන්නේ වේග රූපේ තමයි මේ සේරම ඕජා රූපෙටයි හැදෙන්නේ ඒ කියන්නේ සෝතය කියන්නේ වේගයමයි.

**උපාසිකාවඃ** අපි හිතන් හිටියේ ඕජාව කියන්නේ ශබ්දයට කියලා.

**ආර්යන් වහන්සේඃ** ශබ්දය කියන්නේ වේගයමයි ශබ්දය වේගෙටනේ හැදෙන්නේ ඒ ශබ්දය පෘථිවියේ වේගයට "කම්පෙයාර්" වෙනවා. අපේ කර්ණ සංඛ පටලය හෙලවෙන එකටයි අපි මේ ශබ්දය කියන්නේ ශබ්දය කියන්නේ ඇත්තටම එළියේ තියෙන දේකට නෙමෙයි මේකේ කියන්න ගැඹුරු තැන් තියෙනවා. ඒ කියන්නේ මේකේ වෙනම ස්වභාව ටිකක් අවබෝධ කරන්න තියෙනවා. ශබ්දය කියන්නේ කර්ණ සංඛ පටලය හෙල්ලෙන එක කියල හිතන්නකො.

**උපාසිකාවඃ** හොඳමයි

**ආර්යන් වහන්සේඃ** දැන් කර්ණ සංඛ පටලය හෙලවෙන්න වේගයක් එපැයි. ඒකනේ අපි ශබ්දය කියන්නේ. අපේ කර්ණ සංඛ පඨලය හෙල්ලෙන්නේ නැත්නම් අපිට ශබ්දයක් නැනේ බිහිරියි නේ. එහෙනම් කර්ණ සංඛ පටලය හෙල්ලෙන්න වේගයක් එපැයි. එහෙනම් වේගෙට ඇවිල්ල හුළඟ වගේ වදින එකක්නේ කර්ණ සංඛ පටලය හෙල්ලිලා තියෙන්නේ කාටවත් මේක නෑ කියන්න බැනේ.

**උපාසිකාවඃ** හොඳමයි

**ආර්යන් වහන්සේඃ** තනිකර ඕජා රූපයක්, මේ සේරම, ඕක විතරක් නෙමේ පටක පවා වේග රූපෙකට තියෙන්නේ ඒ කියන්නේ රූප කලාප 54කින් ප්‍රසාද රූපයක් හැදෙන හැටි අභිධර්ම දේශනාවල පෙන්වන්නේ බාහිරින් නෙමෙයි. මේ ප්‍රසාද රූප කියන්නේ. චක්කු ප්‍රසාද රූපයක් හැදෙන හැටි බුදුන් වහන්සේ දේශනා කරන්නේ සේරම "චිත්තෙන නීයති ලෝකේ" සිත තුළ හැදෙන ලොකේ, ලොකේ මැවෙන්නේ හිතක ප්‍රසාද රූපයක් හැදෙන හැටි රූප කලාප 54, කම්ම, චිත්ත, සෘතු, ආහාර කියන එක චතුසමුට්ඨානවල පෙන්වන්නේ දසක. දසක විදිහට ආයතනයෙන් ආයතනයට පෙන්නන්න පුලුවන්. චක්ඛු ප්‍රසාද රූපයට තමයි රූප කලාප 54ක් පෙන්නන්නේ පැහැදිලි කිරීමක් තියෙන එකක් මේක ජීවිති ඉන්ද්‍රිය රූප, භාව රූප මේ ඔක්කොටොම රූප රූප කිව්වට මේ සේරම දැනෙන දැනීම් තමයි රූප කියන්නේ වෙන ඒව නෙවෙයි.

**උපාසිකාවඃ** එහෙමයි, ආර්යන් වහන්ස



**ආර්යන් වහන්සේඃ** ඔය දැනෙන දැනීම් සේරම එකතු වෙලා තමයි මේ චක්කු ප්‍රසාදය තුළ රසදිය වැටෙනවා වගේ මේ ප්‍රතිබිම්භය වැටෙන්න හේතුව තේරුණාද?

**උපාසිකාවඃ** එහෙමයි, ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේඃ** මෙතනදී මෙහෙම දෙයක් කියන්න ඕනි. විශ්ව ශක්තියෙන් හැදුණා පෘථිවි ශක්තිය "කන්වර්ට්" වෙලා හැදුණ එකක්, ඒ කියන්නේ බුදුන් වහන්සේ පෙන්වනවා මේ ස්වභාවය දැන් ගිතෙල් කිරි බවට පත් කරන්න බෑ කියල දේශනා කරනවනේ, බුදුන් වහන්සේ ඒ කියන්නේ අපි කිරි අරගෙන චීස් හැදුවොත් චීස් කියන්නේ කිරි නෙවෙයි කියල කියනවනේ. ඔය වගේ බුදුන් වහන්සේ ඔය උපමාව දෙන්නේ මේ ආත්මය හැදෙන එකට. ආත්මය හැදෙන්නේ ශබ්ද වර්ණ එකතු වෙලා උනාට ආත්මය කියන්නේ ශබ්ද වර්ණ නෙවෙයි. ඊට පස්සේ අපි ගන්නවා ඒක ආත්මයක් කියලා. නමුත් මෙතන ශබ්ද වර්ණ විතරයි තියෙන්නේ. ඒක අවබෝධ කරන එකක්. ඒක තමයි බුදුන් වහන්සේ කියන්නේ කිරි වලින් හැදෙන ගිතෙල් නැවත කිරි කරන්න බෑ කියලා අපි ආත්මයක් කියා හිතන එක අපිට දැනෙන් නෑ. ශබ්ද වර්ණයක් කියලා. මොකද අපි ඉන්නේ ඒක ඇතුළේ. මේ අපේම චිත්ත ස්වභාවය හැදෙන හැටි චිත්තාරෝපණය ගැනයි අපි මේ කතා කරන්නේ.

**උපාසිකාවඃ** එහෙමයි, ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේඃ** අර විශ්ව ශක්තියෙන් "කන්වර්ට්" වෙන එක අර චීස් කිරි කරන්න බෑ වගේ පෘථිවි ශක්ති ස්වභාවය විශ්ව ශක්ති ස්වභාවය අතර තියෙන වෙනස දකින්න ඕනි. ඒ වගේම ගුරුත්වාකර්ෂණය ඇතුළේ පෘථිවි ශක්තිය ඇතුලේ ජීවීන් හැදිල සෙල හැදිල ඒක සෙලික ජීවීන් එහෙම දැක්කම තේරෙනවනේ, ඒක සෙලික ජීවීන්ගේ තියෙනව නලියන ස්වභාවය එතකොට ඒක සෙලික බැක්ටීරියා ඇමීබා වගේ ජීවීන් අන්වීක්ෂයෙන් දැක්කම තේරෙන්නවා ඒකේ චලනය වන ස්වභාවය දැනෙන ස්වභාවය තියෙනවා. එතකොට ඒ ස්වභාව තමයි මේ සේරම බහු සෙලික වෙලා තියෙන්නේ.

**උපාසිකාවඃ** එහෙමයි

**ආර්යන් වහන්සේ:** මේක කොහෙවත් තුන් කාලෙකට අයිති නෑ මේ මොහොතෙම අපි දෙයක් දිහා බලන කොට ඒ ක්ෂණයෙම දකින සිතමයි මේ කතාව. ඒ කියන්නේ ආරම්මණය, රූපය කියන්නේ රූපාරම්මණය. " රූපං නිච්චතෝ අනිච්චතෝ, අනිච්චං භන්තේ' කියන්නේ ඇසෙන් දෙයක් බලලා පොත කියල ගත්තට. පොත කියලා දෙයක් කොහෙවත් නෑ. ඒක ශබ්ද වර්ණ තමයි පොත කියන්නේ, වර්ණයක් කියන්නේ හැඩතලයක් ඒක චිත්තයක් එළියේ කෙහෙවත් එහෙම එකක් නෑ. අන්න "රූපං නිච්චතෝ අනිච්චතො අනිච්චං භන්තේ" මේ අනිත්‍ය කියන්නේ අවබෝධ කරන දෙයක් අනිත්‍ය කියන්නේ දෙයක් නැතිකම නෙවෙයි. අවබෝධ කරනවා ධර්මය තුළ මේක චිත්තයක් එහෙම දෙයක් කොහෙවත් නැති බව. ඒකමයි අනිත්‍ය කියන්නේ අනිත්‍ය අවබෝධ කරනවා කියන්නේ ඒකමයි. ඒකට උදය වැය ඥාණය කියන්නේ මේක දකින එක. මේක දකිනවා කියන්නේ මේ මෙහොතෙම මෙතන පොතක් නැති බව, පොත ඇති වන හැටි දකිනවා. ඇති වෙන හැටි දකින එක සමුදය ඥාණය. පොත නැතිවන හැටි දකින එක තමයි සමුදය අඤ්ඤාණං පොත කියල දෙයක් එළියෙ නෑ "චිත්තයක්" හැදෙන එකක්, ශබ්ද වර්ණ ඒක තමයි සමුදය කියන්නේ. සමුදය ඤාණං කියන්නේ සත්‍ය දකින එක. සමුදය අඤ්ඤාණං කියන්නේ ඒක නොදකින එක. පොත බාහිර තියෙනවා කියල රැවෙටෙන එක එහෙම දෙයක් බාහිර කොහෙවත් නෑ, ඒක දකින එක තමයි සමුදය ඥාණං කියන්නේ. සමුදය සත්‍යය කියන්නේ ඒකයි. දුක්ඛ සත්‍ය තියෙන්නේ ඒකට රැවටුනොත් ඒකේ ඇත්ත දැක්කොත් අන්න නිරෝධ සත්‍යය දැකීමයි මාර්ග සත්‍යය. එතකොට චතුරාර්ය සත්‍ය කියන්නෙත් ආරම්මණයටමයි. හැබැයි මෙතන මේ කතාව බලන කොට මෙතනමයි විඤ්ඤාණ ශක්තිය ඇතිවෙලා තියෙන්නේ.

**උපාසිකාව:** එහෙමයි, ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේ:** මේක කොහෙවත් තියෙන එකක් නොවෙයි මෙතන මේ ආලෝක හැඩතලය වැටෙන කොටම ඒ එන "ස්පාක්" ටික සේරම අර "ස්පාක්" වෙනවා කියන්නේ එළියේ තියෙන බව දැනෙන එක. මේ කතාව සරල කරල ගත්තාම එළියේ දෙයක් තියෙනවා කියල හිතන එක ධන ඍණ අන්ත දෙක, එළියේ දෙයක් නෑ හැබැයි අපි හිතනවා තියෙනවා අන්න ඒ හිතන එක තුළ ආත්මය හැදිල තියෙන්නේ, ඒකයි විඤ්ඤාණ ශක්තිය කියන්නේ. මේ හිතන දෙයක් බාහිර නෑ, ඒ වුණාට වේගයෙන්



තියෙනවා වගේ දැනෙන එක තමයි විඤ්ඤාන ශක්තිය. මේ වේගය තුළ තියෙන දෙයක් බවට පත්වෙලා පුදුම පැහැදිලි කිරීමක් මේක.

**උපාසිකාව:** එහෙමයි ආර්යන් වහන්ස පෙර කළ පින් නිසායි සමහර අයට හොඳට ඉගෙන ගන්න පුලුවන්. සමහරුන්ට එහෙම බැරි වෙනවා එහෙම තියෙනවා නේද ආර්යන් වහන්ස?

**ආර්යන් වහන්සේ:** පටලව ගන්න එපා මේක බුද්ධ ධර්මය අබුද්ධෝත්පාද කාලෙත් කර්ම විෂයන් ගැන කතා කරනවා. ඒ කියන්නේ ලොකේ බාහිර ඇත්ත කරගන්න තැන අවිද්‍යා භූමියේ ඔය විෂය තියෙන්නේ බාහිර දෙයක් තියෙනව කියල ගත්තොත් තමයි. හොඳ හරි නරක හරි අපිට වෙන්නේ එතකොට ඉගෙන ගන්නවා නෑ කියන එකේ අන්ත දෙකක් තියෙන්නේ.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** ඒවා අපි බාහිර ඇත්ත කරගෙන හදාගත්ත සංඛාර ඒ කියන්නේ මහා මයා දේවියත් පන්සිල් රැක්කා කියන කොට අපිට හොඳටම තේරෙනවානේ, එතකොට බුදුකෙනෙක් ඉඳලත් නැනේ එතකොට සමාජයේ පැවැත්මට හොඳ නරක ඇත්ත කරගත්ත තැනකනේ ඕක තියෙන්නේ. සතා සිව්පාවා පවා බාහිර ඇත්ත කරගෙනනේ ඉන්නේ මේක ගෝත්‍රික සමාජයට ගියත් අපිට තේරෙනවා දෙයක් තිබ්බොත් තමයි හොඳ නරක හරි අන්තයක් තියෙන්නේ.

**උපාසිකාව:** එහෙමයි

**ආර්යන් වහන්සේ:** බුදුන් වහන්සේ හැම තැනම ඒක පැහැදිලි කරනවා විශේෂයෙන්ම ස්කන්ධ පැහැදිලි කරනකොට පැහැදිලි කරනවනේ එකොළොස් ආකාර ස්කන්ධ ගොඩවල් ඒ කියන්නේ අතීත අනාගත පච්චුප්පන්නංවා, ඕලාරිකංවා, සුඛුමංවා, හීනංවා, ප්‍රනීතංවා, දුර වේවා ළඟ වේවා ස්කන්ධය දෙයක් කියලනේ ඔය පෙන්නන්න හදනනේ, දෙයක් තිබ්බොත් අතීතෙත් තියෙනවා අනාගතතෙත් තියෙනවා දැනුත් තියෙනවා දෙයක් තිබ්බොත් ඒක "අජ්ජත්ත බහිද්ධාවා" එළියෙත් තියෙනවා මට පේනවා මමත් ඉන්නවා එතකොට දෙයක් තිබ්බොත් හොඳ හරි නරක හරි සුඛුමංවා, හිනංවා, ප්‍රණීතාවා, දුර වේවා, ළඟ වේවා ඔක්කොම ස්කන්ධ ගොඩවල් කියල බුදුන් වහන්සේ පෙන්වනවානේ, ඒවා එළියෙ

කතාවක් නෙමෙයිනේ. ස්කන්ධ කියන්නේ චිත්තයක් සිතුවිල්ලක් දෙයක් කියල හිතන නිසයි. ඔය සේරම ත්‍රිමාණ වෙලා මැවෙන්නේ.

**උපාසිකාවඃ** එහෙමයි, ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේඃ** අතීත අනාගත පච්චුප්පන්නාවා අජ්ජත්ත බහිද්ධාවා ඕලාරිකංවා සුකුමංවා හීනංවා ප්‍රණීතංවා සන්තිකේවා ළඟ වේවා දුර වේවා, අන්න උපාධානස්කන්ධා උපානස්කන්ධ සූත්‍රයේ පෙන්නනවා උපාධානය මෙහෙමයි හැදෙන්නේ ඒක අල්ලගත්ත නිසයි උපාධානය කියලා කියන්නේ මේ පැහැදිලි කිරීම් අවබෝධ කරගන්න එක ආත්මයක් නැති බව දකින එක කවදාවත් සමථය වඩලා අසංඥ්ඥ තලයට ගියා කියලා ඇති වෙන්නේ නෑ. ඒක බාවාරි සූත්‍රයෙත්, පොට්ටපාද සූත්‍රයෙත් පෙන්නල තියෙනවා. නිගණ්ඨයොත් හිටියේ සමථය වඩ වඩ. ඒ ගොල්ලොත් භාවනා කර කර හිටියේ ඒ ගොල්ලො ආත්මය තියාගෙන තමයි හැමදේම කළේ. ආත්මය නැති වෙන හැටි කව්රුත් දැනගෙන හිටියේ නෑ. නමුත් බුදුන් වහන්සේ පටිච්ච සමුප්පාදය මෙනෙහි කරන්නේ ඔක්කොම අතහැරලා දාලා. ආත්මය, දුක, එතකම් නැති වෙන් නැති නිසා දුකෙන් මිදෙන මගක් හෙව්වේ. ඒක නිසා පස්වග තව්සෝ අලාර කලාම ගුරුවරුන් අතහැරියා. පටිච්ච සමුප්පාදය මෙනෙහි කරන එකක් මේක අවබෝධ කරන ධර්මයක් "සංඛිත්තේ නිබ්බිදාය" කිව්වේ ඒකයි. හැබැයි ඒක අවබෝධ කරගන්නකොට අවබෝධය තුළ ආත්මය තමයි ගිලිහෙන්නේ, අනාත්ම ධර්මයයි හමුවෙන්නේ. ඒකයි අහන්නේ "චක්ඛුං නිච්චතෝ අනිච්චතෝ  අනිච්චං භන්තේ" මහණෙනි මේ ඇස නිච්චද අනිච්චද? ද? අනිත්‍යයි ස්වාමීනී එහෙමනම් එය දුකද? දුකයි ස්වාමීනී එහෙමනම් එය ආත්මයක් වශයෙන් ගන්න පුලුවන් ද? ඕකනේ ප්‍රශ්නේ.

**උපාසිකාවඃ** එහෙමයි

**ආර්යන් වහන්සේඃ** ඇස කියන්නේ පේන බවට ඇස කියන්නේ මේසේ, පුටු ඇඳන් කියන එක. ඒක අනිත්‍යයි එහෙම දෙයක් නෑ කොහෙවත් ඒකයි අනිත්‍යයි කියන්නේ ඒක නිසාම දුකයි. එහෙමනම් ඒක ආත්මයක් කියලා ගන්න පුලුවන්ද කියලා අහනවා "නෝ හේතං භන්තේ" එහෙමනම් අපි මෙච්චර මේ ආත්මය කියල හිතන් ඉන්න එක දෙයක්නේ දැන් මේසේ පුටුව ඇඳ ඕකම තමයි ආත්මය කියන්නේ. ආත්මය කියන්නේ මේ ශරීරය නෙමෙයි පැහැදිලි වුණා ද? ඒ දේශනය



**උපාසිකාවඃ** පැහැදිලි වුණා ආර්යන් වහන්ස

**ආර්යන් වහන්සේඃ** මෙතන ආත්මය කියන්නේ ශරීරය නෙමෙයි දෙයක් කියල හිතන එකමයි ආත්මය කියන්නේ.

**උපාසිකාවඃ** එහෙමයි ආර්යන් වහන්ස මට තේරෙනවා මම අහපු ප්‍රශ්නෙත් වැරදියි කියල කර්ම විෂයට අදාළ එකක්නේ ඇහුවේ.

**ආර්යන් වහන්සේඃ** ඇත්තටම අපි නිතරම කියනවා "යේ ධම්මා හේතු පභවා තේසං හේතුං තථාගතෝ" ඒ තථාගතයන් වහන්සේ හේතු ඵල දහමයි දේශනා කරන්නේ කියල අස්සජි මහ රහතන් වහන්සේගේ වචනෙන්ම පැහැදිලි වෙනවා. අපිට මේ සංධිස්ථාන හඳුනා ගන්නයි තියෙන්නේ. උපක අහන ප්‍රශ්නය බලන්න "ස්වාමීනී ඔබ මනුෂ්‍යක්ද? ගන්ධබ්බයෙක් ද? දෙවියෙක් ද? ඒක තියෙන්නෙත් අපිට ගලපාගන්න "බුද්ධ" කියන්නේ මනුෂ්‍යයෙක් දෙවියෙක් නෙවෙයි බුද්ධ කියන්නේ "ශූන්‍යතාවය".

**උපාසිකාවඃ** එහෙමයි, ආර්යන් වයන්ස තෙරුවන් සරණයි.

5

# නිවැරදි නිවන් මග හමුවිය

**පෙර දේශනාවක ඉතිරි කොටස මෙම දේශනාවෙන් ඉදිරිපත් කරමි.**

**උපාසිකාව :-** ගෙදර වැඩ කරන වෙලාවට මගේ දිහා මම බලනවා. බලනකොට, මට දැනෙනවා මම කියලා කෙනෙක් නෑ කියලා. යම් කිසි සත්ත්වයෙක් පුද්ගලයෙක් යම් කිසි ක්‍රියාවක් කෙරෙනවා. ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සේ :-** එහෙමයි.

**උපාසිකාව:-** ඔබ වහන්සේ දේශනා වල කිව්වා සිත දිහා බලන් ඉන්න කියලා. මම අවුරුදු තුන හතරක ඉඳලා භාවනා කරනවා. ඉක්මනට මම සමාධියට පත්වෙනවා. පත්වුණාට පස්සේ මම දැනෙන් නැතුව යනවා. නමුත් මට හිතුනා මේකෙ මොකක් හරි වැරැද්දක් තියෙනවා කියලා. මෙතනින් මට නිවන් දකින්න බෑ කියලා මට තේරුණා. ඒ අතරෙ මම හොය හොය හිටිය මේකට මම මොකක් ද කරන්නෙ කියලා. ඒ අතරෙ තමයි මට අහම්බෙන් ඔබ වහන්සේගේ දේශනා අහන්න ලැබුණේ. ඔබ වහන්සේ කියපු විදිහට ඊට පස්සෙ මම සිත දිහා බලන් හිටියා. හිත දිහා බලන් ඉන්නකොට මට දැනුණා අතීතයක් පමණයි. වර්තමානයකුත් නෑ කියලා.

**ආර්යන් වහන්සේ:-** නෑ. මෙතන තුන් කාලෙම නෑ. අතීතය මතක් වෙන්නෙත් මේ මොහොතෙනෙ. ඒක වර්තමාන සිතක් වෙනවා. අනාගතය මතක් වුනත් ඒක තාම ඇවිල්ල නෑනේ. ඒක මේ මොහොතෙ සිතනෙ. මේ මොහොතෙනෙ අනාගතය මතක් වෙන්නෙ. එහෙනම් ඒක මේ මොහොතෙ වර්තමාන සිතක් වෙනවා. හැබැයි මේ මොහොතෙ හටගන්න සිතත් සත්‍යයක් වෙන්නෙ නෑ. ඒකත් විඤ්ඤාණ මායාවක් මයි. එහෙම දේකුත් කොහේවත් නෑ. එතකොට ඒකත් පෙර සංඥාවක් මයි. එතකොට මේ මොහොතෙ හටගත්ත සිතත් ඇත්තක් වෙන් නෑ. ඒක හටගන්නෙත් පෙර සංඥා, නව



සංඥා ස්වභාවයකින්. වර්තමාන සිතකුත් අපට පනවන්න හම්බවෙන්නේ නෑ. අපිට මොනව හරි සිතක් හට ගත්තොත් ඒක මේ මොහොතෙමයි හට ගන්නෙ. "ක්ෂණ සම්පත්තිය" කියන්නෙ ඕකටයි. ක්ෂණ සම්පත්තිය අවබෝධ කරන එකක්. ඒ කියන්නේ මෙතන පවතින දෙයක් නෑ. දෙයක් කියල දෙයක් නෑ. වර්තමානයෙත් අපිට මොනවහරි සිතක් හට ගත්තොත් ඒක සත්‍යයක් නෙවෙයි. ඒවා ශබ්ද වර්ණ වලින් හට ගත්ත වේගෙට සකස් වුණු දෙයක්. දැන් ගඟ කියලා දෙයක් නෑනෙ. ගඟ කියලා අපි පනවනවනේ. අතට ගත්තොත් වතුර ටිකක් නෙ. ගලනවටනෙ. ගඟ කියන්නෙ. ගඟ කියලා දෙයක් ඇත්තටම නෑනේ. දැන් වැස්ස කියල දේකුත් නෑනෙ. වතුර බිංදු වැටෙනවටනෙ අපි වැස්ස කියන්නෙ.

**උපාසිකාව:-** එහෙමයි, ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සේ:-** ඒවගේම සිත කියල දෙයකුත් නෑ. ඇත්තටම මේ සිත කියන්නේ ස්පාක් වෙන වේගෙකටයි. ඒ ස්පාක් වෙන වේගෙ වැඩි නිසා ගිනි බෝලෙ කරකනකොට වළල්ලක් පේනව වගේ අපිට මැවිල තියෙන්නෙ දෙයක් වගේ. අපි ඇසුරු කරන්නෙ චිත්තයක්. අපි ඇසුරු කරන්නෙ බාහිර තියෙන දෙයක් නෙවෙයි. අපි ඇසුරු කරන්නෙ මේසය, පුටුව, ඇඳ, නා ගහ, නුග ගහ, මේවා ඇවිල්ල ශබ්ද, ශබ්ද කියන්නෙ, මේක ධ්වනියක්. ධ්වනියක් කොහොම ද අපිට බාහිර පේන්නෙ. එහෙම දෙයක් වෙන් නෑ කවදාවත්. ඒකයි මේ විඤ්ඤාණ මායාව කියන්නෙ. ඒක මායාවක්. මැවෙන එකක්. ඇත්තට ම මේ චිත්තය තරංග ස්වභාවයක්. වර්ණ තරංගයි, ශබ්ද තරංග යි එකතුවෙල හැදෙන සම්මිශ්‍රණයක් තමයි "චිත්ත තරංගයක්" කියන්නේ. ඒක වර්ණත් නෙවෙයි. ශබ්දත් නෙවෙයි. එකට ගන්න බෑ. ඒකෙ තියෙන්නෙ චිත්ත ස්වභාවයක්. ඒ කියන්නේ, උණුසුම, සීතල, තද ගතිය ඒ සියල්ලම සංඥා ස්වභාවයකින් දැනෙන ස්වභාවයක් ඇවිල්ල තියෙන්නෙ. සියල්ලම එකම ස්වභාවයකින් එන්නේ. ඒක තමයි මේකෙ තියෙන ආශ්චර්යය. ඒ කියන්නේ, මේ පැත්තෙ ඉඳලා අපි කිව්වොත් රෝස මල කියල, ඔබ තුමියට ඔය පැත්තෙන් රෝස මලක් මැවෙනවා. පිංතූරයක්.

**උපාසිකාව :-** එහෙමයි.

**ආර්යන් වහන්සේ:-** ඒක වෙන්නෙ කොහොමද? මෙතනින් එන්නෙ ශබ්දයක්නෙ. දැන් ඔය පැත්තෙන් මේ ශබ්දයට මොකක් හරි දැකපු චිත්‍රයක්නෙ මැවෙන්නෙ. ඒ ශබ්දයට තියෙන චිත්‍රයයි මැවෙන්නේ. එතකොට

අපිට කියන්න බෑ අපි හිතන රෝස මලද ඔතන මැවුනෙ කියලා. ඔතන මැවෙන්නෙ ඔබ තුමිය දැකපු රෝස මලක් තමයි. ඒක අපි දන්නවා. නමුත් අපි හිතන් ඉන්න එක වෙනස් වෙන්න පුළුවන්. අපි හිතන්නෙ පෙති ලොකු රෝස මලක්. සමහර විට ඔබ තුමිය හිතන්නෙ සාමාන්‍ය රෝස මලක්. දෙක වෙනස් වෙන්න පුළුවන්, සමහර විට අපි හිතන්නෙ රතු පාට රෝස මලක්, ඔබ තුමිය හිතන්නේ රෝස පාට රෝස මලක් වෙන්න පුළුවන්. ඔන්න ඔය වගේ අපි කියන දේද ඔතන මැවෙන්නෙ ? නෑ නේද?

**උපාසිකාව :-** නෑ. නෑ. ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සඃ-** එතකොට, ශබ්දයකින් කොහොම ද චිත්තයක් එන්නෙ? චිත්තෙ කියන්නෙ ශබ්ද, වර්ණ එකට එකතු වුණ එකක්, සංඥාවක්. අර සංඥා කණු තියෙන්නෙ, අන්න ඒ වගේ. චුම්භක ශක්තිය, විද්‍යුත් ශක්තිය, තාප ශක්තිය වගේ එකක් තමයි චිත්ත ශක්තිය කියන්නේ. හැබැයි මේ එකකටත් සමාන නෑ. මේක වෙනස්. අර උණුසුම සීතල තද ගතිය වගේ ඔය "සෙන්සස්" වල ද්වාරවල ස්පාක් වෙන ප්‍රසාදවල ස්වභාවවල දැනීම් එකතු වෙලා දැනෙන ස්වභායක් ඇති වෙලා තියෙනවා. එකම ස්වභාවයක්. අර මේසෙ කියන ශබ්දයට වර්ණත් තියෙනවා. අන්න ඒ වගේ.

**උපාසිකාව :-** එහෙමයි.

**ආර්යන් වහන්සේ :-** ඔබ තුමිය ඒ කියපු තැන අකාලික දහමක් තියෙන්නේ. ඒ කියන්නේ වර්තමානෙත් නෑ කියන එක. අතීතෙන් නෑ. අපි මේ හිතන එකක් වත් නෑ. අපිට අතීතය කියන එකක් හම්බවෙන්නෙ නෑ. මේ මොහොතම විතරයි හැම තිස්සෙම. අනාගතය කියන එක තාම ඇවිල්ල නැති නිසා ඒක හම්බවෙන්නෙත් නෑ. "අතීතං නාත්ත ගම්මෙය්‍ය න පටික්කංකේ අනාගතං, පච්චුප්පන්නාචයේ ධම්මා - තත්ත්‍ර තත්ත්‍ර විපස්සති." කිව්වේ බුදුන් වහන්සේ ඕක තමයි. අතීතය ගිහින් ඉවරයි. අනාගතය තාම ඇවිල්ල නෑ. හැබැයි මේ පච්චුප්පන්න මේ මොහොත එතනම ඇතිවෙල නැතිවෙල යනවා. පවතින් නෑ කියන එක. ස්පාක් වෙනවා කියපු එක තමයි. ඒකයි මේක අකාලික දහමක් කිව්වේ. තුන් කාලෙම බොරුවක් වෙනවා. ඒකයි සන්දිට්ඨික අකාලික, ඒහි පස්සික, ඕපනයික පච්චුප්පන්න ධර්මයක් කියන්නෙ. සාන්දිට්ඨික කියන්නෙ මේක දැනෙනවා, අකාලික කියන්නෙ තුන් කාලෙම නෑ. ඒහි පස්සික ඕපනයික කියන්නේ තව කෙනෙකුට මේක බලන්න පුළුවන් මෙනෙහි කරල. එයාටත් මේක අවබෝධ වෙනවා ඇත්ත



කියල. "පච්චුප්පන්න" මේ මොහොතෙම ඇති වන නැති වන ධර්මය දකිනව එතකොට ධර්මතාවය කියන්නෙ දෙයක් නෙවෙයි. අර හුළඟ වගේ, වේගෙ වගේ, අර වේගෙට මැවෙන එකක් බව එයාට අවබෝධ වෙනවා. මේක වේගෙට මැවෙන්නෙ. අපි හඳුන්කූරක් අරගෙන වටයක් කරකනවා. එතකොට දුම් වළල්ලක් පේනවා. අන්න ඒක කොහෙවත් නෑ. අන්න ඒ වගේ.

**උපාසිකාවඃ-** එහෙමයි.

**ආර්යන් වහන්සේඃ-** දැන් අපි කාටුන් එක දිහා බලාගෙන හිටියට පින්තූර ගොඩක් වේගෙන් යනකොටනෙ අපිට ඔය චිත්‍රපටිය වගේ පේන්නෙ. project කරලනේ ඔය චිත්‍රපටිය පෙන්නන්නෙ. ඒවගේ තමයි අපිට මේ පේන ඒවා ඔක්කොම, මේ මොහොතේ අපිට පේනවා කියන එක චිත්තක්ෂණ කෝටි ගාණක් මේ මොහොතෙම වේගෙන් පහළ වෙනවා. ස්පාක් වෙවී තියෙනවා. අපි කියන්නෙ ආශ්වාස ප්‍රාස්වාස වැටෙනකම්ම සෙන්සස් ස්පාක් වෙනවා කියලා එක පැත්තකින් උණුසුම, සීතල, තද ගතිය, තව පැත්තකින් වර්ණ, ශබ්ද වේගෙන් එනකොට හිතාගන්න බෑ. ඔක්කොම එකක් වාගේ පේනවා. ඇත්ත වෙලා ත්‍රිමාන වෙලා පේනවා. එතකොට වෙන්නෙ අපි දැන් ජීවත් වෙනවා. අපි දැන් ඉන්නවා, තද ගතිය දැනෙනවා, උණුසුම දැනෙනවා, වර්ණ පේනවා, ශබ්ද ඇහෙනවා, මේ මම ඉන්නවා කියලා හිතෙනවා. අන්න, ආත්මීය දැනීම. ආත්ම සංඥාව එතනින් එන්නෙ. කොයිතරම් ප්‍රායෝගිකද මේ දහම කියල එතකොට වැටහෙනවා නේද?

**උපාසිකාව :** එහෙමයි, ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සේඃ** ඒකයි බුදුන් වහන්සේ කියන්නේ මේ ධර්මය සාන්දිට්ඨිකයි කියලා. ඕන කෙනෙකුට එන්න බලන්න කියල අර, ලුණු කාල බැලුවම ලුණු රස දැනෙනව වගේ මේක දැනෙනවා හැමෝටම. මේක විශ්වාසයක් ඇදහිල්ලක් නෙවෙයි. මේක දැනෙන ධර්මතාවක්.

**උපාසිකාව :** එහෙමයි, ආර්යන් වහන්ස. මට දැන් ඔබ වහන්සේ ඔය කියන දේ ඔක්කොම මට වැටහුණා. මට හරි ප්‍රශ්නයක් ආවා දැන් මම හිත දිහා බලාගෙන ඉන්නකොට ආර්යන් වහන්ස, මට අරමුණක් එනකොට, වර්තමාන මොහොත නෙමෙයිනෙ මේකත් අතීතයක්, ගන්න, ගන්න හැම වචනයක්ම, දැන් ඔබ වහන්සේට මම කියන මේ වචනෙත් මේ මොහොතකුත් නැති තරමයි නේද ආර්යන් වහන්ස? ඒ හැම දේම අතීතෙටනෙ යන්නෙ.

**ආර්යන් වහන්සः** ඇත්තට ම අපි මේ සත්‍ය දැක්කොත් රහතන් වහන්සේ හා සමානයි. ඒ කියනනෙ මේ සත්‍යය දකින කොට අපිට මොකුත් හම්බෙන් නෑ. ඇත්තටම කිව්වොත් අපි අනිදස්සනයි." විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතෝ පබං එත්ත ආපෝච පඨවිච. තේජෝ වායෝ නගාධති - එත්ත දීඝංච රස්සංචා අනාකුලං සුභා සුභං - එත්තනාමංච රූපංච - එත්තේසං උපරුජ්ජති-විඤ්ඤාතේන නිරෝධේන-ඒත්තේසං උපරුජ්ජති." කිව්වෙ ඔන්න ඕක තමයි. මේ දැන් කියපු ටික වැටහෙනවා නම් ඇත්තටම විඤ්ඤාණය බැස ගන්න තැනක් නෑ. මොකුත් හම්බවෙන් නෑ. ඒ කියන්නෙ අපි හිතන දේවල් කොහෙවත් නෑ කියලා හොඳට මතක තියාගන්න ඕනි.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යන් වහන්සः** "චිත්තේන නීයති ලෝකේ" ඒ කියන්නෙ අපි සිතුවිලි ඇතුලෙ ඉන්නව කියන එක දැනගන්න ඕනි. මේක ප්‍රායෝගිකව දකින්න ඕනි. "සලායතන ලෝකෝ ලෝකෝ" ඇස, කණ,දිව, නාසයේ මැවුණු "චිත්තේන නීයති ලෝකේ" ඇතුළෙ අපි සිත තුළ මැවෙන ලෝකෙක ඉන්නවා. ඒ කියන්නෙ ටී වී එක දිහා බලාගෙන හිටියට ටී වී එකේ නෙවෙනෙ කතාව තියෙන්නෙ අපෙ හිතේ. අපේ හිතේ තමයි දුක හිතෙන්නෙ සතුටු වෙන්නෙ. අපි ටී වී එක දිහා බලාගෙන අපේ රාග, ද්වේශ, මෝහ පිනවනවා. ටී වී එකේ රාග,ද්වේශ,මෝහ නෑනෙ. ඒක ප්ලාස්ටික් තිරයක්නෙ. රාග, ද්වේශ, මෝහ තියෙන්නෙ කොහේද? අපේ නෙ. අපේ හිතේ තියෙන රාග, ද්වෙශ, මෝහ, අවුස්සගන්නවා එළියෙ තියෙනෙ චිත්‍ර පෙට්ටියක් දාලා. ඒ කියන්නෙ ප්ලාස්ටික් තිරයක් දිහා බලාගෙන අපි අපේ හිතේ තියෙන ද්වේශය අවුස්සාග න්නවා. ප්‍රවෘත්ති යනකොට මිනිස්සු ඔය පාලකයන්ට බනින්නෙ. ද්වේශය ඇවිස්සුනේ එයාගේ හිතේනෙ. අර ටී වී එකේ එහෙම දෙයක් නෑනෙ. ටී වී එකේ රාග, ද්වේශ, මෝහ නෑනේ. රාග, ද්වේශ, මෝහ තියෙන්නෙ අපේ හිතේනෙ. කේන්ති යන්නෙ අපටනෙ. අර එළියෙ තියෙන රූප ඡායා වලට අපේ හිතේ තියෙන රාග, ද්වේශ, මෝහ අවුස්සන්න පුළුවන්. එළියෙ තියෙන දෙයක් නෙවෙයි එතකොට අපේ හිතේ තියෙන "චිත්තේන නීයති ලෝකේ" තමයි කැළඹෙන්නෙ.

**උපාසිකාව :-** එහෙමයි.

**ආර්යන් වහන්සः-** දැන් අපිට හීනයක් පේන්නෙත් එහෙමනෙ. අපිට ආශ්වාස, ප්‍රාස්වාස වෙනකම්ම සිතුවිලි දුවනවනෙ. නින්දෙදි පංච ද්වාර ටික



වැහිලනෙ තියෙන්නෙ. ද්වාරවලින් සිතුවිලි එන්නෙ නෑ. අර දවාලේ දැකපු එක එක කාලවල දී වැදුණු සංඥා අඩ නින්දේ දී වේගයෙන් වැඩ කරනවා. ඒක නිසා තමයි දිගටම හීන පේන්නෙ. ඒක නවතින්නෙ නෑ. ගැඹුරු නින්දට ගියොත් නවතිනවා. ඒකට හේතුව අපි ඇසුරු කරන්නේ මනෝ විඤ්ඤාණය. ඒ කියන්නේ දැන් ඇසට එන්නෙ වර්ණයක්. ඇස අඳුරන්නෙ නෑනෙ මේ අඹ ගහ කියලා. මනෝ විඤ්ඤාණය කියන්නෙ ඇසට එන ආලෝකයට අර ශබ්ද වර්ණ සේරම එකතු වෙලා හැදුණ එකක්. අපි අර "ඵස්ස පච්චයා වේදනා, සංඥා, සංඛාර,විඤ්ඥාණ" කිව්වේ මනෝ විඤ්ඤාණයට. "මනසංච පටිච්ච ධම්මේසු - උප්පජ්ජති මනෝ විඤ්ඤාණං" කිව්වේ ඔන්න ඕක. ඕක න්‍යායාත්මක ව සූත්‍රවලින් බුදුන් වහන්සේ දේශනා කරපු විදිහට ම පෙන්නන්න පුළුවන්. එහෙම නැත්නම් ප්‍රායෝගික ව සරලව කියනවනනම් ඇසට එන්නෙ කිරණයක්, අපි දකින්නෙ සිතුවිල්ලක්. කොයිතරම් සරල ව තේරුණාද ඒක නේ ද?.

**උපාසිකාව :** එහෙමයි, ආර්යන් වහන්ස, මට වුණත් ටී වී එක දිහා බලා ඉඳිද්දී හිතුනා මේ මොන මායාවක් ද, මොන බොරුවක් ද කියල. ටී වී එකේ මනුෂ්‍යයෙක් ඉන්න විදිහක් නෑනෙ ආර්යන් වහන්ස. මම උදේ පාන්දර භාවනා කරනකොට කුරුල්ලො කෑ ගහනවා ඇහෙනවා. මේ කුරුලු ශබ්දයත් කියන එකත් අපිම පනවා ගත්ත එකක්නෙ කියල හිතෙනවා ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සः** සියල්ල "මනෝ පුබ්බංගමා ධම්මා" මනස මූලික කරගත්ත ධර්මතාවයක්. අපි හිරවෙල ඉන්නෙ. මේ ලෝකෙ ජනගහනය කෝටි 800 ම තමන්ගෙ සිත්වලින් එළියට ගිහිල්ල නෑ. මේ ධර්මය අවබෝධ වුනාම මේ මුළු ජනගහනය ම පොඩි ළමයි වගේ. තමන්ගෙ සිත්වලින් එළියට කවුරුත් ගිහිල්ලා නෑ. කාටවත් යන්න බෑ. ඒකට හේතුව තම තමන්ගේ විඤ්ඤාණ මායාව පිනව පිනවා ඉන්නවා. හැමෝම එහෙමයි. ඒ ධර්මය අවබෝධ නැත්නම් කිසි කෙනෙක් එළියට ගිහිල්ල නෑ. මේ ධර්මය අවබෝධ වුණොත් එයාට දකින්න ලැබෙනවා සත්‍යය. සත්‍යය දැක්කට පස්සෙ එයා අවදි වෙනවා. හීනෙන් නැගිට්ට වගේ. අර මළවුන්ගෙ ලෝකයේ ඉන්නව වගේ තමයි අපි ඇවිස්සී ඇවස්සී අතීතෙත් එක්ක ඉන්නේ. සංඥා ගොඩේ. අර හීනෙන් නැගිට්ටා, පරිඋට්ටාන වුණා වගේ තමයි මේ සත්‍යයට අවදි වෙනවා කියන්නෙ. ඒ කියන්නේ අපි සිතුවිලි වලට නොරැවටී ඉන්න එක. දැන් අපි අතීත සංඥාවලටනෙ රැවටිල ඉන්නෙ. මේ නිල් පාට, රතු

පාට, කහපාට කියල මොන්ටිසෝරි යනකොට අපිට මේව දානවනෙ. පුංචි දරුවගේ ඉඳල හැමදේම දානවනෙ. හැම එකම අපි දන්නවා. චීනෙ වෙනින් ශබ්ද දානවා. ඇමෙරිකාවේ වෙනින් ශබ්ද දානවා. ලංකාවෙ එක ශබ්දයක් දානවා. ඉන්දියාවෙ තව ශබ්දයක් දානවා. ඒක වෙන්න බෑනෙ. එතකොට භාෂාව බොරුවක් වෙනවා.

**උපාසිකාව :** ඔව් ඔව්.

**ආර්යන් වහන්සේ:** එතකොට මේ අපි කතාකරන එක සිතුවිල්ලක්වත් ඇත්තක් වෙන් නෑ. සේරම බොරු වෙනවා නේ ද?

**උපාසිකාව:** එහෙමයි ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සේ:** මේ සත්‍යයට අපි අවදිවෙනවා කිව්වේ "ධම්ම චක්‍ෂුසය" ට අවදි වෙන එකයි. අපිට මස් ඇහැට මේක පේන් නෑ. මේ සත්‍යය මෙනෙහි කිරීම තුළ නුවණින් විමසීම තුළ අවබෝධ කරගන්න ධර්මතාවයක් "සංකිතේන - නිබ්බිදාය" කිව්වේ ඒකයි. අවබෝධඥාණයක් තමයි නිවන කියන්නේ. ඒ කියන්නේ කණ්ණාඩියේ දෙයක් නැති බව අපිට අවබෝධයිනෙ. නමුත් සතා සිවුපාවට අවබෝධ නෑනෙ. කුරුල්ලා එහෙම ඇවිල්ල කණ්ණාඩියට කොටනවනෙ. මනුස්සයට අවබෝධයක් තියෙනවා කණ්ණාඩිය ඇතුලෙ මොකුත් නෑ කියලා. හැබැයි කණ්ණාඩියෙන් ඕන නම් ලෝකෙම පේනවා. ඒ වගේ තමයි අපිට මේ සත්‍යය අවබෝධ වෙනකොට. ඇත්තටම අපි දකින එළියෙත් මොකුත් නෑ කිය ලා අවබෝධ වෙනවා. ඔක්කොම අපේ සිතුවිලි කියල අපිට අවබෝධ වෙනවා. අපි හිතන්නේ එළියෙ තියෙන ඒවා ගැන නෙමෙයි. අපිට බෑ එළියට යන්න

අපි සිතුවිලිවල හිරවෙලා ඉන්නෙ. ඒක අවබෝධ වෙනවා.

**උපාසිකාව :** එහෙමයි, ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සේ:** අපි මේ සිතුවිලි ඇතුලෙ ඉන්නවා කියන්නෙ ඒකයි දකින්න ඕන තැන. අපිට මේ සිතිවිලිවලින් එහා දෙයක් හමු වෙන්නෙ නැති බව. මේ ඇස, කණ, දිව, නාසයට අපි කොටු වෙලා. අපිට ඇස් පේන් නැත්නම් වර්ණ කවදාවත් අපි දැකලා නෑනෙ. කණ ඇහෙන් නැත්නම් ශබ්ද ඇහෙන්නේ නෑනේ. එතකොට අපි වර්ණ නැති ලෝකෙකට සීමා වෙනවා. අපි සීමා වෙනවා ශබ්ද නැති ලෝකෙකට. දැන් තේරෙනව ද? අපි ආයතන වලට කොටු වෙලා ඉන්නවා.



**උපාසිකාව :** එහෙමයි ආර්යන් වහන්ස, ඇත්තටම මම කණ්ණාඩිය ඉස්සරහට ගිහින් බලන කොට මට මාව පේනවනේ. මම කියලා හිතුවට ඒ මම නොවෙයිනෙ ආර්යන් වහන්ස නේ ද?

**ආර්යන් වහන්ස:** ඇත්තටම අපි හිතන් ඉන්නව මම කියලා. මේ සේරම මනෝ විඤ්ඤාණයෙන් මවන්නේ. මනෝවිඤ්ඤාණය කියන්නේ ශබ්ද වර්ණ එකතු වෙන එක. ඇස කියන්නේ වර්ණනෙ. කණ කියන්නෙ ශබ්දනෙ. නාසය - ගන්ධය, දිව - රස ඒ වගේ ම අපි දන්නවා කාය කියන්නේ උණුසුම, සීතල, තද ගතිය කියල. හැබැයි මේ සේරම එකතු වෙලා හදාගත්ත එකක් තමයි අපි පොත, ඇඳ, මේසය කියල හදාගත්ත වචන. ඒවගේ ශබ්ද, වර්ණ දෙකම තියෙනවා. ශබ්ද, වර්ණ, උණුසුම, තදගතිය, මේ සේරම අපිට මැවෙනවා. අපි හැම ශබ්දෙකට ම තියෙනවා රූප සටහනක්. රූප සටහන දකින කොට ම ඒකෙ නම තමයි අපිට එන්නේ. අපි කියන් නෑනෙ සතර මහ භූත පේනවා කියලා. අපි කියන්නෙ මේ බිත්තිය, මේ තාප්පය, මේ වහලෙ, මේ සිවිලිම. මේ ඔක්කොම ශබ්දනෙ. සුද්දෙක් හිටියොත් වෙනින් ශබ්දයක් දානවා. චයිනා භාෂාවෙන් වෙනින් ශබ්දයක් නෙ. එතකොට ශබ්ද බොරුනෙ. ඒවා අපිට දාපුවනේ. මේක කවුරුත් දාපුවා නෙමෙයි. සත්ව පුද්ගල කතාවකුත් නෙවෙ යි. ඒ කියන්නෙ මේ සෙන්සස් ටික ස්පාක් වෙනවා කියන එක. මේ ලෝකේ පුංචි දරුවා ඉපදෙන කොට "ප්‍රභාෂ්වරං චිත්නං" කියන කොට පුංචි දරුවා ඉපදෙන කොට මොකුත් දන්නෑනෙ. මේ ලංකාව ද? මේ ගෑනුද? පිරිමි ද මොනවත් දන්නෙ නෑනෙ. මේ දරුවා ඇසට වර්ණ හැඩතල, ඒ වගේම කණට ශබ්ද මේවා එකට ස්පාක් වෙනව වේගෙන්. අර එතකොට ඒකට දැනෙන්න ගන්නවා. මේ අම්මා කිව්වම හැඩතලය එනවා. මේ ළමයා කැලේ ගිහිං තිබ්බොත් අර හූ කියන සතුන්ගෙ හඬ හරි එනවා. මේක ස්වභාවදහමක්, මේ චිත්ත නියාමය කියන එක. ඒ කියන්නෙ මේ ශබ්ද වර්ණ එකතු වෙන එක. ඒකනෙ "සබ්බේ සංඛාරා" කියන්නෙ. අපි ඕක තමයි ඔය "අවිද්‍යා පච්චයා සංඛාරා" කියන්නෙ. පටිච්ච සමුප්පාදය කියන්නෙ ඔතෙන්ට යි. මේ සේරම කතාව කියන්නේ මේ හිතක් හැදෙන හැටි. මේ නිවන් මගම තියෙන්නේ එතනමයි. ඒ කියන්නෙ ක්ෂණ සම්පත්තිය කියන්නෙත් ඒකමයි. ඒකමයි අපි සද්ධර්ම ශ්‍රවණය කියන්නෙ. සිතක් හැදෙන හැටි මේ තියෙන්නෙ. මහා නිදාන සූත්‍ර, සළායතන සූත්‍ර, ස්කන්ධ සූත්‍ර, සංචේතනා සූත්‍ර, මධු පිංඩික සූත්‍ර මේ ඔක්කොම කියන්නෙ මේ එක සිතක් ගැනයි. මේ එන අරමුණක් ගැනයි තියෙන්නෙ. පොත්වල ලියල තියෙන සේරම බොරු

වෙනවා. ප්‍රායෝගික පැත්ත දැක්කොත්. කවුරුවත් ප්‍රායෝගික වෙලා නැති නිසයි මේ පොත්වල ලියල තියෙන ඒව බොරු කියලා තේරෙන් නැත්තෙ. ගිය ආත්මෙට දෙකයි, ලබන ආත්මෙට තුනයි, මේ ආත්මෙට දාල රේණුකානේ චන්දවිමල හාමුදුරුවෝ ලියපු පටිච්ච සමුප්පාදය සම්පූර්ණයෙන් වැරදි. එතන නිවන් මගක් නෑ. සිලබස් එකක් විතරයි. ඒ ගොඩක් ඒවා නිවන් මග අවබෝධයක් නැතිව තමයි කියලා තියෙන්නෙ. ප්‍රායෝගික නෑ. ප්‍රත්‍යක්ෂ ධර්මයක් එතන නෑ. එතන තියෙන්නෙ සිලබස් එකක්.

**උපාසිකාවඃ** එහෙමයි, ආර්යන් වහන්ස.

**ආර්යන් වවහන්සේ :** ඇත්තටම මුළු ලෝකෙටම ත්‍රිපිටකයක් තියෙන්නෙ ලංකාවෙ විතරයිනෙ. බුද්ධ ජයන්ති ත්‍රිපිටකය හදාගත්ත එකනෙ. ලංකාවේ තමයි මේ මහා නිධානෙ තියෙන්නෙ. කාටවත් මේක තේරෙන්නේ නෑ. මේ සූත්‍රවල මේ ධර්මය තියෙනවා. නමුත් මේවා සිංහලට පරිවර්තනය කලේ 1984 ප්‍රේමදාස මහත්තයාගෙ යුගයෙනෙ. එතකං අපිට ත්‍රිපිටකයක් තිබුණේ නෑ. දැක බලාගන්න සිංහලෙන් පරිවර්තනයක් තිබුණේ නෑනෙ. නමුත් පරිවර්තනය කරල තියෙන්නෙත් ධර්මාවබෝධයකින් නොවෙයි. මෙතන තියෙන්නෙ වචන පරිවර්තනයක් විතරයි. ධර්මය පෙන්නලා නෑ එතන. සූත්‍රයේ ධර්මය තියෙනවා. ඒක තමයි අපි කියන්නේ මේක නිධානයක් කියලා. ඒ සූත්‍ර තුළ අපිට පුළුවන් මේ ධර්මය පෙන්නන්න. අපි අවබෝධයෙන් මේ සූත්‍ර පැහැදිලි කරන්නේ ඒකයි. මේකෙ බැලුවම බුදුන් වහන්සෙ කියන්නෙම මේ මොහොතට එන අරමුණ ගැන. මේ මොහොතේ සිත ගැනයි කතා කරල තියෙන්නෙ පටිච්ච සමුප්පාදය, චතුරාර්ය සත්‍යය, ඒ කියන්නේ සත්තිස් බෝධි පාක්ෂික ධර්මයේම තියෙන්නේ මේ එක සිතක් ගැනයි. මේ අකාලික දහමක් දේශනා කරන්නේ. නැත්තම් ඒක බුදු දහමට අනුගතත් නෑ. ඒක හැම සූත්‍රයේම අපිට පෙන්නන්න පුළුවන්. අපි සත්‍යයම පෙන්නනවා, බුද්ධ කියන්නෙ මැටි පිළිමයක් නෙවෙයි. බුද්ධ කියන්නේ ශූන්‍යතාවයට අනිමිත්තයි, අප්‍රණීතයි කියල. අන්න චේතෝ විමුක්තියටයි බුද්ධ කියෙන්නෙ. සෑම කෙනෙක්ගෙම සිතුවිලි වලින් වැහිලා බුද්ධ ස්වභාවය පවතිනවා. බුදුන් වහන්සේ කියනවා සෑම කෙනෙකක්ම බුද්ධ පුත්‍රයෙක් වෙනව කියලා. මේක අවබෝධ කළොත් "අරහත්ත වග්ගය" අරගෙන අපි පෙන්නුවා, මේ අරහත්වයට පත්වෙනවා කියන්නේ බුද්ධ පුත්‍රයෙක් වෙනවා, අනුත්තරෝ බුද්ධත්වයට පත්වෙනවා, සෑම කෙනෙක්ම ශ්‍රාවක බුද්ධ කියලා. බුදුන් වහන්සේ සම්මා සම්බුද්ධ කියල සම්බෝධි සූත්‍රය තුළ තියනවා. මේ සත්‍යය මුලින්ම ලෝකෙට හෙළි කරපු



නිසාම කියල බුදුන් වහන්සේම දේශනා කරනවා. ඒවා මනාකොට තියෙනවා. හැම තැනම අපිට පෙන්නන්න පුළුවන්. මේ ධර්මය පාරිශුද්ධව, නිර්මලව තියෙනවා. මේ සේරම ප්‍රායෝගිකව තියෙනවා. ඒ කියන්නෙ මේක පොතක තියෙන එකක් නෙවෙයි. දැනුමකුත් නෙමෙයි. මේක අපිට සිද්ධ වෙන එක. කොහොමද සිත සකස් වෙන්නෙ, දෘෂ්ඨියේ හිටියොත් නැවත උත්පත්තියක් තියෙන්නෙ කොහොම ද, කොහොමද සතෙක් වෙන්නෙ,කොහොමද කළලෙක සකස් වෙන්නෙ, මේ රාග, ද්වේශ, මෝහ තුනී වන තරතමටයි සුගතිය තියෙන්නෙ, නැත්නම් දුගතියටමයි වැටෙන්නෙ කියලා අපි පැහැදිලි කරලා තියෙනවා.

**උපාසිකාව :** එහෙමයි, ආර්යන් වහන්සේ.

**ආර්යන් වහන්සේඃ** අසිදිසි මහා දානය දුන්නත් මල්ලිකා දේවිය දුගතියටයි යන්නේ, අශෝක අධිරාජ්‍යයා අසූහාර දහසක් වෙහෙර විහාර හැදුවත් දුගතියටයි යන්නෙ. ඒකට හේතුව ලෝකෙ ඇත්ත කරගෙනයි ඔක්කොම කරන්නෙ. ඒ සේරම දාන දෙන්නේ ලෝකෙ ඇත්ත කරගෙනනෙ. දෙයක් තියෙන නිසානෙ දන් දෙන්නෙ. ලෝකෙ ඇත්ත නිසානෙ වෙහෙර විහාර හදන්නෙ. අන්න ඒ ඔක්කොම දුගතියට යනවා කියන්නෙ ඒකයි. බලන්න විශාකාව සෝතාපන්නයි, අවුරුදු 7න්. විශාකාව සුගති පරායනයි. කවදාවත් දුගතියකට වැටෙන්නේ නෑ. ඒකට හේතුව ලෝකෙ ඇත්තක් නොවෙයි කියලා දකිනවා. මේ සේරම සිතිවිලි බව දකිනවා. අන්න ඒකයි "වොස්සග්ග පරිණාම" වෙනව කියන්නෙ. වොස්සග්ග පරිණාම වෙනවා කියන්නෙ නිවනට නැමුණක් කොට පවතිතවා. ඒ කියන්නෙ, නිවනින්ම සැනසෙනවා. අන්න ඝන සංඥා සුකුම වෙනවා. සුගතියකයි පිහිටන්නෙ. දුගතියට වැටෙන්නෙ නෑ. මේ ධර්මය අහන හැමෝම මහා භාග්‍යවන්තයි.

**උපාසිකාවඃ** සාධු, සාධු ආර්යන් වහන්ස, එතකොට අපි දෙතිස් කුණප අනිත්‍ය බලනවනෙ ආර්යන් වහන්ස. එතන මම කියල කෙනෙකුත් ඉන්නවනෙ, ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සඃ** ඔව් ඒ සේරම බාහිරින් අල්ලාගෙන, නමුත් මේවා කමටහන් විදිහට භාවිතා කරනවා. ඒත් මේ කායානුපස්සනාව තියෙන්නේ ලෝකෙ ඇත්තක් නෙවෙයි කියල දකින්නනෙ. "විනෙය්‍යය ලෝකේ අභිජ්ජා දෝමනස්සානං, කායේ කායානුපස්සි විහරති" කියලනෙ තියෙන්නෙ. විනෙය්‍යය ලෝකේ කියන්නේ ලෝකයක් නැති බව දකින්නයි. කායානුපස්සනාව

වඩන්නෙ. පඨවි ආපෝ තේජෝ ගත්තොත් ආත්මයක් නෙවෙයිනෙ පඨවි කියන්නෙ. තද ගතිය කියන්නෙ ආත්මයක් නෙවෙයි. පඨවි, ආපෝ, තේජෝ කියල ගත්තත් එතන අනාත්ම ධර්මය හමුවෙන්න ඕනි. ඒ කියන්නෙ කෙනෙක් පුද්ගලයෙක් සත්ත්වයෙක් නැති බව. ස්වභාව දහමක් පමණයි කියල දකින්නයි තියෙන්නෙ. අපි දැන් ඇත්ත කියලා හිතන් ඉන්නවනෙ බාහිර සතා සිවුපාවත් ඉන්නෙ බාහිර ඇත්ත කරගෙනනෙ. සෑම ආගමක් ම තියෙන්නෙ බාහිර ඇත්ත කරගෙනනෙ. නමුත් ඇත්තටම බාහිර බොරුවක්නෙ. ඕක දකින්නයි කායානුපස්සනාව වඩනවා කියනනේ. දැන් අපි ගත්තොත් කේසා, ලෝමා, නකා, දන්තා, තචෝ, මංසං, නහරු, අට්ඨී...... කියල කුඩු කරනවනේ. මේකෙ කොහෙවත් ආත්මයක් නෑනේ. සිත කොහෙද තියෙන්නෙ. දැන් තිස්දෙකකට බෙදල බුදුන් වහන්සේ අහනවනෙ, මහණෙනි. දැන් සිත කොහෙද තියෙන්නෙ? කියලා. තමන් ඉන්න තැනක් නෑනෙ. කෑලි කෑලි වෙන්කරල ගන්නෙ ඒකනෙ. අන්තිමට තවත් බෙදනවනෙ. පඨවිවලට මෙච්චරයි වායෝවලට මෙච්චරයි කියල. පඨවි, තේජෝ, වායෝවලට ඔය කෑලි ටික බෙදනවනෙ. නේද? ඒත් අන්තිමට තමන් ඉන්න තැනක් නෑනෙ.

**උපාසිකාව:** එහෙමයි.

**ආර්යන් වහන්සේ:** ඕකම තමයි ධර්මය කියන්නෙ. ඕකෙන් නිවන් දකින අයත් ඉන්නවා. ඒ බුදුන් වහන්සේ බුදු සමයේ එක් එක්කෙනාට පැහැදලි කරපුවා. දැන් ඒවා එකතු කරල හදල තියෙන්නෙ. හරියට බැලුවොත් එතන කතාවත් මේකම තමයි. දැන් අපි ගත්තොත් කායානුපස්සනා, වේදනානුපස්සනා, ධම්මානුපස්සනා, චිත්තානුපස්සනාව කියන්නෙ වේදනා සංඥා සංඛාරා කියන ස්කන්ධ පහම තමයි. වෙන එකක් නෙවෙයි දැන් ඔය සතර සති පට්ඨානය කියෙන්නෙ වෙන දෙයක් නොවෙයි. මේ ස්කන්ධය මයි. දැන් මේ ස්කන්ධය කියන්නෙ බාහිර තියෙන එකක් නොවෙයි. ස්කන්ධ කියන්නෙ මනෝ විඤ්ඤාණය හැදෙන එක. මනෝවිඤ්ඤාණයෙන් හදාගත්ත දේ තමයි අපි ඔය ඇසුරු කරන ආරම්මණය. පොත, මේසය, ඇඳ, කියල අපි දකින දේ. ඒක තමයි ධම්මානුපස්සනාවෙ කියන්නෙ මේ ඇස කියන ආයතනය හැදෙන හැටි. ඒක දකින්න නම් අර චිත්තානුපස්සනාව ඕනි. ආයතන විඤ්ඤාණ වෙනයි මනෝ විඤ්ඤාණ වෙනයි කියලා චිත්තානුපස්සනාවෙන් තමයි පෙන්නන්නෙ.

**උපාසිකාව:** එහෙමයි, ආර්යන් වහන්ස.



**ආර්යන් වහන්සේ:** ඒක දකින්න වේදනානුපස්සනාව තියෙන්න ඕනි. වේදනානුපස්සනාව කියන්නෙ, අර ඇහැට එන්නෙ ආලෝක කිරණයක්නෙ. ඒකත් ආලෝක වේදනාවක්. ශබ්දය වුණත් එහෙමයි. හැම පැත්තෙන්ම අපට එන්නෙ වේදනා. දැන් ඵස්ස පච්චයා වේදනා, වේදනා පච්චයා තණ්හා කියලනෙ ගන්නෙ. එතකොට වේදනානුපස්සනාව වඩනකොට වැදගත්ම දේ කායානුපස්සනාව. අපි ගත්තොත්, ශබ්ද ආරම්මණය, වර්ණ ආරම්මණය, ගන්ධ ආරම්මණය, රස ආරම්මණය, පොට්ඨබ්බ ආරම්මණය කියනවනෙ උණුසුම, සීතල, තද ගතිය, ඕක හොඳට වේදනානුපස්සනාවෙ ලිහල පෙන්නනවා. ඒ කියන්නෙ අපට දැනුනොත් බඩේ කැක්කුමක්, කකුල කොහෝ හරි වැදිල වේදනාවක්, ඔළුවේ කැක්කුමක්, එතනත් වේදනාව මගේ වෙන් නෑ. වේදනාව ශරීරයට අයිති එකක්. අපට ශබ්දය දැනෙන්නෙ කර්ණ සංඛ පටලය හෙල්ලෙන හින්දනෙ. ඒක දන්නව නේද?

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යන් වහනසේ:** දැන් කණ නැත්නම් ශබ්දයක් නෑනෙ. ඇස නැත්නම් අපට වර්ණයක් නෑනෙ. ශබ්දය අයිති කණට නේද? කරණ සංඛ පටලය හරියට වැඩ කරේ නැත්තං කණ ඇහෙන් නෑනේ. කණ කියන්නෙ ඇහෙන බවටනෙ. ඇස කියන්නෙ පේන බවටනෙ. පේනව කියන එක ඇසේ දක්ෂතාවයට අනුව තීරණය වෙනවනෙ. සමහරුන්ට හරියට පේන්නෑ. සමහර අයට වර්ණ අන්ධතාවය. සමහර අයට කොළ පාට පේන් නෑ. එතන ආයතන දක්ෂතාවක්නෙ තියෙන්නෙ. ආයතන පටිබද්ධයිනෙ. අපි මේ ඇසුරු කරන්නෙ මනෝවිඤ්ඤාණයනෙ. මනෝවිඤ්ඤාණයට හැදෙන්නෙ ආයතන විඤ්ඤාණවලින් එන එකනෙ. ඇස, කණ, දිව, නාසය කියන මේ ද්වාරවලින් එන ශබ්ද වර්ණනෙ මේ ස්පාක් වෙන්නෙ.මනෝවිඤ්ඤාණයෙන් පොත, මේසය, ඇඳ කියල එකතු කර ගෙනනේ ඉන්නෙ, ශබ්ද වර්ණ. දැන් මොන්ටිසෝරියේ දී පුතේ මේ "යෙලෝ" කිවුවම යෙලෝ කියන ශබ්දෙයි ටීචර් කියන වර්ණ හැඩතලයයි එකතු වෙලානෙ තියෙන්නෙ. අදත් අපි කහ පාට කියන්නෙ ඒකමනෙ. ඒ සංඥා, මේ සංඥා වෙනවා. වේගයත් එක්ක දිගටම වැඩ කරන එකක් මේක. ඒකයි "චිත්තාරෝපණය" කියන්නෙ. චුම්භක ආරෝපණය තියෙනවනෙ පෘථිවියේ. ඒක හැම තැනම සමානයි නෙ. ඒ කියන්නේ ගලක් උඩ දැම්මොත් බිම වැටෙනවනෙ. ඒ වගේ තමයි අපෙ හුස්ම වැටෙනකම්ම මේ ආරෝපණය එන්න එන්න වැඩිවෙනව කියන්නෙ. සංඥා වැඩිවෙලා තියෙන්නෙ. ඒ කියන්නෙ අපෙ දැනුම වැඩි වෙනවා.

කියන්නෙ, සංඛාර වැඩි වෙනව කියන්නෙ. ඝන සංඥා කියන්නේ ඒකයි. ඝණ සංඥා සුකුම වෙනව කියන්නෙ ඝන ව අල්ලගෙන හිටපු ඒවා අතහැරිල යනවා ටික ටික. "සබ්බූපදි පටිනිස්සග්ග" කිව්වෙ එතෙන්ට. අන්න එතන තමයි නිවන් මග. රාග, ද්වේශ, මෝහ තුනී වෙනවා කිව්වේත් එතකොටමයි.

**උපාසිකාවඃ** එහෙමයි.

**ආර්යන් වහන්සේඃ** අපි දැන් චිත්තානුපස්සනාවේදී ආයතන විඤ්ඤාණ වෙනයි කියල දකින්න ඕනි. මනෝ විඤ්ඤාණය කියන්නෙ මොළේ ඇතුලෙ තියෙන එකක් නොවෙයි. ජේන කොටම ඒක දැනගන්නෙ මනෝ විඤ්ඤාණයෙන්. ඒක තමයි චිත්තානුපස්සනාවේදී අපට හඳුනාගන්න තියෙන වැදගත්ම දේ. මේ මැවෙන එක කොහෙවත් තියෙන එකක් නොවෙයි. මේ මොහොතෙම මැවෙන ලෝකෙක අපි ඉන්නවා. ඒකයි අපි විඤ්ඤාණ මායාව කිව්වේ. ඒක අනිදස්සන වෙනවා ඇත්ත දකිනකොට. දැන් පතිත වෙනවා. "පටිත්තිත විඤ්ඤාණය" අර එළියෙ තියෙන්නෙ පොත. ඒක තමයි මට ජේන්නෙ. මේක දැක්කම මොකද වෙන්නෙ, ආ... ඒක සිතුවිල්ලක්. ඒක එළියෙ තියෙන එකක් නෙවෙයි මේ සිතයි කියල හිතනවා. අන්න, එතකොට අනිදස්සනයි කියල කියනවා. එළියෙ පතිත වෙන් නෑ. "අප්පටිත්තිත විඤ්ඤාණය" කියනවා. ඕක වෙන්නෙ මනෝ විඤ්ඤාණයටයි. මනෝ විඤ්ඤාණය තමයි කියන්නේ, කකුල වැදෙනවා, බඩේ අමාරුයි, ඔළුව අමාරුයි ඔක්කොම කියන්නෙ මනෝ විඤ්ඤාණයෙන්. අර කණ්ණාඩියේ ඉන්න පින්තූරේ මම ය කියන්නෙත් මනෝ විඤ්ඤාණයෙන් තමයි. මනෝ විඤ්ඤාණය කියන්නෙ කොහොමවත් තියෙන එකක් නෙවෙයි. ආයතන විඤ්ඤාණයේ ම "ස්පාක්" එකේ නැවත "ස්පාක්" එකක් සිද්ධ වෙනවා. "වටටම් වට්ටති" කියපු එක අපි මේ භාවිතා කරන්නේ සම්මුතියෙ වචන. මේ වචන නම් වැරදි. ඒ කියනනෙ මෙතන මැවෙන එකක් තියෙන්නෙ. දැන් අඹ ගහ කියන්නේ මැවෙන එකක්. අඹ ගහ කියන්නෙ ශබ්දයක්. ඇත්තටම එතන තියෙන්නෙ ප්‍රතිකම්පනයක්. "වයිබ්‍රේෂන්" එකක්. මේක වේගයක් තුළ මැවෙන්නේ. මේ ඕජා රූපය දිගටම ජේන්නෙ. මේ පෘථිවිය කැරකෙනවනෙ පැයට කිලෝමීටර් 187 ක වේගයෙන්. පෘථිවිය වේගෙට සකස් වෙනවා වගේමයි, පෘථිවිය ඇතුළෙ මේ සත්ව ස්වභාවවල විඤ්ඤාණ ස්වභාවත් වේගෙටමයි සකස් වෙන්නෙ. මම ඉන්නව වගේ මට දැනෙන ඒ චිත්ත ශක්තිය, විශ්ව ශක්තියයි පෘථිවි ශක්තියයි අතර හැදුන තවත් ශක්ති ස්භාවයක් විතරයි. ඒක හැදෙන හැටි තමයි අපි ගොඩක්



පැහැදිළි කරන්නෙ. මේවා ටිකක් ගැඹුරුයි. බොහොම නිරවුල්ව මෙනෙහි කරන්න ඕනි. සිත හැදෙන හැටි නිරවුල් වුණොත් ඒ කෙනා විචිකිච්චාව නැතිව සැකයක් නැතිව සෝතාපන්න පැත්තට එනවා. එතකං අවිද්‍යාව තියෙනවනෙ. "අවිද්‍යා අසේස විරාග නිරෝධෝ" කියන්නේ සම්පූර්ණයෙන් ම නිවන කියන්නේ අවබෝධඥාණයක්. අවබෝධ කරගන්න ධර්මයක්. මේක භාවනා කරල කවදාවත් ලබන්න බෑ. ඔය නිගන්ඨ භාවනා වැඩක් වෙන් නෑ. සමථය කොච්චර වඩල පාවි පාවි හිටියත් වැඩක් නෑ. අරූප ධ්‍යාන වල ඉඳලත් වැඩක් නෑ. එතන ආත්මය නැතිවන ක්‍රමයක්  නෑ. ඕක බාවාරි, පොට්ටපාද සූත්‍රවල ඒ ඒ බ්‍රාහ්මණයන්ට බුදුන් වහන්සේ කියනවා බ්‍රාහ්මණයෙනි, ඔබ ඉන්න දෘෂ්ඨියෙන් මිදුන දවසටයි මෙය වැටහෙන්නෙ එතකං වැටහෙන් නෑ කියනවා. ආත්මයේ ඉන්නවා කියල දෘෂ්ඨිය තියෙන කම්ම නැවත ආත්මයක් තියෙනව ඒ අයට. ඒ අය දුකෙන් මිදෙන් නෑ. මේ දෘෂ්ඨිය තමයි ශක්තිය. දෘෂ්ඨියේ ඉන්නකං කළලෙක සකස් වෙනවා. ඒ කියන්නෙ දැන් සිරස අල්ලනවනෙ මෙතන. යාපනේ සිරස අල්ලනවනෙ. ඇමරිකාවෙත් සිරස අල්ලනවනේ. දැන් බලන්න, මෙතන ඒරියල් එකෙන්නෙ අල්ලන්නෙ. මේ තියෙන සිරස නෙවෙයි, යාපනේ, ඇමරිකාවෙ තියෙන්නෙ. එතන තියෙන අංශුනෙ එතන සකස් වෙලා සිරස අහුවෙන්නෙ. මෙතන තියෙන ටී වී  පෙට්ටිය එතෙන්ට ගෙනියන් නෑ. දැන් මෙතන කතා කරන එක ඔතෙන්ට තරංගයකින්නෙ එන්නෙ. මේකෙ කොහෙවත් වයර් එකක් නෑනෙ. එහෙනම් ඔය අවකාශෙ හැම තැනම මේක තියෙනවනේ. එහෙනම් සිරසත් හැම තැනම තියෙනවනෙ.

**උපාසිකාවඃ** එහෙමයි, ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සේඃ** මේ අංශු සකස් වෙනවා කියපු එක කොහෙවත් යනව නෙවෙයි. අහසෙ විදුලි කොටන කොට මෙහෙ ජනෙල් හෙල්ලෙන්නෙ සංඛ්‍යාත සමාන නිසානෙ. අපේ කර්ණ සංඛ පටලය හෙල්ලෙන්නෙ සංඛ්‍යාත සමාන නිසානේ. කර්ණ සංඛ පටලය හෙල්ලෙන සංඛ්‍යාතයට අපේ උගුරේ ජිව්හා ඉන්ද්‍රියේ ප්‍රතිකම්පනනෙ අපි මේ "විසිල්" එක වදිනවා වගේ කතා කරනවා කියන්නේ. අර සිංදුවක් ඇහෙනකොට ඒ සිංදුවම අපි මුමුනන්නෙ. අන්න ඒ වගේ අපි කතා කරන එකෙත් ස්වභාදහමක් තියෙන්නෙ. ආත්ම කතාවක් කොහෙවත් නෑ. මේ මනෝ විඤ්ඤාණය කියන සංඥා ස්වභාවය අර සිරස වගේ. බාහිර තියෙනවා කියල තියෙන දෘෂ්ටිය තුළ ශත්කියක් උපදිනවා. ඒ කියන්නෙ පවතින එකක් නොවෙයි. ඇතිවන නැතිවන වේගය

තුළයි ශක්තිය කියන එක තියෙන්නෙ. ශක්තිය ගැන හොඳ අවබෝධයක් තියෙන කොට මේක තේරෙනවා. ස්පාක් වෙන එකටයි ශක්තිය කියන්නෙ. බැටරියේ තියෙනවනෙ ධන ඍණ කියල අන්ත දෙකක්. ඔය දෙක වයර් දෙකකින් දෙපැත්තට ගෙනල්ල ස්පාක් කරලා ලයිට් එකක් පත්තු කරන්න පුළුවන්. ඔය ධන ඍණ දෙක එකට ස්පාක් උනොත් ෂෝට් වෙනවනෙ. ඕකනෙ ශක්තිය කියන්නෙ.

**උපාසිකාව :** එහෙමයි, ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සේ:** මේ පෘථිවිය කැරකෙනවනේ 187 km h වේගෙන්. ඒක තුළ ධ්‍රැව දෙකක් හැදිල තියෙනවනෙ. ඒක තුළනෙ මේ චුම්භක ශක්තිය තියෙන්නෙ. ඒක තුළනෙ මේ අභ්‍යවකාශයෙන් වෙන් වෙලා මේ වායු ස්තරය ඕසෝන් ස්ත්රය විදිහට හැදිල තියෙන්නෙ. අපි ගලක් උඩ දැම්මොත් බිම වැටෙන්නේ මේ ස්ත්රය ඇතුලෙ විතරයි. මේ ශක්තිය මෙතනම "ජෙනරේට්" වෙනවනෙ එම හැම මොහොතෙම. දැන් ඒ විදිහටම තමයි අපි මේ බාහිර දෙයක් තියෙනවා කියලා හිතන එක ඇතුලෙ පෘථිවියේ වගේම ශක්තිය "ජෙනරේට්" වෙනවා. ඒ කියන්නෙ විඤ්ඤාණ ශක්තිය එළියෙ ඇත්තටම දෙයක් නෑනෙ. නැති දෙයක්නෙ අපි තියනවා කියලා හිතන්නෙ. අන්න ඒකයි ධන ඍණ අන්ත දෙක. "අජ්ජත්ත - බහිද්දා" කියල පෙන්නුවේ ඔය ධන ඍණ අන්ත දෙක. එළියෙ තියෙනවා කියල හිතන එකයි නැවත උපදින්න හේතුව. ඔබ තුමිය මේ ඉර තියෙනවා, මේ හඳ තියෙනවා, දරුවො ඉන්නවා, ගෙවල් තියෙනවා, මිනිස්සු ඉන්නවා, සත්තු ඉන්නවා කියල හිතන තාක් කල් ඔබ තුමිය ඉපදෙනනවා. ඒක තමයි මිත්‍යා දෘෂ්ඨිය. ඒකයි බුදුන් වහන්සේ කියන්නේ මරුන් බඹුන්, මිනිසුන්, දෙවියන් සහිත ලෝකෙට මෙය අවබෝධ නොකරන තාක් සම්බෝධියට පත් වන්නෙ නෑ. මහණෙනි, කියලා. සේරම ඉන්නවා කියලා කවුරු හරි හිතනව නම් එයා ආය උපදිනවා. ඔතනයි තියෙන්නෙ ලෝකෝත්තර භූමියයි පෘතග්ජන භූමියයි වෙන් වෙන තැන. බාහිර තියෙනවා කියලා හිතන එක, දැන් අර ඔබ තුමිය කිව්වනෙ බාහිර නෑ කියලා. ඒකයි අපි කිව්වෙ ඔබ තුමිය සුගති පරායන වෙනවා කියල. හැබැයි බාහිර තියෙනව කියල හිතුවොත් රාග,ද්වේශ,මෝහ සිත් හට ගන්නවා. බාහිර දෙයක් තියෙන තාක් කල් ඇලෙනවා. ගැටෙනවා. ඒකයි රාග, ද්වේශ, මෝහ කියන්නෙ. බාහිර එක්කො දරුවො ඉන්නවා. මම ඉන්නවා, එක්කො දෙයක් තියෙනවා, රත්තරං තියෙනවා, සල්ලි තියෙනවා



කියල හිතන කම්ම ඇලෙනවා, ගැටෙනවා, විපාක තියෙනවා, භවයක් තියෙනවා, සසරක් තියෙනවා.

**උපාසිකාව :** එහෙමයි ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සෘ:** හැබැයි එහෙම දෙයක් නැති බව දැක්කොත් "භව නිරෝධෝ - නිබ්බානෝ". මේ මොහොතෙම දෙයක් තියෙනවා කියලා ගත්තොත් අන්න භවයක් තියෙනවා. දෙයක් නැති බව දැක්කොත් භව නිරෝධයක් දකිනවා. දෙයක් තියෙනවා කිව්වොත් සමුදය සත්‍යය එතන දුක තියෙනවා. දුක්ඛ සත්‍යය, දෙයක් නැති බව දැක්කොත් නිරෝධ සත්‍යය. ඒ දැකීමයි මාර්ග සත්‍යය. අන්න, චතුරාර්ය සත්‍ය අවබෝධ කරන මහා රහත් උතුමන්ලා බවට පත්වෙනවා.

**උපාසිකාව:** සාධු......සාධු, ආර්යන් වහන්ස. මේක නම් පුදුම ධර්මයක් ආර්යන් වහන්ස. මම භාවනා කරනකොට ආර්යන් වහන්ස, මට හිතුනා මෙතන මොකක් හරි වැරැද්දක් තියෙනවා කියලා. මොකක් හරි වැරැද්දක් තමා මේ වෙන්නෙ කියලා.

**ආර්යන් වහන්සේ:** ඇත්තටම අපිත් භාවනා කරන්න යොමු වෙලා හිටිය අය. අවුරුදු 30 ක් අපි භාවනා කරා කියල කියන්න පුළුවන්. දීර්ඝ කාලයක් භාවනා කරල අරූප ධ්‍යාන වල හිරවෙලා හිටපු අය අපේ මුල් දේශනා වල අපි මේවා හෙළි කරනවා. අත පය කෙලින් කර ගන්න බැරුව අසරණ වෙලා ඒ අරූප ධ්‍යානවලින් එළියට එන්න බැරිවයි හිටියෙ. අපිට ඒවයින් ගැලවෙන්න බැරුව හිටිය. ඊට පස්සෙ තමයි අපි තේරුම් ගත්තෙ මේ බුද්ධ ධර්මය නෙවෙයි කියල. අපි ඒකට හිරවුණ නිසයි අනිත් අයට පිහිට වෙන්නෙ. නැත්නම් ඒක කියන්න අපිට අවශ්‍යතාවයක් නෑ. ඔබ පිම්බීම්, හැකිලීම, ෂැයාඩෝ කියන භාවනා ක්‍රම බුරුමයෙන් ගෙනාවා. ඒ සමථය වඩන නිගණ්ඨ භාවනා. දැන් භාවනා පන්ති විදිහට ව්‍යාප්ත වෙලා හැම තැනව කරන්නෙ බුරුමයේ භාවනා. ඇත්තටම බුරුමයේ නිවන් මග නෑ. මොක ද ත්‍රිපිටකය තියෙන්නෙ ලංකාවෙ. ලංකාවේ මේ සූත්‍රවල තමයි පිරිසිදු ශ්‍රී සද්ධර්මය තියෙන්නෙ. ඒ අයට ඒක හම්බවෙලා නෑ. ඒ ගොල්ලෙ කරන්නේ අර නිගණ්ඨයෝ කරපු දේමයි. ඒක දැන් ලංකාවේ ප්‍රචලිත වුණා. ලංකාවේ හැම තැනම කරන්නෙ වේදයේ තියෙන භාවනා. මුළු ඉන්දියාවේම බුද්ධාගම සම්පූර්ණයෙන් ම නැති වුනා. ජේ.ජේ. සංකර් කිව්වා, බුදුන් කියන්නේ විශ්ව ශක්තියට එකතු වීමයි. ඊට වැඩිය හොඳට ඒක සමථය

වඩලා ලේසියෙන් කරන්න පුළුවන් කියලා. අද ලංකාවෙ අය හිතන් ඉන්නවා ජේ.ජේ. සංකර් කියපු ඒක ඇත්ත කියලා. හිතාගෙන ඉන්නවා සමථය වඩලා නිවන් දකින්න පුළුවන් කියලා. ඒක කවදාවත් වෙන් නෑ. ඉන්දියාවේ බුද්ධාගම නැති වුණා වගේ ලංකාවෙත් වෙයි කියල ජේ.ජේ. සංකර් අනුමාන කරනවා. අද ලංකාවෙත් බුද්ධාගම නැති වෙමින් යනවා. මොකද අර නිගන්ඨ භාවනා ලංකාව ගිලගෙන තියෙනවා. කමටහන් විදිහට අපිට උපදෙස් දුන්නෙ අසංඥ තලයේ පාවෙන කොට කොයි වෙලාවෙ හරි ආත්ම සංඥාව නැති වෙනනකම් බලන් ඉන්න කියලා. ඇත්තටම ඒක වෙන්නෙ නෑ. අපි තවත් ගුරුවරු හොයාගෙන ගියා. හැම ගුරුවරයාම කිවුවේ කවදාහරි ආත්ම සංඥාව නැති වන තුරු බලන් ඉන්න කියලයි. අපි අන්තිමට ඒක අත් හැරියා. බුදුන් වහන්සේ දේශනා කලේ ඇත්තටම මොනවද කියල හොයාගෙන යනකොට අපිට තේරුණා මේ “පටිච්චසමුප්පාදය” මෙනෙහි කරන්න ඕනි කියලා. පටිච්චසමුප්පාදය අවබෝධය තුළින් විතරයි ආත්ම සංඥාව නැති වෙන්නෙ කියලා. ගොඩක් අයට සමාධි නෑ. සමාධි නැති නිසා ගොඩක් අය උත්සාහ කර කර ඉන්නෙ අවුරුදු 100 ගියත් ඒ අයට බෑ අපි කියන දේ අවබෝධ කරන්න.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යන් වහන්සේ:** මේක කෙනෙකුට අහන්න ලැබෙන එකෙන් ලොකු යහපතක් සිද්ධ වෙනවා. එහෙම නැත්නම් ගොඩක් අය අසරණ වෙනවා. අවුරුදු 50 - 60 වෙනකොට ඒ අයට කරගන්න දෙයක් නැති වෙනවා. ඒ ගොල්ලෙ සමථයට ගොඩක් ඇබ්බැහි වෙලා ඉන්නේ. මේ ධර්මය අවබෝධ කරගන්න ශක්තියක් නෑ. අන්න ගොඩක් අය සමාධියේ ම ඉඳල මැරිල යනවා. ඒ අය ඇත්තටම දුගති පරායනයි. නිගන්ඨ භාවනා කියන්නේ මිථ්‍යා දෘෂ්ඨියක්.

**උපාසිකාව :** ඇත්තටම භාවනා කරන එකේ, සමාධියේ ඉන්න එකේ තේරුමක් නෑ නේද ආර්යන් වහන්ස?

**ආර්යන් වහන්සේ:** ඒක නිවන් මග නෙවෙයි. බුදුන් වහන්සේ දේශනා කරපු එක නෙවෙයි, බුදුන් වහන්සේට වැරදුන දේ ඔය කරන්නෙ. මේ පටිච්චසමුප්පාද ධර්මය අවබෝධය තුළින් විතරයි සෝතාපන්න වෙන්නෙ. ධම්ම සංඝිකරණයේ පිටු 420, 325, 200 ගණනන් වගේ පිටු විශාල ප්‍රමාණයක් තියෙනවා. “දස්සනා පහාතබ්බා” කියලා “දිට්ඨිංච අනුපගම්ම



සීලවා - දස්සනේන සම්පන්නෝ”. ඒ සම්මා දිට්ඨිය කියන්නෙ බාහිර දෙයක් නැති බව. සිතෙත් දෙයක් නැති බව, සිත කියල දෙයක් නැති බව, අන්න ඒ අනිමිත්ත ශූන්‍යත ස්වභාවය දකින එකයි සම්මා දිට්ඨිය. එහෙම වුණොත් විතරයි අර ආර්ය වරු දැක්ක සම්මා දිට්ඨිය. ඒ තාක් කාටවත් ආර්ය අෂ්ඨාංගික මාර්ගයක් හම්බවෙන්නෙ නෑ. ආර්ය අෂ්ඨාංගික මාර්ගය දැක්කොත් එතන කෙලෙස් හටගන්නේ නෑ. ආසවක්ඛ්‍යා ඥාණය හට ගන්නවා. ආස්‍රව කෙලෙස් ක්ෂය වෙන්නේ බාහිරත් දෙයක් නැති බව, සිතෙත් දෙයක් නැති බව දැක්කොත් විතරයි. බාහිර දෙයක් තියෙන්න ඕනි කෙලස් හටගන්න. රාග, ද්වේශ, මෝහ සිත් හටගන්න. බාහිර දෙයක් නැති බව දකින කොට ඔබ තුමිය මේ මොහොතෙම සුගති පරායනය කිව්වෙ ඒකයි. කෙලෙස් ක්ෂය වී ගෙන යනවා. ඔබ තුමියට දැනෙන්න ගන්නවා. ඔබ තුමියට ක්ෂිණාස්‍රව රහත් මාවත හම්බවෙලා තියෙනවා. මේක පාරිශුද්ධයි. මේ ධර්මය අති නිර්මලයි. ඒකයි කිවුවේ, මේ සත්‍යය දැක්කොත්, මේ සම්මා දිට්ඨිය දැක්කොත්, ඒ දර්ශණය දැක්කොත්, දෙයක් නැති බව දැක්කොත් අන්න “දිට්ඨිංච අනුපගම්ම සීලවා දස්සනේන සම්පන්නෝ කාමේසු විනෙය්‍යය ගේදං” එයාට බාහිර පිනවන ස්වභාවයෙන් මිදිලා “නහිජාතු ගබ්බ සෙය්‍යං පුනරේතීති.” බාහිර ඇත්තක් නෙවෙයි කියල දකින කෙනා නැවත කලලයක සකස් වෙන් නෑ. අපි මේ සූත්‍ර කවි වාගේ කිව්වට මේ ධර්මයයි තියෙන්නෙ. මේක අවබෝධක්ඥාණයෙන් පැහැදිලි කරනවා මිසක් කිසිකෙනෙකුට පොත් බලල නම් කියන්න බෑ. දෙයක් නැති බව දකින එකයි “බුද්ධං සරණං ගච්ඡාමි“ බුද්ධ කියන්නෙ දෙයක් නැති බව දකින එකයි. සිතුවිලි වල ඉන්න තාක් කල් අපිට බුද්ධ හමුවෙන් නෑ. බාහිර දෙයක් තියෙන නිසයි සිතුවිල්ලක් තියෙන්නෙ. නාම රූපමයි සිතුවිලි කියන්නෙ. බාහිර දෙයක් තියෙනව කියල ගන්න එකයි සිතුවිල්ලක් කියන්නෙ. බාහිර ඇත්ත කියල දකින තාක් කල් අපිට එන්නෙ දුකමයි. අපි කවදහරි මේ දුකින් මිදෙන්නේ,“නත්ථි මේ සරණං අඤ්ඤං - බුද්ධෝ මේ සරණං වරං” කිව්වේ සිතුවිලි ඇත්තක් නෙවෙයි කියල දැක්කොත් විතරයි. “නත්ථි මේ සරණං අඤ්ඤං - ධම්මෝමේ සරණං වරං” කිව්වේ ඒ ධර්මතාවය දකිනවා. ධම්ම කියන්නෙ දෙයක් නැති බවයි. “ඉධප්පච්චතාව. ඉමස්මිං සති ඉදං හෝති - ඉමස්මිං අස්සති ඉදංනහෝති ඉමස්ස උප්පප්ජා ඉදං උප්පජ්ජති - ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ජති” මේ කියන්නෙ දෙයක් නැති බවයි. දෙයක් කියල දෙයක් නෑ. අපි හිතන දෙයක් කොහෙවත් නෑ. ඒකයි ඉදප්පච්චතාව. ධම්ම කියන්නෙ දෙයක් නැති බවයි. ඒක දකිනවනම් අන්න, “යෝ ධම්මං

පස්සති - සෝ මං පස්සති" බුදුන් දකිනවා. "නත්ථිමේ සරණං අඤ්ඤං - ධම්මෝ මේ සරණං වරං" කිව්වේ මේ ධර්මතාවය දැක්කොත් විතරයි. මේ අසරණ කමින්, දුකින් මිදෙන්නෙ. එන එන සිත, ඒ අරමුණ දකින එකටයි සංඝ කියන්නෙ. "නත්ථිමේ සරණං අඤ්ඤං - සංඝෝ මේ සරණං වරං" කියන්නෙ, අන්න ධම්මං සරණං ගච්ඡාමි, සංඝං සරණං ගච්ඡාමි තෙරුවන් සරණ යන්නෙ සිතට එන අරමුණෙ සත්‍යය දකින කෙනයි. සෝතාපන්න ආර්යන් වහන්සේ නමක් පමණයි තෙරුවන් සරණ යන්නෙ කිව්වෙ අන්න ඒකයි. අපි කිසිම අවබෝධයක් නැතුව, බුද්ධං සරණං ගච්ඡාමි, ධම්මං සරණං ගච්ඡාමි, සංඝං සරණං ගච්ඡාමි කියනවා ගිරව් වගේ. මැටි රූපෙ බුදුන් කියල හිතනවා, පොත හිතනවා ධම්ම කියල, සංඝයාට හිතනවා සංඝ කියලා. මේක පුදුමාකාර රැවටීමක්. කිසිම කෙනෙකුට තෙරුවන් සරණ හිමිවෙල නෑ. හැමෝම හොරකම් කරනවා මරාගන්නවා. මේ ධර්මය අවබෝධ කරොත් හොරකම් කරන්නවත් බාහිරින් දෙයක් හම්බවෙන් නෑ. සේරම තමන්ගෙ සිතමයි. ඇත්තටම ඊර්ෂියා කරන්නවත්, වෛර කරන්නවත් බාහිරින් කෙනෙක් හම්බවෙන් නෑ. තමන්ගෙම සිතමයි. මේ ධර්මද්වීපය අන්න එදාටයි බැබළෙන්නෙ. මේ සත්‍ය හෙළිවන දවසට මේ ධර්මද්වීපය නැවතත් ඉන්දියන් සාගරේ මුතු ඇටයක් වෙයි. එහෙම නැතිවුණොත් මේ පිරිහීම නම් නවතින්නෙ නෑ. ඔබ තුමියට වැටහුණා ද?

**උපාසිකාව :** වැටහුණා ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සේ:** දැන් ඔබතුමිය දන්නවා තෙරුවන් සරණ යන හැටි. ශ්‍රද්ධාව කියන්නේ සත්‍යය දැකල සිතේ, රාග, ද්වේශ, මෝහ තුනී වන හැටි දකින එකයි. එහෙනම් බුද්ධ වන්දනාව කියන්නේ තමන්ගේම සිතේ කෙලෙස් අඩුවෙන එක දැකල වන්දනා කරන එකයි. වෙනද විදිහට බුදුන්ට පහනක් පත්තු කරල අපි ඒ සම්මා සම්බුදු රජාණන් වහන්සේ සිහිකරල, නමුත් මෙතේ බුදුන් දැක නිවන් දකින අය විදිහට වන්දනා කරන්න ඕනි. ඒ කියන්නෙ අපේ ධම්ම චක්‍ෂුසය අවදි වෙන්න ඕනි. තමන්ගෙම සත්‍යය දකිනව නම් අන්න "අවිද්‍යා අසේස විරාග නිරෝධෝ" - අවිද්‍යාවෙන් මිදෙනවා. ආලෝකෝ උදපාදි, චක්ඛුං උදපාදි, විද්‍යා උදපාදි, ඥානං උදපාදි, ප්‍රඥා උදපාදි. මේක ප්‍රඥා ඇසට අසුවෙන්නෙ. මේක ඥාණෙට අසුවෙන්නෙ මේ තමයි ධම්මචක්‍ෂුසය. මෙතේ බුදුන් දකිනවා කියන්නෙ, තමන්ගෙම සිතුවිලි වලින් මිදුණ බුද්ධ ස්වභාවය දකිමින් වන්දනා කිරීමයි. තමන්ගේ සිත දවස ගානෙ දියුණු වෙනවා, දවස ගානෙ බුද්ධ ස්වභාවය මතුවෙනව දැකල වන්දනා



කරන්න. අන්න එතකොට බුදුන් වැන්ද වෙනවා. අන්න "ධම්මං සරණං ගච්ඡාමි". ධර්මයට ටිකෙන් ටික ලංවෙනවා. "සංඝං සරණං ගච්ඡාමි" හැම මොහොතෙම සිතේ සත්‍ය දකිනවා. මේ මාර්ගයේ යන සැබෑම බෞද්ධයයි, බාහිර දෙයක් තියෙනවා කියල ගත්තොත් එතන බෞද්ධයෙක් නෑ. බාහිර දෙයක් නැති බව දැක්කොත් අන්න භව නිරෝධයක් දකිනවා. අන්න එයා තමයි බෞද්ධයෙක් කියන්නෙ. සැබෑම බෞද්ධයෙක් වෙන්න ඔබතුමිය දැන් දන්නවා.

**උපාසිකාව:** සාධු...සාධු ආර්යන් වහන්ස.

**ආර්යන් වහන්සේ:** තෙරුවන් සරණයි.

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය මුද්‍රණය කරන එම ධර්ම ග්‍රන්ථ සඳහා ඔබටත් දායක විය හැක.

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය

ගිණුම් අංක : 106161005988

බැංකුව : සම්පත් බැංකුව

ශාඛාව : බත්තරමුල්ල

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය මගින් මෙතෙක් මුද්‍රණය කර ඇති ග්‍රන්ථ පහත සඳහන් වේ.

1. සතිය කියන්නේ අපේ ගෙදර
2. මට මම නැතිවන හැටි
3. මොහොතට අවධිය (පළමු කොටස)
4. බුද්ධ දර්ශනය
5. නිවැරදි නිවන් මඟ හමුවිය
6. මොහොතට අවධිය (දෙවන කොටස)